සේවක අර්ථසාධක අරමුදල
ஊழியர் சேமலாப நிதியம்
Employees' Provident Fund

# 2018

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

**ISSN : ISSN 2783 - 8749**

ප්‍රකාශනය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01

මුද්‍රණය: සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම

# අන්තර්ගතය
# உள்ளே
# CONTENTS


1 - 132
සිංහල

133 - 256
தமிழ்

257 - 382
English

383 - 393
සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය
புள்ளிவிவர இணைப்பு
Statistical Appendix

# සේවක අර්ථසාධක අරමුදල

60
1958-2018
වසරක
විශිෂ්ටත්වය

සමෘද්ධිමත් විශ්‍රාම දිවියක් සාමාජිකයන් වෙත ලබා දීමට හැකි වන අයුරින් කලාපයේ වඩාත් විශ්වාසදායී විශ්‍රාම අරමුදල බවට පත් වීම දැක්ම කොටගත් සේවක අර්ථසාධක අරමුදල 1958 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

වර්ෂ 2018 දී, සේවක අර්ථසාධක අරමුදල එහි අභිමානවත් 60 වන සංවත්සරය සමරන ලද්දේ නව්‍ය හා විචක්ෂණශීලී කළමනාකරණය තුළින් ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා කාර්යක්ෂම සේවාවක් සාමාජිකයන් වෙත ලබා දීමේ එහි මෙහෙවර වෙත තව තවත් කැපවෙමිණි.

60 වසරක විශිෂ්ටත්වය තුළින්, සිය සාමාජිකයන්ට සෞභාග්‍යමත් විශ්‍රාම දිවියක් ළඟා කරලනු වස් අනභිබවනීය මෙහෙවරක් ඉටු කිරීමට සේවක අර්ථසාධක අරමුදල විසින් ඉදිරියේ දී ද කැපවනු ඇත.

සිංහල

## සේවක අර්ථසාධක අරමුදල

# වාර්ෂික වාර්තාව 2018

සිංහල

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන රුපියල් ට්‍රිලියන 2.2 ක් ඉක්මවූ වත්කමක් පාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල විසින්, එහි වත්කම් පදනමෙහි අඛණ්ඩ වර්ධනය 2018 වසරේ දී ද තවදුරටත් පවත්වා ගන්නා ලදී. එසේම, අරමුදල විසින් සිය සාමාජිකයන් වෙත සපයන සේවාවන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ සාමාජිකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීමට මෙන්ම අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට සමත් විය. ඒ අනුව, අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකම 2017 වසර අග වාර්තා වූ රුපියල් බිලියන 2,066 ට සාපේක්ෂව 2018 වසර අගදී රුපියල් බිලියන 2,289 ක් දක්වා සියයට 10.8 කින් වර්ධනය විය. වර්ෂය තුළ දී, සේවක අර්ථසාධක අරමුදල එහි සුරක්ෂිතභාවය සහ වර්ධනය පවත්වා ගනිමින් එහි සාමාජිකයන්ට ඵලදායී සේවාවන් රැසක් සමඟ ඉහළම විශ්‍රාම ප්‍රතිලාභ සපයන ලදී.

සේවක අර්ථසාධක අරමුදල විසින් සිය අරමුදල් කළමනාකරණ කාර්යයන් සාර්ථක ලෙස මෙහෙයවමින් රුපියල් බිලියන 222 ක ආදායමක් උපයා ගැනීමට 2018 වසරේ දී සමත් විය. ඒ අනුව, අරමුදලේ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 2,298 ක් දක්වා ළඟා විය. එසේම, වෙළෙඳපොළ පොලී අනුපාතවල පැවති ඉහළ උච්චාවචනයන් යටතේ වුව ද සේවක අර්ථසාධක අරමුදලට සිය සාමාජිකයන් හට සියයට 9.5 ක ආකර්ෂණීය ප්‍රතිලාභ අනුපාතයක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව
CENTRAL BANK OF SRI LANKA

සිංහල

# පටුන

## කොටස අ


**ආයතනික භාරකාරත්වය**

මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය 1
කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය 3
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 5
නියාමන රාමුව 7
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ කාර්යභාරය 8
කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය 9


## කොටස ආ


**ආයතනික විශ්ලේෂණය**

දැක්ම හා මෙහෙවර 13
60 වසරක විශිෂ්ටත්වය - ගමන්මගෙහි මංසළකුණු 14
මූල්‍ය තොරතුරු - 2018 17
මෙහෙයුම් තොරතුරු - 2018 21
ආර්ථික සමාලෝචනය - 2018 23
සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය - 2018 29


## කොටස ඇ


**මූල්‍ය ප්‍රකාශ**

ආදායම් හා වියදම් ප්‍රකාශනය 43
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 44
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 45
ලැබීම් හා ගෙවීම් ගිණුම 46
ආයෝජන ප්‍රකාශනය 47
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 48
හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයින්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය 49

**මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්**

1. සංස්ථාපිත තොරතුරු 50
2. ගිණුම්කරණ පදනම 50
3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 52
4. සංසන්දනාත්මක තොරතුරු 64

5. පොලී ආදායම 65
6. ලාභාංශ ආදායම 65
7. මූල්‍ය වත්කම් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(පාඩු) 65
8. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(පාඩු) 65
9. මූල්‍ය වත්කම් හානිකරණය 66
10. වෙනත් ආදායම් 66
11. මෙහෙයුම් වියදම් 66
12. ආදායම් බදු වියදම් 67
13. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම් මත ශුද්ධ ලාභය/(අලාභය) 67
14. දේපළ, පිරියත හා උපකරණ 68
15. අස්පෘශ්‍ය වත්කම් 71
16. ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට 71
17. ස්කන්ධ සාධන පත්‍ර - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට 72
18. ක්‍රමක්ෂය පිරිවැයට ණය සාධන පත්‍ර 75
19. මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට 83
20. විකිණීමට ඇති මූල්‍ය වත්කම් 85
21. කල්පිරීම තෙක් තබාගත් මූල්‍ය වත්කම් 90
22. ණය හා ලැබිය යුතු මුදල් 94
23. වෙනත් ජංගම වත්කම් 95
24. මුදල් හා මුදල් සමාන වත්කම් 95
25. ණය හිමියෝ 95
26. වෙනත් ජංගම වගකීම් 96
27. සාමාජික ශේෂ 96
28. සංචිත 97
29. ලැබීම් 98
30. ගෙවීම් 98
31. ආයෝජනයන්හි වෙනස්වීම් 99
32. මූල්‍ය උපකරණවල සාධාරණ අගය 101
33. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිය 103
34. වෙනස්වීම් අනාවරණය කිරීම 105
35. ලැයිස්තුගත නොවූ හිමිකම් උපකරණ අගය කිරීම 119
36. ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය 120

කොටස ඇ **විගණකාධිපති වාර්තාව** 123

කොටස ඉ

## සංඛ්‍යා සටහන් හා අතිරේක තොරතුරු


1. ආයෝජන, කල්පිරීම් හා ආයෝජන මත ප්‍රතිලාභ (1988 - 2018) 385
2. සාමාජික ශේෂ මත ප්‍රතිලාභ අනුපාතිකය (1988 - 2018) 386
3. සාමාජික ශේෂ, සාමාජික ශේෂ මත පොලී සහ සඵල පොලී අනුපාතිකය (1988 - 2018) 387
4. ආයෝජන කළඹ පිළිබඳ ප්‍රකාශනය (1988 - 2018) 388
5. සංක්ෂිප්ත මුදල් ප්‍රවාහය (මුදල් මණ්ඩලය) (1988 - 2018) 389
6. සංක්ෂිප්ත ආදායම් හා වියදම් ගිණුම් ප්‍රකාශනය (1988 - 2018) 390
7. පැහැදිලි කිරීම් 394

‘අ’ කොටස

# ආයතනික භාරකාරත්වය





සිංහල

# මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ./අරමුදල) 2018 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය මා නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි.

2018 වර්ෂය තුළ රට තුළ පැවති අභියෝගකාරී සහ අවිනිශ්චිත ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් මෙන්ම ගෝලීය ආර්ථිකයේ පැවති විචලතාවයන් මධ්‍යයේ වුවද, සතුටුදායක ප්‍රගතියක් අත්පත්කර ගැනීමට සේ.අ.අ. හට හැකි විය. එය අරමුදලේ වත්කම් වර්ධනය, ආයෝජන ප්‍රතිලාභ හා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයට අයත් එහි සාමාජිකයින්ට ලබා දුන් සියයට 5.2 ක ආකර්ශනීය මූර්ත ප්‍රතිලාභ අනුපාතිකය මගින් විද්‍යාමාන වේ. සේ.අ.අ. විසින් රුපියල් බිලියන 2,289.4 කට අධික වත්කම් සහ මිලියන 18.7 ක සාමාජික ගිණුම් කළමනාකරණය කරනු ලබන අතර, එය රටේ සමස්ත මූල්‍ය පද්ධතියෙහි වත්කම් ප්‍රමාණයෙන් සියයට 12.1 ක් නියෝජනය කරනු ලබයි. එමෙන්ම, සලකා බලනු ලබන වර්ෂය තුළදී සේ.අ.අ. විසින් පිළිවෙලින් රුපියල් බිලියන 38.5 ක හා රුපියල් බිලියන 222.4 ක ශුද්ධ සාමාජික දායක මුදල් හා ආයෝජන ආදායම් උත්පාදනය කරනු ලැබූ අතර, එය අරමුදලේ සමස්ත වත්කම් වල සියයට 10.8 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

2018 මූල්‍ය වර්ෂයේ දී, රජයේ සුරැකුම්පත් මත වූ ඵලදා අනුපාතිකය ආසන්න වශයෙන් පදනම් අංක 150 කින් පමණ පහත වැටීම හා කොටස් වෙළෙඳපොළ නියෝජනය වන හා මනිනු ලබන සියලු කොටස් මිල දර්ශකය 4.97 ක සෘණ අනුපාතිකයක් වාර්තා කිරීම සේ.අ.අ. වෙත අහිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කරවීය.

එමෙන්ම, 2018 අප්‍රේල් මස 01 දින සිට අදාළ වන පරිදි බලපවත්වන ලද ආදායම් බදු රෙගුලාසීන් හි ඇති වූ දැඩි වෙනස්කම්වලට අනුව, සේ.අ.අ. සියයට 14 ක නව ආදායම් බදු අනුපාතිකයකට යටත්

සිංහල

වූ අතර පෙර වර්ෂයේ දී එකී අනුපාතය සියයට 10 ක් විය. තවද, බදු අය කළ යුතු ආදායම ගණනය කිරීමේ දී, ආයෝජනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවනු ලබන ''රඳවා ගැනීමේ බදු'' ගැලපීමට ඉඩ නොදෙන ලදී. මෙකී සාධකයන්හි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂයේ දී බදු වියදම් ලෙස රුපියල් බිලියන 30.7 ක් සේ.අ.අ. ට දැරීමට සිදුවූ අතර, එය 2017 වසරේ දී රුපියල් බිලියන 18.9 ක් විය. මෙය, අරමුදලේ සමස්ත ආයෝජනය මත වන ප්‍රතිලාභයන් හි පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 1.46 කින් අඩුවීම කෙරෙහි බලපාන ලදී. කෙසේවෙතත්, මෙකී සියළුම අභියෝගයන් හමුවේ රුපියල් බිලියන 190.6 ක ශුද්ධ ආදායමක් ඉපයීමට සේ.අ.අ. සමත් වූ අතර, සාමාජික ගිණුම් ශේෂයන් මත සියයට 9.5 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ප්‍රකාශයට පත් කිරීමට අරමුදලට හැකි විය.

අරමුදලේ මෙහෙයුම් කටයුතු සම්බන්ධව ගත් කළ, එකී පද්ධතීන් ශක්තිමත් කිරීමට වසර තුළ ගනු ලැබූ ප්‍රධාන පියවරයන් අතර 'ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය හා ආයෝජන මාර්ගෝපදේශය' යන ආයෝජන ප්‍රතිපත්ති ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සංශෝධනය කරමින් ක්‍රියාවට නැංවීම පෙන්වා දිය හැකිය. මෙලෙස ශක්තිමත් කරන ලද අවදානම් කළමනාකරණ රාමුවට අනුව අරමුදලේ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් වඩා ව්‍යුහගත ආකාරයට අධීක්ෂණයට ලක් වන අතර, එය මහ බැංකුව තුළ පිහිටුවා ඇති මුදල් මණ්ඩලය විසින් පත් කළ අධීක්ෂණ කමිටුවලට වාර්තා කරනු ලැබේ. අරමුදලේ දෛනික ආයෝජන තීරණ ගැනීමේ අධිකාරිය දෙපාර්තමේන්තුව අභ්‍යන්තරව පිහිටවූ 'සේ.අ.අ. ආයෝජන කමිටුව' වෙත ලබා දී ඇති අතර, එකී තීරණ සේ.අ.අ. දෙපාර්තමේන්තුව සෘජුව අධීක්ෂණය කරන නියෝජ්‍ය අධිපතිවරයා විසින් සහභාගීත්වය දරන 'සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව' විසින් සමීප අධීක්ෂණයකට ලක් කරයි. තවද, ආයෝජන ගනුදෙනු හා සම්බන්ධිත අභ්‍යන්තර පාලන රාමුව සහ Bloomberg ආදී අවශ්‍ය තාක්ෂණික පහසුකම් 2018 වර්ෂය තුළ දී තවදුරටත් පුළුල්ව ස්ථාපනය කරන ලදී. මෙකී වඩාත් ශක්තිමත් හා වැඩි දියුණු කළ ආයෝජන හා අධීක්ෂණ රාමුවක් තුළ, සේ.අ.අ. විසින් රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු නැවත ආරම්භ කළ අතර වර්ෂයේ දෙවන අර්ධය තුළ දී වඩාත් සක්‍රීය ලෙස ආයෝජන කටයුතු සිදු කරන ලදී.

ඊට සමගාමීව, සාමාජිකයින් හා සෘජුවම සම්බන්ධ වන අරමුදලේ අනිකුත් මෙහෙයුම් කටයුතු හා සේවාවන්වල නව තාක්ෂණික වැඩි දියුණු කිරීම් හඳුන්වා දීම හා එකී පද්ධති හා ක්‍රියාවලියන්හි කාර්යක්ෂමතාවය අඛණ්ඩ ලෙස ඉහළ නැංවීම මගින් වර්ෂය මුළුල්ලේ සාර්ථකව ක්‍රියාවට නංවන ලදී. සාමාජිකයින්ට වඩාත් පහසු හා කාර්යක්ෂම ලෙස සේ.අ.අ. සේවාවන් සැපයීමේ අරමුණ සාක්ෂාත් කරලීම උදෙසා අපරිමිත දායකත්වයක් ලබා දුන් අනිකුත් ආයතන වන කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙහිලා සඳහන් කළ යුතුය. සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ජංගම සේවා වැඩසටහන්හි සාර්ථකත්වය සඳහා එකී ආයතනයන් විසින් ලබා දුන් දායකත්වය වෙනුවෙන් කෘතඥතාවය මෙහිලා පළ කරමි.

මේ අනුව, වර්ෂය තුළ දී මෙම ජයග්‍රහණ අත්පත් කර ගැනීම සඳහා සිය අප්‍රතිහත කැපවීම ලබා දුන් කම්කරු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. හා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලවල මෙන්ම ආයෝජන හා අධීක්ෂණ කමිටුවල සාමාජිකයින්ගේ සේවය අගය කිරීමට, මුදල් මණ්ඩලය වෙනුවෙන් මම මෙය අවස්ථාවක් කර ගනිමි. සේ.අ.අ. සාමාජිකයින් විසින් සිය ජීවිත කාලය පුරා කළ ඉපැයීම් කළමනාකරණය කිරීම පිළිබඳව අඛණ්ඩව විශ්වාසය ශ්‍රී ලංකා මහ බැංකුව කෙරෙහි තබා ගැනීම සම්බන්ධව සේ.අ.අ. හි සියළුම සාමාජිකයින් සහ ඔවුන්ගේ සේවායෝජකයින් වෙත මුදල් මණ්ඩලයේ කෘතඥතාව මෙසේ පළ කරමි.

**මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්**
අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල් මණ්ඩලයේ සභාපති




# කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව එක්ව සේවක අර්ථසාධක අරමුදල විසින් 2018 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරමින් නිකුත් කරනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ 2018 වාර්ෂික වාර්තාවට මෙම පණිවුඩය මා නිකුත් කරනුයේ හදපිරි සතුටිනි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු ශ්‍රමිකයන්ගේ ජීවන තත්වය ඉහළ නංවමින් සුවබර විශ්‍රාම දිවියක් ඇති කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකාවේ විශාලම සමාජ ආරක්ෂණ ක්‍රමය වශයෙන් තවදුරටත් අප සේවාවන් පුළුල් කිරීමට 2018 වර්ෂය තුළද හැකිවූ බවට මෙම විශ්ලේෂණාත්මක වාර්තාව තොරතුරු සපයයි. සේවාලාභීන් වෙත වඩා පහසු ප්‍රවේශ අවස්ථා ඇතිවන පරිදි ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය ප්‍රාදේශීය කාර්යාල මට්ටමට ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබීම මගින් සේවාලාභී තෘප්තිය වැඩිදියුණු කිරීමට ඉවහල් වනු ඇතැයි මම තරයේ විශ්වාස කරමි.

මෙසේ, සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යාවස්ථාපිත වගකීම් නිසි පරිදි ඉටු කරමින් සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් කටයුතු කිරීම සඳහා මහඟු දායකත්වයක් ලබා දෙන කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වෙත මාගේ කෘතඥතාව පළ කරමි.

**ඒ. විමලවීර**

කම්කරු කොමසාරිස් ජනරාල්

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම
## 2018.12.31 දිනට



### සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

**කම්කරු කොමසාරිස්**

කේ.එල්.කේ. පෙරේරා මයා

**නියෝජ්‍ය කම්කරු කොමසාරිස්**

එල්.එම්. හේවාවිතාරණ මිය (ගෙවීම්)
ආර්.එම්.ඒ. සුගන්ධිකා මිය (අයකිරීම්)
එම්.එන්.එච්. ධර්මවීර මයා (පරිගණක)

**සහකාර කම්කරු කොමසාරිස්**

කේ.ආර්. මෙත්මා රණසිංහ මිය
එල්.එච්. දිසානායක මිය
ඩී.පී.ඩී. සද්ධාසේන මිය
ඒ.එච්.එල්. පද්මිණි 'මිය
ඩබ්.එම්.සී. ප්‍රියදර්ශනී 'මිය
ඩී.එම්. හේවාවිතාන මිය
එච්. තිරාණගම මයා (30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම්)
ටී.එම්.අයි. ලක්මාලි මිය (30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම්)
එන්. නවජීවනා 'මිය
ජේ.ඒ.එම්.ඕ. විජයරත්න මිය (පාලන)
ඩබ්.පී.එම්.පී. විජයවර්ධන මයා (මධ්‍යම ලිපිගොනු)
ඩී.එම්.එස්.යූ. දසනායක මිය (මියගිය සාමාජික ප්‍රතිලාභ ගෙවීම්)
බී.ඒ.එම්.ඒ. බාලසූරිය මිය (සැපයුම් හා ප්‍රවර්ධන)

### සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

**අධිකාරි**

කේ.එන්.එන්.එම්. බණ්ඩාර මිය

**අතිරේක අධිකාරි**

ජේ.ඩී.එස්.ජේ. නානායක්කාර මයා

**වැඩබලන අතිරේක අධිකාරි**

එස්.සී. ගුණධීර 'මිය

**නියෝජ්‍ය අධිකාරි**

ජේ.එම්. අමීර් මයා
ඩබ්.එල්. එස්. ඩබ්. ජයසුන්දර මිය

**වැඩබලන නියෝජ්‍ය අධිකාරි**

එස්.එම්.එල්. සිරිවර්ධන මිය
ඩී.පී.ඒ.එන්.ඩී. පෙරේරා මිය

සිංහල

## ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී

| | |
|---|---|
| එස්.ඩී.එච්. ද එස්. ජීවකරත්න මයා | ආයතනික සේවා හා පරිපාලන අංශය |
| කේ.එම්.ජී.සී. බණ්ඩාර මිය | වාර්තා සංශෝධන අංශය |
| එල්.පී.එස්. පෙරේරා මිය | අරමුදල් කළමනාකරණ අංශය |
| කේ.යූ.බී. තෙන්නකෝන් මයා | අරමුදල් කළමනාකරණ අංශය |
| ආර්.ඒ.සී.සී. රූපසිංහ මිය | අරමුදල් කළමනාකරණ අංශය |
| වී. ප්‍රබාකරන් මිය | අරමුදල් කළමනාකරණ අංශය |
| ඩී.එල්. රෝහිණී මිය | අරමුදල් කළමනාකරණ අංශය |
| එස්. විජේසිංහ මයා | වාර්තා සංශෝධන අංශය |
| එල්.ඩී.එස්.ආර්. ගුණසේකර මිය | අරමුදල් කළමනාකරණ අංශය |
| ඩී.පී. උඩුගමකෝරාල 'විය | අරමුදල් කළමනාකරණ අංශය |
| ඩබ්.ජී.ඒ.සී. ද සිල්වා මිය | ජංගම දායක මුදල් අංශය |
| ඩී.ඩී.අයි. බ්‍රැන්ඩිගම්පල මිය | රැස්කිරීම් අංශය |
| එම්.ඩබ්.කේ.එස්. සිරිවර්ධන මිය | ආයතනික සේවා |
| එම්. දිසානායක මිය | ගිණුම් හා සැසඳීම් අංශය |
| පී.බී.එන්.ඒ. සමරනායක 'විය | නැවත ලියාපදිංචි කිරීමේ අංශය, ජංගම දායක මුදල් අංශය හා ගිණුම්ගත දායක මුදල් අංශය |
| ඩී.වයි.එස්. මහගෙදරවත්ත මිය | වාර්තා කළමනාකරණ අංශය |
| ජී.පී.ඩී. කවිරත්න මිය | ජංගම දායක මුදල් අංශය |
| ඊ.ටී.ඩබ්.ටී.ආර්.පී. උඩකුඹුර 'විය | අරමුදල් කළමනාකරණ අංශය |
| යූ. පී. ජයසිංහ මයා | අරමුදල් කළමනාකරණ අංශය |
| එල්.එස්. ගමගේ මිය | 30% ප්‍රතිලාභ ගෙවීම් අංශය හා නිවාස ණය අංශය |
| එම්.එස්. විදානගේ මයා | ආයතනික සේවා හා පරිපාලන අංශය |
| පී.ඩබ්. විමල් ශාන්ත මයා | රැස්කිරීම් අංශය/ මහජන සම්බන්ධතා, විමසීම් කවුළුව සහ ඇමතුම් මධ්‍යස්ථානය |

## සහකාර අධිකාරී

| | |
|---|---|
| එම්.වී.ඩබ්. ද සොයිසා මයා | විද්‍යුත් දායක මුදල් රැස්කිරීමේ අංශය |
| ඒ.ඒ. විමල් ගාමිණී මයා | ජංගම දායක මුදල් අංශය |
| එම්.කේ.එන්.ඩී. ධර්මදාස මයා | ප්‍රතිලාභ පාලන අංශය |
| පී.කේ.ඩී.පී.එස්. දසනායක මිය | වාර්තා කළමනාකරණ අංශය |
| ජී.ජී.එන්.එම්. පෙරේරා මිය | ප්‍රතිලාභ ගෙවීම් අංශය |
| ඩබ්.ඒ.ඩබ්.එන්. වන්නිආරච්චි මයා | අරමුදල් කළමනාකරණ අංශය |
| පී. ප්‍රේමසිරි මයා | ප්‍රතිලාභ ගෙවීම් අංශය |
| ඩබ්.ඒ.එන්.ඩී. ඩයස් මිය | ගිණුම් හා සැසඳීම් අංශය |
| ඒ.කේ. චතුරංග මයා | ගිණුම් හා සැසඳීම් අංශය |
| පී.වී.එම්. සිරිවර්ධන මිය | ප්‍රතිලාභ පාලන අංශය |
| එම්.පී.එස්. කල්‍යාණ මයා | ගිණුම් හා සැසඳීම් අංශය |

# නියාමන රාමුව

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ./අරමුදල) යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. විශ්‍රාම ප්‍රතිලාභ නොලබන පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවා නියුක්තයන් වෙත අනිවාර්යය දායක මුදල් ගෙවීමක් සහිත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලෙස 1958 අංක 15 දරන සේ.අ.අ. පනත (පනත) යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධාන වලට අනුව, අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස්තුමා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, කාර්යයන් හා වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. පනත අනුව මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගිනි.

අරමුදලට ලැබිය යුතු අනිවාර්ය අවම මාසික දායක මුදල් ප්‍රමාණය සේවානියුක්තිකයෙකුගේ දළ ඉපැයීම් වලින් සියයට 20 කි. සාමාජිකයාගේ දළ මාසික ඉපැයීම් වලින් සියයට 12 ක අවම ප්‍රතිශතයකට සමාන මුදලක් සේවායෝජකයා විසින් ද, සියයට 08 ක ප්‍රමාණයක් සේවකයා (සාමාජිකයා) විසින් ද දායකත්වය ලෙස දැරිය යුතු වේ. තම සේවානියුක්තිකයන් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් සහ අදාළ තොරතුරු නියමිත කාලසීමාව තුළ සේ.අ.අ. වෙත එවීමට සේවායෝජකයා බැඳී සිටී. සේවක සංඛ්‍යාව 50 දෙනෙකුට වඩා අඩු සංඛ්‍යාවක් සහිත සේවායෝජකයන් හට ('සී' කාණ්ඩය) තම දායක මුදල් හා අදාළ විස්තර 'සී' පෝරමයක් පුරවා මාසිකව එවිය හැකි අතර, 2012 වසරේ දී පනතේ කරනු ලැබූ සංශෝධනය සහ ඊට අදාළව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද රෙගුලාසි අනුව, අවම සේවක සංඛ්‍යාව 50 ක් හෝ ඊට වැඩි සියලුම සේවායෝජකයන් විසින් මාසික දායක මුදල් හා දායක මුදල් විස්තර විද්‍යුත් මාධ්‍යයන් තුළින් මාසිකව එවිය යුතුය.

අරමුදලෙහි විශ්‍රාමික සාමාජිකයන් හට තම වයස, (පිරිමි සාමාජිකයින්ට වයස අවුරුදු 55 හා කාන්තා සාමාජිකාවන්ට වයස අවුරුදු 50) සම්පූර්ණ වීම මත ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකිය. එයට අමතරව, ස්ථිරව රට හැර යාම, පූර්ණ දුබලතාවයට පත්වීම, කාන්තා සාමාජිකාවන් විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම සහ විශ්‍රාම වැටුප් ලබන රජයේ රැකියාවකට පිවිසීම යන හේතු මත සාමාජිකයින්ට ඔවුන්ගේ සේ.අ.අ. ගිණුම් වලින් අරමුදල් ඉවත් කර ගැනීම සඳහා අයදුම් කිරීමට හැකි වෙයි. මියගිය සාමාජිකයන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් එම සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබයි. විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව, තම සාමාජික ශේෂය ඇපයට තබා අනුමත ණය දෙන ආයතන පහකින් නිවාස ණය ලබා ගැනීමට ද අරමුදල පහසුකම් සපයා ඇත. තවද, 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධන) [සේ.අ.අ. (සංශෝධන)] පනත අනුව නිවාස ඉදිකිරීම් හා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමේ අරමුණින් ගිණුම් ශේෂය රුපියල් 300,000/-කට වැඩි සහ සේවා කාලය වසර 10 කට වැඩි දැනටමත් දායක මුදල් ගෙවමින් පවතින සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් උපරිමය රුපියල් මිලියන 2 කට යටත්ව, සියයට 30 ක් ආපසු ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත.

සිංහල

# ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ කාර්යභාරය

සාමාජික දායක මුදල්, අධිභාර සහ ආදායම් රැස්කිරීම.

සාමාජික ගිණුම් පවත්වාගෙන යාම සහ සාමාජිකයන් වෙත ගිණුම් ප්‍රකාශයන් නිකුත් කිරීම.

අරමුදලේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කොට අරමුදල සතු අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වාර්ෂික පොළී අනුපාතිකය, ගරු කම්කරු අමාත්‍යවරයාගේ හා ගරු මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කිරීම.

අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම හා පොදු ගිණුම් පවත්වාගෙන යාම.

කම්කරු කොමසාරිස් විසින් ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාළ ප්‍රතිලාභ ගෙවීම.

නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයින් වෙනුවෙන් ගිණුම් ශේෂ සහතික, ඇපකර ලෙස නිකුත් කිරීම සහ අදාළ නිවාස ණය සාමාජිකයින් විසින් නොගෙවා සිටින විට අදාළ සහභාගීත්ව ණය දෙන ආයතන වෙත හිඟ ණය පියවීම.

යම් ගිණුම් වර්ෂයක් අවසන් වී තෙමසක් ඇතුළත අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන සහ ආයෝජන ප්‍රකාශන වැනි තොරතුරු ගරු කම්කරු ඇමතිවරයාට සහ ගරු මුදල් ඇමතිවරයාට ඉදිරිපත් කිරීම.

සාමාජික ගිණුම් ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නමින් නැවත ලියාපදිංචි කිරීම.

කම්කරු කොමසාරිස් විසින් සියයට 30 ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාළ ප්‍රතිලාභ ගෙවීම.

සාමාජික ගිණුම් හා සාමාජික නම්වල ඇති වැරදි සංශෝධනය කිරීම.

# කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාරය

සේවායෝජකයන් හා සේවා නියුක්තියන් අරමුදල සඳහා ලියාපදිංචි කිරීම.

පනතේ විධි විධාන අනුව කටයුතු කිරීම සහතික කර ගැනීම පිණිස අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම සහ දායක මුදල් නිසි ලෙස ගෙවීම පැහැර හැරීම සම්බන්ධව නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීම.

ප්‍රමාද වී ගෙවනු ලබන දායක මුදල් සම්බන්ධයෙන් සේවායෝජකයන්ගෙන් දඩ මුදල් අයකර ගැනීම.

ප්‍රතිලාභ හිමිකම් සඳහා වූ අයදුම්පත් භාර ගැනීම සහ එම අයදුම්පත්වලට අදාළව ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධ තීරණ ලිපි මහ බැංකුවට නිකුත් කිරීම.

සාමාජිකයන්ගේ පෙර පැවති සාමාජික ගිණුම් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීම.

සාමාජිකයින්ට තම ගිණුම් ශේෂ ඇපයට තබා අනුමත ණය දෙන ආයතන වලින් නිවාස ණය ලබා ගැනීමට හැකිවන පරිදි අදාළ නිවාස ණය අයදුම්පත් අනුමත කිරීම.

අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

සේ.අ.අරමුදලේ ප්‍රගතිය උදෙසා විවිධ ව්‍යාපෘති දියත් කිරීම.



‘ආ’ කොටස

# ආයතනික විශ්ලේෂණය

# දැක්ම



# අපගේ දැක්ම

"සමෘද්ධිමත් විශ්‍රාම දිවියක්
සාමාජිකයන් වෙත
ලබා දීමට හැකිවන අයුරින්
කලාපයේ වඩාත් විශ්වාසදායී
විශ්‍රාම අරමුදල බවට පත්වීම"

# අපගේ මෙහෙවර

"නව්‍ය හා විචක්ෂණශීලී
කළමනාකරණය තුලින්
ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා
කාර්යක්ෂම සේවාවක්
සාමාජිකයන් වෙත ලබාදීම"

# 60 වසරක විශිෂ්ටත්වය
## ගමන්මගෙහි මංසලකුණු

**1958**

1958 අංක 15 දරන සේ.අ.අ. පනත බලාත්මක කිරීම.

සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් සේවකයා විසින් 4% ක් සහ සේවායෝජකයා විසින් 6% ක් ලෙස ස්ථාපිත කිරීම.

**1971**

සේවකයා සහ සේවායෝජකයා විසින් සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් පිළිවෙලින් 4% සිට 6% දක්වා සහ 6% සිට 9% දක්වා වැඩි කිරීම.

**1981**

සේවකයා සහ සේවායෝජකයා විසින් සේ.අ.අ. වෙත දායක කළ යුතු අනුපාතයන් පිළිවෙලින් 8% සහ 12% දක්වා තවදුරටත් වැඩි කිරීම.

**1988**

අනුමත ණය දෙන ආයතනවලින් නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ගේ සේ.අ.අ. ඇපයක් ලෙස යොදා ගැනීමට පහසුකම් සැලසීම.

**1996**

සේ.අ.අ. පරිගණක පද්ධතිය වන AS 400 පද්ධතිය ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී ස්ථාපනය කිරීම (මහ බැංකු බෝම්බ පිපිරීමෙන් පසු).

**1998**

ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සැමරුම නිමිත්තෙන් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති ප්‍රදර්ශනයේ දී පළමුවරට දුරස්ථව 'සාමාජික ශේෂ ප්‍රකාශ' නිකුත් කිරීම.

**1999**

සේ.අ.අ. ආපසු ගෙවීමේ බලය පැවරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම.

කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මංගත සන්නිවේදන සම්බන්ධතාවය ඇති කිරීම.

ඉලෙක්ට්‍රොනිකව තීරණ ලිපි කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මාරු කිරීම ඇරඹීම.

දිස්ත්‍රික් කම්කරු කාර්යාල ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමග ඉලෙක්ට්‍රොනිකව සම්බන්ධ කිරීම ඇරඹීම.

**2000**

සේ.අ.අ. හිමිකම් පෑමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීම.

අර්ධ වාර්ෂික සාමාජික ශේෂ ප්‍රකාශනයන් නිකුත් කිරීම.

**2001**

සේ.අ.අ. දායක මුදල් විද්‍යුත් දායක ක්‍රමය යටතේ රැස්කිරීම ඇරඹීම.

සේ.අ.අ. දෙපාර්තමේන්තුව

# කම්කරු දෙපාර්තමේන්තුව

**2002**

දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත සේ.අ.අ. ගෙවීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම.

**2006**

පොදු ලෙජර, ආයෝජන සහ තොග මොඩියුල සමඟ SAP පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීම.

**2007**

සේ.අ.අ. නිල වෙබ් අඩවිය ත්‍රෛභාෂාවෙන් දියත් කිරීම.

**2008**

සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම.

ශ්‍රී ලංකාවේ 60 වන නිදහස් සංවත්සරයට සමගාමීව වෙබ් සහ ජංගම දුරකථන හරහා සාමාජික ශේෂයන් සහ තොරතුරු බෙදා හැරීම දියත් කිරීම.

**2011**

ද්විත්ව කේන්ද්‍රීය පිවිසුම් ලෙජර පද්ධතියක් සහිත සාමාජික වගකීම් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම.

සේ.අ.අ. දායක මුදල් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා මංගතව ගෙවීමේ ක්‍රමවේදය හඳුන්වා දීම.

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු. ට්‍රිලියන 1 මට්ටම කරා ළඟා වීම.

**2012**

සේ.අ.අ. පනත සංශෝධනය කිරීම සහ 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනත මගින් අංක 23 A වගන්තිය එකතු කිරීම.

සාමාජිකයින් 50 ට වැඩි සේවායෝජකයින් වෙනුවෙන් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේ.අ.අ. තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම.

**2013**

දායක මුදල් ගෙවීම පැහැර හැරීම් සහ අධිකරණ නඩු අධීක්ෂණය කිරීම සඳහා නව පරිගණකගත පද්ධතියක් හඳුන්වා දීම.

**2015**

සේ.අ.අ. 30% හිමිකම් පෑමේ ක්‍රියාවලිය ස්ථාපිත කිරීම.

නිවාස හා වෛද්‍යමය අරමුණු සඳහා 30% ක පූර්ණ විශ්‍රාමික ප්‍රතිලාභ නිදහස් කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම.

විද්‍යුත් වාර්තා ගබඩාකරණ පහසුකම් ක්‍රියාත්මක කිරීම.

**2016**

මංගතව සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත 100% ස්වයංක්‍රීය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම.

**2017**

දීප ව්‍යාප්ත මහජන බැංකු ශාඛා සමඟ ඒකාබද්ධ වෙමින් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය විමධ්‍යගත කිරීම.

සේ.අ.අ. හි ශුද්ධ වත්කම් වටිනාකම රු. ට්‍රිලියන 2 මට්ටම කරා ළඟා වීම.

**2018**



# මූල්‍ය තොරතුරු - 2018

අරමුදලේ වටිනාකම
රු. බිලියන
2,289.36



දායක මුදල් ලැබීම්
රු. බිලියන
145.00

දළ ආදායම
රු. බිලියන
222.84

ප්‍රතිලාභ ගෙවීම්
රු. බිලියන
106.50



ශුද්ධ දායක මුදල්
රු. බිලියන
38.50



මෙහෙයුම් වියදම
රු. බිලියන
1.51

වාර්ෂික බදු වියදම
රු. බිලියන
30.72

ශුද්ධ ආදායම
රු. බිලියන
190.62



සාමාජික ගිණුම් ශේෂ මත
ගෙවන ලද පොළිය
රු. බිලියන
194.63

සාමාජිකයින් වෙත
ගෙවූ වාර්ෂික පොළී
අනුපාතය
9.50 %

මෙහෙයුම් වියදම් මුළු
ආදායමේ
ප්‍රතිශතයක් ලෙස
0.68 %



ආයෝජන මත
ප්‍රතිලාභ අනුපාතිකය
10.37 %





## රූප සටහන 01 — අරමුදලේ වර්ධනය




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| මුළු ශුද්ධ වත්කම්(රු.බි) | 1,487 | 1,665 | 1,841 | 2,066 | 2,289 |
| වර්ධන අනුපාතිකය (දකුණු අක්ෂය) | 14.4 | 12.0 | 10.6 | 12.2 | 10.8 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 02 — දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම් සහ ශුද්ධ දායක මුදල්




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු.බි) | 90.0 | 102.5 | 118.3 | 133.4 | 145.0 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු.බි) | 65.1 | 77.8 | 108.4 | 117.5 | 106.5 |
| ශුද්ධ දායක මුදල් (රු.බි) | 24.9 | 24.7 | 9.9 | 15.9 | 38.5 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 03 — සාමාජික ගිණුම් සංඛ්‍යාව




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| දායක මුදල් ගෙවන (මිලියන) | 2.4 | 2.6 | 2.6 | 2.8 | 2.8 |
| දායක මුදල් නොගෙවන (මිලියන) | 13.4 | 14.3 | 14.7 | 15.3 | 15.9 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 04 — ආයෝජන කළඹෙහි සංයුතිය




| සංයුතිය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත් (සියයට) | 91.2 | 92.7 | 93.1 | 91.3 | 92.2 |
| කොටස් (සියයට) | 6.7 | 5.5 | 4.6 | 4.2 | 3.3 |
| ණයකර සහ වෙනත් (සියයට) | 2.1 | 1.8 | 2.3 | 4.5 | 4.5 |

රජයේ සුරැකුම්පත් · කොටස් · ණයකර සහ වෙනත්

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 05 — සාමාන්‍ය ආයෝජන කළඹ මත ප්‍රතිලාභ




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| දළ ආයෝජන ආදායම (රු.බි.) | 163.2 | 171.5 | 192.9 | 222.6 | 222.4 |
| දළ ආයෝජන මත ප්‍රතිලාභ (සියයට) | 12.1 | 11.3 | 11.4 | 11.8 | 10.4 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 06 — සාමාජික ගිණුම්වල වර්ෂ අවසාන ශේෂ මත ගෙවූ පොලිය




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| පොලී ගෙවීම් (රු. බිලියන) | 137.3 | 154.2 | 171.6 | 191.2 | 194.6 |
| පොලී අනුපාතිකය (දකුණු අක්ෂය) (සියයට) | 10.5 | 10.5 | 10.5 | 10.5 | 9.5 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 07 — සේ.අ.අ. සාමාජිකයන් සඳහා වූ සඵල ප්‍රතිලාභ අනුපාතය සහ වෙළෙඳපොළ පොලී අනුපාතික




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
වාර්ෂික වාර්තාව - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව



# මෙහෙයුම් තොරතුරු 2018

## රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු

- ශක්තිමත් කරන ලද අභ්‍යන්තර පාලන රාමුවක් සහිතව නැවත ආරම්භ විය.

## 2018 අවසන් වන විට :

- සාමාජික ගිණුම් - මිලියන 18.7
- සක්‍රිය සාමාජික ගිණුම් - මිලියන 2.8
- සේවායෝජකයින් - 86,206
- ජාතික හැඳුනුම්පතේ නමට අනුව නැවත ලියාපදිංචි වූ සාමාජිකයින් - මිලියන 1.55
- නිවාස ණය ඇප සහතික නිකුත් කල සාමාජිකයින් ගණන - 10,036

## විශ්‍රාමික ප්‍රතිලාභ :

- වටිනාකම - රු. බිලියන 106.5
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 241,581

## පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ :

- වටිනාකම - රු. බිලියන 14
- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - රු. මිලියන 28,377

## විද්‍යුත් දායක මුදල් ක්‍රමය :

- ලියාපදිංචි සේවායෝජකයින් - 8,540 (2018 අවසන් වනවිට)
- සක්‍රිය සාමාජික ගිණුම් වලින් 81% ක්
- මුළු මාසික සේ.අ.අ. දායකත්වයෙන් 88%

## සේවායෝජක, සාමාජික සහ වෙනත් පාර්ශවකරුවන්ගේ විමසීම් :

- පැමිණීම් - 173,595
- ලිපි - 100,058
- දුරකථන ඇමතුම් - 82,454
- විද්‍යුත් තැපැල් - 9,542

## දැනුම්වත් කිරීමේ වැඩසටහන් :

- ප්‍රධාන වැඩසටහන් - 03
- ජංගම සේවා - 20

## කම්කරු දෙපාර්තමේන්තුව :

- ගෙවීම් පහසුකම් විමධ්‍යගත කිරීම - උප කම්කරු කාර්යාල 06 ක් හරහා සාමාජික ගැටලු නිරාකරණය වෙනුවෙන් : දිවයින පුරා ජංගම සේවා පැවැත්වීම, අත් පත්‍රිකා බෙදීම, විවිධ වැඩසටහන් පැවැත්වීම
- දැනුම්වත් කිරීමේ වැඩසටහන් : රූපවාහිනී දැන්වීම්, ගුවන්විදුලි දැන්වීම්

# 1

# ආර්ථික සමාලෝචනය - 2018

## 1. ආර්ථික වර්ධනය හා සාර්ව ආර්ථික තත්ත්වය

ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වර්ෂයේ දී වාර්තා වූ සියයට 3.4 ට සාපේක්ෂව 2018 වර්ෂයේ සියයට 3.2 ක අඩු වර්ධන වේගයක් වාර්තා කරන ලදී. මූර්ත දළ දේශීය නිෂ්පාදනය (ද.දේ.නි.) ට සේවා අංශයේ දායකත්වය සියයට 57.7 ක් වූ අතර, එය 2017 වසරේ වාර්තා කළ සියයට 3.6 ට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 4.7 ක් දක්වා වර්ධනය විය. සේවා අංශයේ වාර්තා වූ වර්ධනයට මූල්‍ය සේවා අංශය හා තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතු පිළිවෙලින් ඉහළ දායකත්වයක් සපයන ලදී. එමෙන්ම ද.දේ.නි. ට කාර්මික අංශයේ දායකත්වය සියයට 26.1 ක් වූ අතර, එය 2017 වසරේ වාර්තා කළ සියයට 4.1 ට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 0.9 ක් විය. කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් වල වර්ධනය මන්දගාමී වීමට හේතු වූයේ වර්ෂය තුළ දී ඉදිකිරීම්, පතල් හා කැණීම් කටයුතුවල

රූප සටහන 08 මූර්ත ද.දේ.නි.යෙහි වාර්ෂික වර්ධනය




මූලය : වාර්ෂික වාර්තාව - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව

සිදු වූ අඩු වීමයි. 2018 වර්ෂයේ දී ද.දේ.නි. ට කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 7.0 ක් වූ අතර, එය 2017 වසරේ වාර්තා කළ සියයට 0.4 ක පහත වැටීමට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 4.8 කින් වර්ධනය විය. පසුගිය වර්ෂයේ පැවති අහිතකර කාලගුණික තත්ත්වය යථා තත්ත්වයට පත්වීම එයට හේතු විය.

සැපයුම් තත්ත්වය ඉහළ යෑම මෙන්ම සමාහාර ඉල්ලුම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මතුපිට හා මූලික උද්ධමනය 2018 වසරේ දී තනි අඩු අගයක පැවතුණි. අභ්‍යන්තර හා බාහිර සාධක හේතුවෙන්, 2018 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය සැලකිය යුතු පීඩනයක් අත්දකින ලද අතර, වෙළෙඳ හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ දී වාර්තා වූ සියයට 10.9 ට සාපේක්ෂව 2018 දී සියයට 11.6 දක්වා ඉහළ ගියේය.

එසේම ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2017 දී වාර්තා වූ සියයට 2.6 ට සාපේක්ෂව 2018 දී සියයට 3.2 ක් දක්වා පුළුල් විය. 2018 වසරේ දී ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද (එ.ජ.) ඩොලරයට සාපේක්ෂව සියයට 16.4 කින් අවප්‍රමාණය විය.

2018 වසර තුළ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම අඩු වුව ද, රජයේ සමස්ත වියදම්වල සිදු වූ මන්දගාමී වර්ධනය හේතුවෙන් සමස්ත අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක්

සිංහල

ලෙස පෙර වසරේ පැවති සියයට 5.5 ට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 5.3 දක්වා අඩු විය.

## 1.1 උද්ධමනය හා පොලී අනුපාතික

වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ උද්ධමන අපේක්ෂා මනාව පාලනය කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස මතුපිට සහ මූලික උද්ධමනය 2018 වසර තුළ දී අඩු මට්ටමක පැවතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2017 වසර අවසානයේ පැවති සියයට 7.1 සිට 2018 වසර අවසානය වන විට සියයට 2.8 දක්වා අඩු විය. සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2017 වසර අවසානයේ පැවති සියයට 7.3 සිට 2018 දෙසැම්බර් වන විට සියයට 0.4 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ඇති වන අහිතකර බලපෑම් හමුවේ වුව ද උද්ධමනය අඩු වීමට හේතු වූයේ, ඉන්ධන මිල සහ තෝරාගත් භාණ්ඩ සඳහා පනවා ඇති බදු අඩු කිරීමයි. මේ අතර, ආර්ථිකයේ ඉල්ලුමෙන් ඇඳුණු යටිදැරි උද්ධමනය මැනීමේ වඩාත් යෝග්‍ය මිනුම වන මූලික උද්ධමනය, 2017 වසර අවසානයේ පැවති සියයට 4.3 ට සාපේක්ෂව 2018 වසර අවසානයේ දී සියයට 3.1 දක්වා අඩු විය.

රූප සටහන 09
වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය
(කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද : 2013=100)




මූලය : වාර්ෂික වාර්තාව - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 10
වාණිජ බැංකු ණය හා තැන්පතු අනුපාතික




මූලය : වාර්ෂික වාර්තාව - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව

යහපත් උද්ධමන අපේක්ෂාවන් සහ ආර්ථික වර්ධනය අඩුවීම හේතුවෙන් මහ බැංකුව විසින් 2017 ට සාපේක්ෂව 2018 දී සාපේක්ෂව ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය අනුගමනය කළේය. ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය සහ දේශීය මුදල් වෙළෙඳපොළ වර්ධනයන්ට ප්‍රතිචාර දක්වමින් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2018 වසර පුරාම බොහෝ දුරට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව මධ්‍යයේ පැවතුණි. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2017 වසරේ අවසානයේ පැවති 8.15 ට සාපේක්ෂව 2018 වසර අවසානයේ දී සියයට 8.95 ක් විය. ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය, 2018 වසරේ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්වීම් හා අනුකූලව විචලනය විය. ඒ අනුව, එක් දින ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය 2017 වසර අවසානයේ වාර්තා වූ සියයට 8.15 ට සාපේක්ෂව 2018 වසර අවසානයේ දී සියයට 9.00 ක් විය.

2018 අප්‍රේල් මාසය වන තෙක් පවත්වා ගෙන යනු ලැබූ දැඩි ද්‍රවශීලතා තත්ත්වය සහ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මධ්‍යයේ වාණිජ බැංකු වල බොහෝ තැන්පතු පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතුණි. වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතු වලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරනු ලබන බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය, 2017 වසර අවසානයේ වාර්තා කළ සියයට 9.07 සිට 2018 වසර අවසානය වනවිට සියයට 8.81 දක්වා පහළ ගියේය. කෙසේ වුවද, දැඩි ද්‍රවශීලතා

තත්ත්වය යටතේ තැන්පතු දිරිමත් කිරීමට වාණිජ බැංකු දැරූ උත්සාහය පිළිබිඹු කරමින් නව තැන්පතු වලට අදාළ පොලී අනුපාතික වල හැසිරීම පිළිබිඹු කරනු ලබන, බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය 2018 අවසානය වන විට සියයට 10.94 දක්වා පදනම් අංක 88 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම රුපියල් ණය හා අත්තිකාරම් වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වූ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය 2018 වසර තුළ දී සියයට 14.40 දක්වා ඉහළ ගියේය.

## 1.2 වැටුප් හා සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතිකය 2017 වසරේ වාර්තා වූ සියයට 4.2 හි සිට 2018 වසරේ දී සියයට 4.4 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. තරුණ තරුණියන්, කාන්තාවන් හා ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ඇති පුද්ගලයන් අතර ඉහළ සේවා වියුක්ති අගයක් තවදුරටත් වාර්තා විය.

රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2018 වසරේ දී සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. තවද, විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2018 වසරේ දී සියයට 0.6 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ දී නාමික වැටුප් වල සුළු වර්ධනය හේතුවෙන් වර්ෂය තුළ රාජ්‍ය සහ විධිමත් පෞද්ගලික අංශ වල මූර්ත වැටුප් පහත වැටුණි. මේ අතරතුර, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික හා මූර්ත වැටුප් 2018 වර්ෂය තුළ වර්ධනය විය.

## 1.3 මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

පහළ මට්ටමක පැවති උද්ධමනය සහ ළඟා විය හැකි විභව මට්ටමට වඩා පහළින් පැවති මූර්ත ආර්ථික වර්ධනය හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව 2018 අප්‍රේල් මාසයේ දී සිය දැඩි මුදල් ප්‍රතිපත්ති කාලසීමාව අවසන් කළ අතර, වසරේ ඉතිරි කාලය තුළ දී මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය. ඒ අනුව, 2018 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 25 කින් සියයට 8.50 දක්වා අඩු කළේය. 2018 සැප්තැම්බර් මාසයේ සිට දේශීය මුදල් වෙළෙඳපොළෙහි අඛණ්ඩව පැවති අධික ද්‍රවශීලතා හිඟය හේතුවෙන් 2018 නොවැම්බර් මස මැද භාගයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) ප්‍රතිශතාංක 1.50 කින් අඩු කිරීම මගින් නිත්‍ය පදනම යටතේ ද්‍රවශීලතාව සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළේය. කෙසේ වුවද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය අඩු කිරීමෙන් ඇති වූ බලපෑම සමනය කිරීමට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වා ගෙන යෑම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) පදනම් අංක 75 කින්, සියයට 8.00 දක්වා ද, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින්, සියයට 9.00 දක්වා ද ඉහළ නංවන ලදී.

2018 වසරේ දී රාජ්‍ය මූල්‍ය උපායමාර්ග, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් සකස් කරන ලදී. ඒ අනුව, අයවැය හිඟය සහ නොපියවූ රාජ්‍ය ණය ඉලක්කගත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා ආදායම් එක්රැස් කිරීම ඉහළ නැංවීම හා වියදම් තාර්කිකරණය කිරීම කෙරෙහි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගය යොමු විය. සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ වාර්තා වූ සියයට 5.5 සිට 2018 වසරේ දී සියයට 5.3 දක්වා අඩු විය. කෙසේ වුවද, මධ්‍යම රජයේ ණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2017 වසර අවසානයට පැවති සියයට 76.9 සිට 2018 වසර අවසානයේ දී සියයට 82.9 දක්වා ඉහළ ගියේය. ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියල අව ප්‍රමාණය වීම, සාපේක්ෂ වශයෙන් පහළ නාමික දළ දේශීය නිෂ්පාදිතය සහ අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා ඉහළ

සිංහල

ශුද්ධ ණය ගැනීම් යනාදියේ සමස්ත බලපෑම ණය අනුපාතය 2018 වසර තුළ දී ඉහළ යාම සඳහා හේතු විය. 2018 වසරේ දී සමස්ත අයවැය හිඟය ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කරන ලදී. ඒ අනුව, වසර තුළ වූ අවශ්‍යතාවයෙන් සියයට 57.5 (රු. බිලියන 437.2) ක් දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කළ අතර, ඉතිරි සියයට 42.5 (රු. බිලියන 323.5) ක් විදේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කරනු ලැබීය. 2018 වසරේ දේශීය මූලාශ්‍ර මගින් අයවැය හිඟය මූල්‍යනයේ දී රජය වැඩි වශයෙන් දේශීය බැංකු නොවන මූලාශ්‍ර මත රඳා පැවති අතර, දේශීය බැංකු අංශය මත රඳා පැවතීම සැලකිය යුතු ලෙස අඩු විය. බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය 2017 වසරේ වූ සියයට 63.8 ට සාපේක්ෂව 2018 දී සියයට 25.0 දක්වා අඩු වූ අතර, බැංකු නොවන අංශයෙන් සිදු කළ මූල්‍යනය, දේශීය මූල්‍යනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2017 වසරේ වූ සියයට 36.2 ට සාපේක්ෂව 2018 දී සියයට 75.0 ක් විය.

## 1.4 රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ හා ඵලදා අනුපාතිකයන්ගේ විචලයයන්

2018 වසරේ පළමු මාස නවය තුළ දී රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළ අතර, 2018 අවසාන කාර්තුව තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, 2017 වසර අවසානය හා සැසඳීමේ දී දින 91, දින 182 හා දින 364 භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ඵලදා අනුපාතික 2018 වසර අවසානයේ දී සියයට 10.01, සියයට 9.99 හා සියයට 11.20 දක්වා පිළිවෙලින් පදනම් අංක 232 කින්, පදනම් අංක 169 කින් සහ පදනම් අංක 230 කින් ඉහළ ගියේය. භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික වල හැසිරීමට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, රජයේ ඉහළ ණය ගැනීමේ අවශ්‍යතාව හේතුවෙන් ප්‍රාථමික වෙළෙඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලදා අනුපාතිකයන් ද, 2018 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ ගියේය. කෙසේ වුවද, ඉන් අනතුරුව වෙළෙඳපොළ ප්‍රවණතා සහ වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වය පිළිබිඹු කරමින් භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළේය. 2018 වසර තුළ දී රජය කෙටිකාලීන සහ මැදි කාලීන භාණ්ඩාගාර බැඳුම්කර වැඩි වශයෙන් නිකුත් කළ අතර, වසර 10 ක සහ වසර 15 ක පරිණත කාල සහිත දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර ද ඇතැම් අවස්ථාවල නිකුත් කරන ලදී. පැවති හිඟ ද්‍රවශීලතා තත්ත්වය හමුවේ රජයේ සුරැකුම්පත් සඳහා ද්විතියික වෙළෙඳපොළ ඵලදා වක්‍රය, 2017 වසරේ පැවති මට්ටම හා සැසඳීමේ දී 2018 වසරේ දී ඉහළට විතැන් විය.

## 1.5 සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළ

2017 දී වාර්තා වූ ලැයිස්තුගත ණයකර නිකුතු 5 ට සාපේක්ෂව 2018 දී සාංගමික ණයකර ලැයිස්තුගත කිරීම් 11 ක් වාර්තා විය. මෙම ණයකර ප්‍රධාන වශයෙන් නිකුත් කරනු ලැබුවේ, බාසල් III (BASEL III) අවශ්‍යතා යටතේ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාග්ධනය රැස්කිරීමට බැංකු විසිනි. මෙම ණයකර මත

රූප සටහන 11
**රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය**




මූලය : වාර්ෂික වාර්තාව - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 12
**සමස්ත කොටස් මිල දර්ශකයෙහි සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකයෙහි විචලනය**




මූලය : කොළඹ කොටස් වෙළඳපොල

පිරිනැමූ ස්ථිර පොළී අනුපාතය 2017 දී වාර්තා වූ සියයට 11.95 සිට සියයට 15.00 ට සාපේක්ෂව 2018 දී සියයට 12.00 සිට සියයට 14.75 පරාසය තුළ විය.

## 1.6 කොළඹ කොටස් වෙළෙඳපොළ

දේශීය හා ගෝලීය වෙළෙඳපොළෙහි වූ අහිතකර වර්ධනයන්ට ප්‍රතිචාර දක්වමින් 2018 වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය 2017 වසරේ වාර්තා කළ සියයට 2.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 5.0 කින් ද එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය 2017 වසරේ දී වාර්තා කළ සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 14.6 කින් ද 2018 වර්ෂයේ පහත වැටුණි. එමෙන්ම කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම 2017 වසරේ දී පැවති රු. මිලියන 915.3 ට සාපේක්ෂව 2018 වසරේ දී රු. මිලියන 833.6 ක් දක්වා අඩු විය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2017 වසර අවසානයේ දී වාර්තා කළ රු.බිලියන 2,899.3 ට සාපේක්ෂව 2018 වසර අවසානයේ දී රු. බිලියන 2,839.5 ක් දක්වා අඩු විය. සමස්ත වෙළෙඳපොළ පිරිවැටුමට විදේශ ආයෝජකයින්ගේ දායකත්වය 2017 වසර තුළ දී වාර්තා කළ සියයට 46.9 ට සාපේක්ෂව 2018 වසර තුළ දී සියයට 44.3 දක්වා සුළු වශයෙන් අඩු විය. 2018 වසර තුළ දී මූලික මහජන නිකුතු දෙකකින් රු. බිලියන 2.0 ක අරමුදල් ප්‍රමාණයක් සහ ලැයිස්තුගත සමාගම් විසින් හිමිකම් නිකුතු දහසයක් මගින් රු. බිලියන 42.2 ක අරමුදල් රැස්කර ගන්නා ලදී.

සිංහල

# 2

# සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය - 2018

## 2. හැඳින්වීම

2018 වසර අවසානයේ දී අරමුදලෙහි මුළු ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 2,289.4 ක් ලෙස වාර්තා වූ අතර, මෙය 2017 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 2,066.3 හා සැසඳීමේ දී සියයට 10.8 ක වර්ධනයකි. 2018 වසර අවසන් වනවිට මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 18.7 ක් විය. සක්‍රීය සාමාජික ගිණුම් ප්‍රමාණය 2018 වසර අවසන් වනවිට මිලියන 2.85 ක් විය. එය 2017 වසරේ මිලියන 2.77 සමඟ සසඳන විට සියයට 2.9 ක වර්ධනයක් වූ අතර, අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව 2017 වසරේ වාර්තා වූ මිලියන 15.3 ට සාපේක්ෂව 2018 වසර අග වනවිට මිලියන 15.9 තෙක් වැඩි විය. ඒ අතර, දායක සේවායෝජකයින් සංඛ්‍යාව 2017 අවසන් වනවිට වාර්තා වූ 76,782 සිට 2018 අවසානයේ දී 86,203 දක්වා සියයට 12.3 කින් වර්ධනය විය.

## 2.1 සාමාජික දායකත්ව හා අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

2018 වසරේ දායක මුදල් ලැබීම්, 2017 වසරේ දී පැවති රුපියල් බිලියන 133.4 සිට රුපියල් බිලියන 145.0 දක්වා සියයට 8.7 කින් වර්ධනය විය. 2018 වසරේ දී සාමාජිකයන්ට හා ඔවුන්ගේ නීතිමය උරුමකරුවන්ට ගෙවන ලද ප්‍රතිලාභ සියයට 30 ප්‍රතිලාභ ගෙවීම් ද ඇතුළත්ව රුපියල් බිලියන 106.5 ක් වූ අතර, එය 2017 වසරේ ගෙවූ රුපියල් බිලියන 117.5 ට සාපේක්ෂව සියයට 9.36 ක අඩු වීමකි. 2018 දී සිදු කරන ලද මුළු මුදල් ආපසු ගෙවීම් සංඛ්‍යාව 241,581 ක් වූ අතර, එය 2017 දී වාර්තා වූ 230,902 ට සාපේක්ෂව සියයට 4.6 ක වැඩි වීමකි. ඒ අනුව, ශුද්ධ දායක මුදල් (දළ දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 15.9 ට සාපේක්ෂව රුපියල් බිලියන 38.5 දක්වා සියයට 142.5 ක වැඩි වීමක් වාර්තා විය. පසුගිය වසරවලට සාපේක්ෂව, 2018 වසර තුළ දී ශුද්ධ දායක මුදල්වල වැඩිවීම සඳහා ප්‍රධාන ලෙස බලපාන කරුණ වූයේ නිවාස සහ වෛද්‍ය අවශ්‍යතා වෙනුවෙන් සියයට 30 ප්‍රතිලාභ ගෙවීම් පහසුකම් යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම පහළ යාමයි. 2017 වසරේ දී රුපියල් බිලියන 17.46 ක් වූ එය 2018 වසරේ දී රුපියල් බිලියන 14.9 ක් දක්වා සියයට 14.4 කින් පහළ ගොස් ඇත. සියයට 30 ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමය ආරම්භ වූ 2015 වසරේ සිට 2018 වසර අවසානය වන විට ඒ සඳහා සිදු කරන ලද ප්‍රතිලාභ ගෙවීම්වල සමස්ත වටිනාකම රුපියල් බිලියන 73.4 කි. සංඛ්‍යා සටහන 01 හි දැක්වෙන පරිදි ගෙවූ ප්‍රතිලාභ වලින් වැඩි කොටසක් විශ්‍රාමික දිවියට එළඹි සාමාජිකයින් සඳහා වූ අතර, දෙවැනි වැඩිම ප්‍රතිලාභ ගෙවීම් සිදුවී ඇත්තේ සියයට 30 ප්‍රතිලාභ සඳහාය.

**සංඛ්‍යා සටහන 1** **සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් සංයුතිය**

| ප්‍රතිලාභ ගෙවීම් සඳහා වූ පදනම | ප්‍රතිලාභ ගෙවීම් ඉල්ලුම්පත් ගණන (අ) | | ප්‍රතිලාභ ගෙවීම් වල මුළු වටිනාකම (රු. බිලියන) | |
|---|---|---|---|---|
| | **2017** | **2018** | **2017** | **2018** |
| විශ්‍රාමික දිවියට එළඹීම | 88,109 | 85,507 | 70.37 | 74.24 |
| සියයට 30 ප්‍රතිලාභ ආපසු ගැනීම් | 33,114 | 28,783 | 17.46 | 14.94 |
| විවාහ හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම | 22,668 | 21,896 | 6.59 | 7.03 |
| සංක්‍රමණය | 1,990 | 2,011 | 3.26 | 3.66 |
| වෛද්‍ය හේතූන් | 1,051 | 1,000 | 3.05 | 0.95 |
| සාමාජිකයාගේ මරණය | 4,637 | 4,740 | 2.72 | 2.83 |
| විශ්‍රාම වැටුප් ලැබෙන රැකියාවකට සම්බන්ධ වීම | 14,342 | 6,859 | 10.49 | 1.92 |
| වෙනත් | 2,784 | 658 | 3.54 | 0.93 |
| **එකතුව** | **168,695** | **151,454** | **117.48** | **106.50** |

(අ) කොටස් ගෙවීම්, හිමිකම් නොපෑ ප්‍රතිලාභ හා රඳවා ගනු ලැබූ ප්‍රතිලාභ හැර මුල් ප්‍රතිලාභ ගෙවීම් සඳහා ලද ඉල්ලුම්පත් ගණන පමණක් මෙහි ඇතුළත් වේ.

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව
සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

විශ්‍රාම දිවියට එළඹීම හේතුවෙන් සාමාජිකයන් සඳහා රුපියල් බිලියන 74.2 ක ප්‍රතිලාභ 2018 වසරේ දී ගෙවූ අතර, එය 2017 වසරේ ගෙවූ රුපියල් බිලියන 70.4 ට සාපේක්ෂව සියයට 5.4 ක වැඩි වීමකි. විශ්‍රාමිකයන් වෙත ගෙවූ ප්‍රතිලාභ හා සියයට 30 ප්‍රතිලාභ හැරුණු කොට අනිකුත් විවිධ පදනම් මත ගෙවන ලද ප්‍රතිලාභවල වටිනාකම 2018 වසරේදී රුපියල් බිලියන 17.3 කි.

## 2.2 සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන කළඹ

පසුගිය කාලපරිච්ඡේදවල ප්‍රවණතාවයන්ට අනුකූලව 2018 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) රුපියල් බිලියන 2,298.8 ලෙස වාර්තා වූ අතර, එය 2017 වසරේ පැවති රුපියල් බිලියන 2,048.6[1] ට සාපේක්ෂව සියයට 12.2 ක වර්ධනයකි.

2018 වසරේ දී ආයෝජන කළඹෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2018 වසරේ ඉපැයූ රුපියල් බිලියන 190.6 ක් වූ ශුද්ධ ආදායම සහ රුපියල් බිලියන 38.5 ක් වූ ශුද්ධ සාමාජික දායකත්වය වේ. සමස්ත ආයෝජන කළඹ රාජ්‍ය සුරැකුම්පත්, කොටස් වෙළෙඳපොළ ආයෝජන, සාංගමික ණයකර හා ස්ථාවර තැන්පතු ඇතුළු වෙනත් කෙටිකාලීන ආයෝජන වලින් සමන්විත වේ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සංකේන්ද්‍රණය වීම, 2017 වසරේ දී පැවති මුළු ආයෝජනවලින් සියයට 91.5 සිට 2018 අග වන විටදී සියයට 92.2 දක්වා ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, කොටස් වෙළෙඳපොළෙහි ආයෝජන සංයුතිය 2017 වසරේ දී පැවති සියයට 4.1 සිට 2018 වසරේ දී සියයට 3.3 දක්වා පහත වැටුණි. තවද, ආයෝජන කළඹින් සියයට 1.9 ක් සාංගමික ණයකරවල ආයෝජනය කර ඇති අතර, සියයට 1.5 කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. එක්දින ප්‍රතිවිකුණුම්, කාලීන ප්‍රති විකුණුම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ද ඇතුළත් මුළු ප්‍රති විකුණුම්

1. 2018.01.01 සිට සේ.අ.අ. විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර) සටහන 34.1 දී ඇති පරිදි අංක 9 හා අනුගත විය. ඒ අනුව, 2018.01.01 ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 යටතේ වාර්තා කර ඇති ආයෝජන අගයන්ට ගැළපීම් සිදු කරන ලදී.

සිංහල

| සංඛ්‍යා සටහන 2 | ආයෝජන කළඹෙහි සංයුතිය |
|---|---|

| මූල්‍ය උපකරණ අයිතමය | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| රජයේ සුරැකුම්පත් | 1,310.6 | 1,487.0 | 1,650.4 | 1,873.5 | 2,119.2 |
| කොටස් ආයෝජන | 96.6 | 87.6 | 80.9 | 84.3 | 74.9 |
| සාංගමික ණයකර | 18.3 | 22.6 | 34.3 | 38.7 | 43.7 |
| ස්ථාවර තැන්පතු | - | - | - | 49.3 | 33.6 |
| භාරකාර සහතිකපත්, ප්‍රති විකුණුම් ගනුදෙනු සහ වෙනත් ආයෝජන | 12.1 | 7.0 | 6.6 | 2.7 | 27.4 |
| **එකතුව** | **1,437.6** | **1,604.2** | **1,772.2** | **2,048.5** | **2,298.8** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ගනුදෙනු සමස්ත ආයෝජන කළඹෙන් සියයට 1.1 ක් ලෙස 2018.12.31 දිනට ගණනය කර ඇත.

### 2.2.1 රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ

භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ 2017 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 1,873.5, 2018 වසර අවසානයේ දී රුපියල් බිලියන 2,119.2 දක්වා සියයට 13.1 කින් වර්ධනය විය. 2018 වසරේ දී රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙන් රුපියල් බිලියන 218.3 ක පොලී ආදායමක් උපයාගෙන ඇති අතර, මෙය සේවක අර්ථසාධක අරමුදලේ මුළු දළ ආදායමෙන් සියයට 98.0 ක් වේ. රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය 2018 වසරේ දී සියයට 11.16 ක් ලෙස වාර්තා විය. සංඛ්‍යා සටහන 03 මගින් දක්වන කල්පිරීමේ ආකෘතියෙහි පරිදි සේ. අ. අරමුදලෙහි දිගුකාලීන ආයෝජන කෙරෙහි පවතින නැඹුරුතාවය පිළිබිඹු කරමින් රාජ්‍ය සුරැකුම්පත් කළඹෙන් සියයට 73.2 ක් වසර 5 කට වඩා වැඩි කාලයක් තුළ පරිනත වීමට නියමිත සුරැකුම්පත්වලින් සමන්විත වේ.

| සංඛ්‍යා සටහන 3 | රජයේ සුරැකුම්පත් කළඹෙහි කල්පිරීම් ආකෘතිය - 2018 වසර අවසානයට |
|---|---|

| කල්පිරීම | නාමික අගයට කල්පිරීමේ වටිනාකම (රුපියල් බිලියන) | දායකත්ව ප්‍රතිශතය | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 124.1 | 5.8 | 9.90 |
| වසර 1 - 2 | 182.9 | 8.5 | 11.26 |
| වසර 3 - 4 | 269.0 | 12.5 | 10.50 |
| වසර 5 ට වැඩි | 1,571.1 | 73.2 | 11.37 |
| **එකතුව** | **2,147.1** | **100.0** | **11.16** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### 2.2.2 සමාගම් කොටස් කළඹ

සමාගම් කොටස් කළඹ, ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් වලින් සමන්විත වන අතර, එය 2017.12.31 දිනට වූ රුපියල් බිලියන 84.3 ක වටිනාකමට සාපේක්ෂව 2018 වසරේ දී රුපියල් බිලියන 74.9 දක්වා සියයට 11.2 කින් අඩු වී ඇත. වෙළෙඳපොළ පදනම මත අගය කරන ලද ලැයිස්තුගත සමාගම් කොටස් කළඹ 2017.12.31 දින වන විට රුපියල් බිලියන 74.0 ක වටිනාකමට සාපේක්ෂව 2018.12.31 ක වන විට රුපියල් බිලියන 64.9 දක්වා සියයට 12.3 කින් අඩු වී ඇත. එමෙන්ම පිරිවැය පදනම මත අගය කරන ලද ලැයිස්තුගත නොවූ සමාගම් කොටස් කළඹ පසුගිය වසරේ පැවති රුපියල් බිලියන 10.3 ට සාපේක්ෂව 2018.12.31 වන විට රුපියල් බිලියන 9.9 කින් එනම් සියයට 3.5 කින් අඩු වී ඇත. මෙම ලැයිස්තුගත නොකළ සමාගම් කොටස් කළඹෙහි අඩු වීමට හේතු වී ඇත්තේ ජෙට්වින් සිම්ෆනි සමාගම (Jetwing Symphony PLC) ලැයිස්තුගත කිරීම හා සේ.අ.අ. විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත (SLFRS) අංක 09 ට අනුකූල වීමත් සමඟ ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙහි (Sri Lankan Catering Limited) ආයෝජනය ණය උපකරණයක් ලෙස නැවත වර්ගීකරණය කිරීමට සිදු වීමයි. සේ.අ.අ. මගින් කොටස් ආයෝජන කළඹක් පවත්වාගෙන යන අතර, එහි බැංකු, මූල්‍ය හා රක්ෂණ, විවිධාංගීකරණ සමාගම්, ඉදිකිරීම් හා ඉංජිනේරු, බලශක්ති, හෝටල් සහ සංචාරක සහ විදුලි සංදේශ යන විවිධ ක්ෂේත්‍රයන් යටතේ කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත ප්‍රමුඛ සමාගම්හි කොටස් අඩංගු වේ. සේ.අ. අරමුදලෙහි කොටස් ආයෝජන කළඹෙහි සියයට 56.3 ක් බැංකු, මූල්‍ය සහ රක්ෂණ ක්ෂේත්‍රයන්හි ආයෝජනය කර ඇති අතර, එම ක්ෂේත්‍රය 2018 වසර තුළ දී හොඳම කාර්යසාධනයක් වාර්තා කළ ක්ෂේත්‍ර අතරින් දෙවන තැන ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් ලැයිස්තුගත සමාගම්වල අයහපත් කාර්යසාධනය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 ට අනුගත වීම හේතුවෙන් 2018 වසරේ දී සේ.අ.අ. සමාගම් කොටස් කළඹෙහි රුපියල් බිලියන 7 ක ශුද්ධ අලාභයක් වාර්තා වී ඇත.

**රූප සටහන 13**
**2018 වසර අවසානයේ පැවති ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹේ ආංශික සංයුතිය (වෙළඳපොළ අගයට - රු. බිලියන)**




මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### 2.2.3 සාංගමික ණය කළඹ

සේවක අර්ථසාධක අරමුදල ආයෝජන ශ්‍රේණියට අයත් සමාගම් සහ ආයතන විසින් නිකුත් කර ඇති සාංගමික ණයකර, සුරැකුම්පත් සහතික සහ උකස් සුරැකුම්පත් යනාදී ණය උපකරණයන්හි ආයෝජනය කර ඇත. ඒ අනුව, 2018 වසරේ දී සේ.අ.අ. ඉහළ ආයෝජන ශ්‍රේණියට අයත් බැංකු ආයතන විසින් නිකුත් කරනු ලැබූ සාංගමික ණයකර නිකුතු හයක රුපියල් බිලියන 7.7 ක මුදලක් ආයෝජනය කරන ලදී. අරමුදලෙහි සාංගමික ණය කළඹ 2018 දෙසැම්බර් 31 වන විට පොත් අගය රුපියල් බිලියන 43.7 ක් වූ අතර, එය මුළු ආයෝජන කළඹෙන් සියයට 1.9 ක් විය. අරමුදල සාංගමික ණය කළඹෙන් උපයන ලද පොලී ආදායම රුපියල් මිලියන 5,143.0 ක් වූ අතර, සාංගමික ණය කළඹ මත වූ සාමාන්‍ය වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය වසර තුළ දී සියයට 11.92 ක් විය.

### 2.2.4 ප්‍රතිවිකුණුම් ගනුදෙනු

අරමුදලේ ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා දෛනික අතිරේක අරමුදල් ප්‍රති විකුණුම්වල සහ මහ බැංකුවේ විවෘත වෙළඳපොළ ක්‍රියාකාරකම් කවුළුව තුළ ආයෝජනය කරනු ලබයි. ඊළඟ ප්‍රාථමික බැඳුම්කර වෙන්දේසියේ පියවීම් දින දක්වා අරමුදල් රැස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රති විකුණුම් ගිවිසුම් සඳහා කරන ලද ඉහළ ආයෝජන පරිමාව හේතුවෙන් 2017 වසරේ දී

ඉපැයූ රුපියල් මිලියන 332.1 ට සාපේක්ෂව, 2018 වසරේ දී රුපියල් මිලියන 685.3 ක පොලී ආදායමක් ප්‍රතිවිකුණුම් ගනුදෙනු මඟින් උපයා ගන්නා ලදී. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා නව ප්‍රාථමික නිකුත් කිරීමේ ක්‍රමය යටතේ 2017 ජූලි මස සිට ශ්‍රී ලංකා මහ බැංකුව මාසික වෙන්දේසි ක්‍රමය ආරම්භ කළේය.

### 2.2.5 ස්ථාවර තැන්පතු

මුදල් මණ්ඩලයේ විශේෂ අනුමැතිය මත සේ.අ.අ. විසින් එහි අරමුදල් කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල මාස 6 ක උපරිම පරිනත කාලයකට යටත්ව රාජ්‍ය බැංකු තුනෙහි ආයෝජනය කරන ලදී. ඒ අනුව, 2018.12.31 දිනට මුළු ආයෝජන කළඹෙන් 1.5 ක ප්‍රතිශතයක් වන රුපියල් බිලියන 33.6 ක මුදලක් ස්ථාවර තැන්පතු ආයෝජන ලෙස පැවති අතර, රුපියල් මිලියන 5,359 ක ස්ථාවර තැන්පතු පොලී ආදායමක් 2018 වසර තුළ දී උපයා ගන්නා ලදී.

### 2.2.6 අරමුදලේ මුළු ආයෝජන ආදායම

අරමුදල විසින් 2018 වසරේ දී රුපියල් බිලියන 222.4 ක මුළු ආයෝජන ආදායමක් උපයා ගත් අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 163 ක පහළ යාමකි (සංඛ්‍යා සටහන 04) ක්‍රමක්ෂය ලාභ ඇතුළු පොලී ආදායම අරමුදලේ ප්‍රධානතම ආදායම වූ අතර, එය 2017 වසරේ වූ රුපියල් බිලියන 219.6 සිට 2018 වසරේ දී රුපියල් බිලියන 229.4 දක්වා සියයට 4.5 කින් වර්ධනය විය. තවද, 2018 වර්ෂය තුළ ප්‍රාග්ධන ලාභ සහ ලාභාංශ යන දෙකම ඇතුළත් වන කොටස් කළඹෙන් උපයන ලද උපලබ්ධි ආදායම 2017 වසරේ දී රුපියල් බිලියන 3.0 සිට 2018 වසරේ දී රුපියල් බිලියන 3.9 ක් දක්වා රුපියල් බිලියන 0.9 කින් ඉහළ ගිය අතර, කොටස් කළඹෙහි ශුද්ධ ආයෝජන රුපියල් බිලියන 1.4 කින් පමණක් ඉහළ ගොස් තිබේ.

කෙසේ වෙතත්, 2017 වසරේ දෙසැම්බර් 31 වන විට වාර්තා වූ රුපියල් මිලියන 43.7 හා සැසඳීමේ දී කොටස් කළඹෙහි වෙළෙඳපොළ අගය මත සටහන් කරන ලද පාඩුව 2018 වසරේ දෙසැම්බර් 31 වන විට රුපියල් බිලියන 10.9 ක් විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 39 යටතේ වෙළෙඳපොළ මත අගය කිරීමේ දී 2017 වසරේ දී ලාභයක් වාර්තා කළ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අංක 9 ට අනුගත වීමත් සමඟ 2018 වසරේ දී ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කරන ලදී.

**සංඛ්‍යා සටහන 4** **අරමුදලේ ආයෝජන ආදායම**

| ආදායම් මූලාශ්‍රය | වටිනාකම (රු.මිලියන) | |
|---|---|---|
| | 2017 | 2018 |
| පොලිය | 219,635 | 229,446 |
| ලාභාංශ | 2,994 | 3,888 |
| උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ) | - | 7 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) | 1,477 | (10,901) |
| මූල්‍ය ආයෝජන හානිකරණ | (1,502) | 1 |
| එකතුව | 222,604 | 222,441 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සිංහල

## 2.3 අරමුදලේ මෙහෙයුම් වියදම්

2017 වසරේ දී රුපියල් මිලියන 1,348.7 සිට 2018 වසරේ දී රුපියල් මිලියන 1,505.3 ක් දක්වා සියයට 11.6 කින් මෙහෙයුම් වියදම් ඉහළ යාමට වෙනත් වියදම්වල ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා ඇත. ඒ අනුව, දළ ආදායමින් ප්‍රතිශතයක් වශයෙන් මුළු මෙහෙයුම් වියදම 2017 වසරේ දී පැවති සියයට 0.61 ට සාපේක්ෂව 2018 වසරේ දී සියයට 0.68 දක්වා ඉහළ ගොස් ඇත. අරමුදල් කළමනාකරුවන් විසින් වෙළෙඳපොළ තුළ සියයට 1 සිට සියයට 2 දක්වා වූ කළමනාකරණ ගාස්තු අය කරන වාතාවරණයක් තුළ දළ ආදායමෙන් සියයට 1 කට වඩා අඩු මට්ටමක මෙහෙයුම් වියදම් පවත්වාගෙන යාම අරමුදල ලැබූ සුවිශේෂී ජයග්‍රහණකි (සංඛ්‍යා සටහන 5).

## 2.4 ආදායම් බදු වියදම

2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 35 වන වගන්තිය යටතේ සේ.අ.අ. විසින් ආදායම් බදු ලෙස සියයට 10 ක් ගෙවීමට බැඳී සිටී. 2018.04.01 දින සිට ක්‍රියාත්මක, 2017 අංක 24 දරන නව දේශීය ආදායම් බදු පනත හඳුන්වා දීමත් සමඟ අරමුදලේ ආදායම් බදු අනුපාතය සියයට 10 සිට සියයට 14 දක්වා ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදලේ ආදායම් බදු වියදම පෙර වසර හා සැසඳීමේදී රුපියල් බිලියන 12.0 කින් වැඩි විය. මීට අමතරව, පෙර පැවති ආදායම් බදු පනත යටතේ දළ ආදායමක් ලෙස හඳුනාගත් භාණ්ඩාගාර බැඳුම්කර පොලී මත සියයට 10 ක් වූ රඳවා ගැනීමේ බදු 2018.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පොළී අදායම් ලෙස හඳුනා ගැනීම අහෝසි කර ඇත. 2018 වසරේ දී, සේ.අ.අ. රුපියල් බිලියන 30.7 ක් ආදායම් බදු ලෙස ගෙවා ඇති අතර, එය 2017 වසරේ ගෙවූ රුපියල් බිලියන 18.9 ට සාපේක්ෂව සියයට 62.6 ක වර්ධනයකි.

## 2.5 සාමාජික ගිණුම් ශේෂ හා ගෙවූ පොලිය

2018 වසරේ දී සියළු සාමාජික ගිණුම් ශේෂයන් 2017 වසරට සාපේක්ෂව සියයට 11.6 ක අගයකින් වර්ධනය කරමින්, රුපියල් බිලියන 194.6 ක මුදලක් සාමාජිකයන් අතර පොලී ලෙස බෙදා දුන් අතර, සාමාජික ගිණුම් ශේෂ 2017 වසරේ පැවති රුපියල් බිලියන 2,020.8 ට සාපේක්ෂව 2018 වසරේ දී රුපියල් බිලියන 2,254.2 ක් දක්වා වර්ධනය විය. 2018 දෙසැම්බර් 31 දිනෙන්

**සංඛ්‍යා සටහන 5** — **අරමුදලේ මෙහෙයුම් වියදම්**

| අයිතමය | සේ.අ.අ. දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව | | | කම්කරු දෙපාර්තමේන්තුව | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 (රු. මිලියන) | 2018 (රු. මිලියන) | වෙනස (%) | 2017 (රු. මිලියන) | 2018 (රු. මිලියන) | වෙනස (%) | 2017 (රු. මිලියන) | 2018 (රු. මිලියන) | වෙනස (%) |
| සේවක වියදම් | 459 | 559 | 21.79 | 388 | 408 | 5.15 | 847 | 967 | 14.17 |
| පරිපාලන වියදම් | 296 | 284 | (4.05) | 158 | 186 | 17.72 | 454 | 470 | 3.52 |
| වෙනත් වියදම් | 37 | 59 | 59.46 | 10 | 9 | (10.0) | 47 | 68 | 44.68 |
| **එකතුව** | **792** | **902** | **13.89** | **556** | **603** | **8.45** | **1,348** | **1505** | **11.65** |
| මුළු වියදම්, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.36 | 0.40 | | 0.25 | 0.28 | | 0.61 | 0.68 | |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 14
**සාමාජික ගිණුම් ශේෂ සහ ගෙවූ පොලිය**




| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| සාමාජික ශේෂ (රුපියල් බිලියන) | 1445 | 1625 | 1811 | 2021 | 2254 |
| පොලී ගෙවීම (රුපියල් බිලියන) | 137 | 154 | 172 | 191 | 195 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

අවසන් වූ වසර සඳහා සේ.අ.අ. විසින් සියයට 9.5 ක පොලී අනුපාතයක් ප්‍රකාශ කරන ලදී.

## 2.6 විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් රැස්කිරීම

කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් තුළ වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් සේ.අ.අ. විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් ගෙවීමේ සහ අදාළ සාමාජික දත්ත වාර්තා සැපයීමේ පහසුකම් සහිත විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. මූලිකව, මෙම ක්‍රමය ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වූ අතර, සේ.අ.අ. (සංශෝධිත) පනත හරහා මේ සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදනයන් ස්ථාපිත කරන ලදී. එකී ප්‍රතිපාදනයන් අනුව, සේවකයින් පනහකට වැඩි සේවායෝජකයින් සඳහා සිය සේවක අර්ථසාධක දායක මුදල් වාර්තා විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සැපයීම අනිවාර්ය වේ. විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය තුළ පරිවර්තනීය වෙනසක් සිදු කරමින් 2011 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය මංගත ගෙවීම් ක්‍රමය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් එක්රැස් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. එමගින් සේවායෝජකයින් මෙම ක්‍රමය සමග සම්බන්ධවීමේ වර්ධනීය වෙනසක් සිදු වූ අතර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ද වඩාත් කාර්යක්ෂම විය. එමෙන්ම, සමස්ත ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ සහ නියාමනය කිරීමේ ක්‍රියාදාමයන් ද මේ සමග වඩාත් පහසු විය. 2016 වසරේ දී, විද්‍යුත් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය එහි විශිෂ්ට තාක්ෂණික ජයග්‍රහණයක් සනිටුහන් කරමින් නියෝජිත බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා මංගත සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මේ අනුව, 2018 වසරේ දී සේ.අ.අ. සමග සම්බන්ධ වූ වාණිජ බැංකු දෙකක් ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු අටක් නියෝජිත බැංකු ලෙස දැනට සේ.අ.අ. ගෙවීම් කරනු ලබන සිය ගනුදෙනුකරුවන් වෙත පහසුකම් සලසනු ලබයි. ඒ අතරින්, වාණිජ බැංකු හතරක් මංගත දත්ත සත්‍යාපනයක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය භාවිතයෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

මීට අමතරව, විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සහ ඒ තුළින් සේ.අ. අරමුදලෙහි සියලුම පාර්ශවකරුවන් හට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. ඒ අනුව, ආසන්න වශයෙන් සක්‍රිය සාමාජිකත්වයෙන් සියයට 81 ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 7,900 සිට 8,540 දක්වා 2018 වසර තුළ දී වැඩි වූ අතර, අදාළ ගෙවීම් මාසික සමස්ත දායක මුදලෙන් සියයට 88 ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි.

තවද, සේ.අ.අ. ගෙවීම සඳහා නව ගෙවුම් ක්‍රම හඳුන්වා දීමේ අරමුණින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා විද්‍යුත් දත්ත වාර්තා සැපයීමට හැකි වන සේ වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමටත්, අදාළ ගෙවීම් ලංකා ක්ලියර් ආයතනයෙහි විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFT) හා සම්බන්ධව ඇති ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා කිරීමටත් හැකිවන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

## 2.7 නිවාස ණය ඇපකර පහසුකම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා සමූපකාර ග්‍රාමීය බැංකුව යනා දී සහභාගීත්ව ණය දෙන ආයතන වලින්

සිංහල

**සංඛ්‍යා සටහන 6** සාමාජිකයන් වෙත ලබා දුන් නිවාස ණය ඇපකර පහසුකම

| වසර | නිකුත් කළ සහතිකපත් (ගණන) | සේ.අ.අ. මගින් සහතික කරන ලද ණය (රුපියල් මිලියන) | ණය නිකුත් කරන ආයතනවලට ගෙවූ මුදල (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |
| 2017 | 10,998 | 4,946 | 2,485 |
| 2018 | 10,036 | 4,974 | 2,759 |
| **එකතුව** | **64,732** | **28,844** | **12,701** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සාමාජිකයන්ට නිවාස ණයක් ලබා ගැනීමේ අරමුණින් 1988 වසරේ දී හඳුන්වා දුන් නිවාස ණය ඇපකර පහසුකම් ක්‍රමය 2018 වසරේ දී ද සුවිශේෂී සේවාවක් සිදු කරන ලදී. නිවාස ණය ඇපකර පහසුකම් ක්‍රමය යටතේ සේ.අ.අ. මගින් මෙම වසර තුළ දී රුපියල් බිලියන 5.0 ක් වූ නිවාස ණය සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාජික ශේෂ සහතික පත් 10,036 ක ප්‍රමාණයක් ණය ලබාදෙන ආයතන වෙත ලබා දෙන ලදී. තවද, 2017 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් බිලියන 2.8 කට ආසන්න මුදලක් 2018 වසරේ දී අදාළ සාමාජික ගිණුම්වලින් අඩු කොට අදාළ ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

## 2.8 පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන

සේ.අ.අ. (සංශෝධිත) පනත හා ඉන් පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් සම්මත වූ නියෝගවලට අනුව, සුදුසුකම්ලාභී සාමාජිකයන් හට තම ගිණුමේ ශේෂයෙන් සියයට 30 කට නොවැඩි ප්‍රතිලාභ නිදහස් කිරීමේ වැඩසටහන 2015 ජූලි මස සිට ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන්ගේ ඉහළ ඉල්ලුමක් ඇති අතර, මෙම යෝජනා ක්‍රමය ආරම්භයේ සිට 2018 වසර අවසන් වනවිට 130,000 කට අධික අර්ථලාභීන් පිරිසකට රුපියල් බිලියන 73.4 ක් ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලදී. 2018 දී මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 28,783 ක් සඳහා රුපියල් බිලියන 14.9 ක් නිකුත් කර ඇත.

## 2.9 ඡායාස්ථගත පිළිබිඹු ව්‍යාපෘතිය

කඩදාසි රහිත මෙහෙයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඡායාස්ථගත පිළිබිඹු ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතියෙහි පළමු අදියර සම්පූර්ණ කිරීමත් සමඟ, සේ.අ.අ. වාර්තා අංශයෙහි සාම්ප්‍රදායික ආකෘතිය විද්‍යුත් වාර්තා අංශයක් බවට පත් විය. සියලුම මූලික ගොනු වාර්තා, "ඩී" පෝරම සහ නැවත ලියාපදිංචි කිරීමේ ලේඛන ඡායා පිළිබිඹු ගත කර, සුචිගත කිරීමෙන් අනතුරුව දත්ත කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර ඇත. ලේඛන සොයා ගැනීම, ලිපි ගොනු යාවත්කාලීන කිරීම, සටහන් තැබීම සහ අනෙකුත් සම්බන්ධිත කාර්යයන් දෙපාර්තමේන්තුවෙහි පරිශීලකයන්ට ඔවුන්ගේ පරිගණකය තුළින් සිදු කිරීමේ හැකියාව ලබා දී ඇත. කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වය අවම කරමින් බොහෝ මානව ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය වී ඇති අතර,

මෙම පරිවර්තනයෙහි ප්‍රතිඵලයක් ලෙස කාලය, අවකාශ සහ මානව සම්පත් සැලකිය යුතු ලෙස ඉතුරු කරමින් දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් වඩාත් කාර්යක්ෂම වී ඇත.

පළමු අදියර තුළින් ලබාගත් ක්‍රියාවලි කාර්යක්ෂමතාවන් මත පදනම්ව නිතර භාවිත වන වාර්තා ඩිජිටල්කරණය කිරීම සඳහා වන ව්‍යාපෘතියෙහි දෙවන අදියර 2016 වර්ෂය අගදී ආරම්භ කරන ලදී. 2013, 2014 සහ 2015 වර්ෂවලට අදාළව සේවා ආයතනවලින් සේ.අ.අ. දායක මුදල් රැස් කිරීමට යොදා ගන්නා ලද ''සී/සී3'' වාර්තා, 2002 සිට 2015 වර්ෂය දක්වා ප්‍රතිලාභ ගෙවීම්වලට අදාළ වැඩ වාර්තා (2013 වර්ෂය හැර), 1974 සිට 2015 වර්ෂය දක්වා කේවල සේවා ලෙජර (2013 වර්ෂය හැර), 2010 වර්ෂයේ සිට සේ.අ.අ. ගිණුම්වලට අදාළ සංශෝධනයන් සම්බන්ධ ලිපි සහ 2014 වර්ෂයට අයත් නැවත ලියාපදිංචි කිරීම්වලට අදාළ ලේඛන, වාර්තා ඩිජිටල්කරණය ව්‍යාපෘතියේ දෙවන අදියරට ඇතුළත් වේ. 2016 සහ 2017 වර්ෂවලට අයත් ''සී/සී3'' වාර්තාවල ඡායාස්ථගත පිළිබිඹු ලබා ගැනීම සහ සුචිගත කිරීම ඇතුළත් වීම තුළින් 2017 වර්ෂය අග වනවිට ව්‍යාපෘතියේ දෙවන අදියර විෂයපථය දීර්ඝ කරන ලදී.

2001 වර්ෂයේ සිට ප්‍රතිලාභ ගෙවීම්වලට අදාළ වැඩ වාර්තාවලට සම්බන්ධ සියලු ලිපි ලේඛනවල ඡායාස්ථගත පිළිබිඹු දත්ත කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර තිබීම නිසා ප්‍රතිලාභ ගෙවීම් සහ නොගෙවූ ශේෂ ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලීන් මේ වනවිට කාර්යක්ෂම වී තිබේ. එමෙන්ම නාම සංශෝධන සහ නැවත ලියාපදිංචි කරන ලද සාමාජික තොරතුරු සංශෝධන ද කාර්යක්ෂම වී තිබේ.

ලිපි ලේඛන ලැබෙන අවස්ථාවේදීම ඩිජිටල්කරණය කිරීම අරමුණු කර ගනිමින් එම ලේඛන ඡායාස්ථගත පිළිබිඹු බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට මෙම දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරමින් පවතී.

## 2.10 ජංගම සේවා වැඩසටහන්

සේ.අ.අ. සාමාජිකයන් හට වඩාත් පහසු වන අයුරින් සේවා සැපයීම සහ ඔවුන්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාව තුළ ඇති සේ.අ.අ. සම්බන්ධ දැනුම වඩ වඩාත් දියුණු කිරීමේ අරමුණින් 2018 වසර තුළ දී සේ.අඅ. ජංගම සේවා පවත්වන ලදී.

කොළඹ පිහිටි සේ.අ.අ. කාර්යාලයට පැමිණීමෙන් සාමාජිකයෙකු හට ලබා ගත හැකි සේවාවන් සියල්ලක්ම පාහේ තම ප්‍රදේශයේ දී හෝ තම සේවා ස්ථානයේ දී ලබා ගැනීමේ පහසුකම මෙම ජංගම සේවා වැඩසටහන් මගින් සලසා ඇත.

ප්‍රධාන වශයෙන් සාමාජික ගිණුමේ ශේෂ පත්‍ර ලබා දීම, සේ.අ.අ. සාමාජික තොරතුරු සංශෝධනය කිරීම, සේ.අ.අ. ගිණුම් සංශෝධන සිදු කිරීම, සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ පහසුකම, කෙටි පණිවුඩ හා අන්තර්ජාලය මගින් සේ.අ.අ. සාමාජික ගිණුම් තොරතුරු පිරික්සීමේ සේවාව ප්‍රවර්ධනය කිරීම, විද්‍යුත් දායක මුදල් සම්බන්ධ සේවාවන් පිළිබඳ සේවා ආයතන දැනුවත් කිරීම, සේ.අ.අ. සම්බන්ධ අනෙකුත් උපදෙස් ලබා දීම යන සේවාවන් මෙම ජංගම සේවා වැඩසටහන් තුළින් සේ.අ.අ. සාමාජිකයින් හට ලබා දෙන ලදී.

එලෙස, 2018 වසර තුළ දී සේ.අ.අ. ජංගම සේවාවන් 20 ක් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 3 ක් පවත්වන ලද අතර, ඒවායින් කිහිපයක් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව හා අදාළ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් හා සහයෝග යෙන් පවත්වන ලදී.

විවිධ රාජ්‍ය ආයතන, අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් සංවිධානය කරන ලද ජංගම සේවා වැඩසටහන් සඳහා සහභාගී වන පුද්ගලයන්ට සේ.අ.අ. සම්බන්ධ සේවාවන් ලබා දීම සහ දැනුම්වත් කිරීම සඳහා එම ආයතන

සහ සංවිධානවල ආරාධනයෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහභාගි වී ඇත.

එමෙන්ම, සහභාගී වන පුද්ගලයන්ට සේ.අ.අ. සම්බන්ධ සේවාවන් ලබා දීම සහ ඔවුන් දැනුම්වත් කිරීම සඳහා විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වන ලද විශාල ලෙස මහජනතාව රැස් වූ වැඩසටහන් සහ ප්‍රදර්ශන සඳහා ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහභාගි විය. "INFOTEL2018" ප්‍රදර්ශනයෙහි "Best Digital Government Solution in Digital Government Pavilion" සම්මානය සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් හිමි කර ගන්නා ලදී.

ඉහත ජංගම සේවා වැඩසටහන්වලට සමගාමීව සේව්‍යයන්, සේවකයින් හා අනෙකුත් පාර්ශ්වයන් දැනුම්වත් කිරීමේ වැඩ පිළිවෙලක් විද්‍යුත් ලිපි, පෝස්ටර්, අත් පත්‍රිකා, වීඩියෝපට හා දේශන මගින් පවත්වන ලදී.

තවද, ජංගම සේවාව පිළිබඳව හා එහි ඵලදායීතාව වැඩි දියුණු කර ගැනීමට සිදු කළ යුතු පෙර සූදානම් කටයුතු පිළිබඳව ජංගම සේවාවට සෘජුවම සම්බන්ධ වන පාර්ශවයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද ජංගම සේවාවට පෙර පවත්වන ලදී.

## 2.11 නීතිය බලගැන්වීම

සේ.අ.අ. පනතට අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට අරමුදලේ සාමාන්‍ය පරිපාලනයේ වගකීම හා නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, 2018 වසරේ දී දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කාර්යාල විසින් නව සේවායෝජකයන් 9,243 දෙනෙක් හා නව සේවානියුක්තිකයන් 37,662 දෙනෙක්, සියලු පළාත් ආවරණය කරමින්, ලියාපදිංචි කර ඇත. 2018 වසරේ ලියාපදිංචි වූ සේවායෝජකයන්ගෙ

**සංඛ්‍යා සටහන 7** නීතිය බලගැන්වීම

| විස්තරය | | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| නව ලියාපදිංචි කිරීම් | සේවායෝජකයන් | 7,213 | 6,736 | 7,134 | 7,710 | 9,243 |
| | සේවානියුක්තිකයන් | 296,056 | 48,007 | 34,264 | 280,079 | 37,662 |
| පළාත් අනුව සේවායෝජකයන් ලියාපදිංචි කිරීම (ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන්ගේ ප්‍රතිශතයක් ලෙස) | බස්නාහිර | 65 | 50 | 50 | 50 | 43 |
| | උතුරු සහ නැගෙනහිර | 03 | 07 | 06.5 | 06.3 | 15 |
| | අනෙකුත් | 32 | 43 | 43.5 | 43.7 | 42 |
| මුල් නිවේදනය | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 12,132 | 9,015 | 10,074 | 10,888 | 13,653 |
| | පියවාගත් මුදල (රු.මි.) | 6,280 | 4,018 | 4,464 | 5,876 | 4,316 |
| රතු නිවේදනය | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 13,578 | 5,670 | 6,508 | 6,613 | 8,364 |
| | පියවාගත් මුදල (රු.මි.) | 1,121 | 2,864 | 3,454 | 3,775 | 3,320 |
| නඩු පැවරීම | නඩු සංඛ්‍යාව | 3,397 | 6,458 | 2,622 | 3,019 | 2,831 |
| | අයකරගත් මුදල (රු.මි.) | 6,126 | 1,308 | 855 | 1,093 | 1,710 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් අංශය, කම්කරු දෙපාර්තමේන්තුව

න් සියයට 43 ක සේවායෝජකයන් පිරිසක් බස්නාහිර පළාතට අයත් වූ අතර උතුර, දකුණ, මධ්‍යම හා වයඹ පළාත්වලින් ලියාපදිංචි වූ මුළු සේවායෝජකයින් ගණන සියයට 38 ක් විය. අනිකුත් සේවායෝජක ලියාපදිංචිවීම් සිදුවූයේ උතුරු මැද, ඌව, නැගෙනහිර සහ සබරගමුව යන පළාත්වලිනි. වර්ෂය තුළ සිදු වූ සාමාජිකයින්ගේ ලියාපදිංචිවීම් සලකා බලන විට සියයට 38 ක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතෙනි.

පනතේ විධිවිධානවලට අනුකූලව, සේවක දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබා දී ඇත. ඒ අනුව, දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල විසින් පිළිවෙලින් රුපියල් බිලියන 4.3 ක් හා රුපියල් බිලියන 3.3 ක් පියවා ගැනීම සඳහා මුල් නිවේදන 13,653 ක් ද, රතු නිවේදන 8,364 ක් ද නිකුත් කර ඇත. තවද, ගෙවීම් පැහැර හරින ලද ආයතනවලින් රතු නිවේදන ලබා දින 28 ක් ඇතුළත හිඟ මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වූ ආයතන 2,831 කට එරෙහිව සිදු කළ නඩු පැවරීම තුළින් රුපියල් බිලියන 1.7 ක් අයකර ගෙන ඇත.

## 2.12 සේ.අ. අරමුදලේ අවදානම් කළමනාකරණය සඳහා වන පාලන රාමුව

මුදල් මණ්ඩලය යනු සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වල අවසාන තීරණ ගැනීමේ අධිකාරියයි. එමගින් සේ.අ. අරමුදලේ ආයෝජන කටයුතු සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් සපයන අතර, අරමුදල විසින් කළමනාකරණය කළ යුතු අරමුදල සඳහා වන අවදානම් අභිරුචිය සහ අවදානම් තිතික්ෂණ මට්ටම් වැනි සමස්ත අවදානම් ප්‍රමිතීන් නියම කරයි. තවද, සේ.අ.අ. හි අවදානම් කළමනාකරණයේ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් සේ.අ.අ අරමුදල් කළමනාකරණ කටයුතුවලට අදාළ සිය බලතල හා රාජකාරි ඉහළ මට්ටමේ කමිටුවන මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවට සහ සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුවට පවරා ඇත.

අවදානම් කළමනාකරණ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීමේ වගකීම මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව සතු වන අතර, අරමුදල් කළමනාකරණ කටයුතුවලට අදාළ ඉහළම මට්ටමේ අධීක්ෂණ අධිකාරියක් සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව සපයයි. සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව හි කාර්යභාරය වන්නේ අරමුදල කළමනාකරණය සඳහා උපායමාර්ගික හා ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් ලබා දීමෙන් සේ.අ.අ. හි ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීමයි. තවද, සේ.අ.අ. අරමුදල් කළමනාකරණ කටයුතුවල එදිනෙදා තීරණ ගැනීමේ කාර්යයට අදාළ බලතල දෙපාර්තමේන්තු මට්ටමේ කමිටුවක් වන සේ.අ.අ. ආයෝජන කමිටුව වෙත පවරා ඇත. එසේම, සමස්ත සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වලට අදාළ මූල්‍යමය නොවන අවදානම් යොමු කිරීම සහ ආමන්ත්‍රණය සඳහා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් වෙනමම යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ.

ඒ අනුව, සේ.අ.අ. ක්‍රියාකාරකම්වල අවදානම් පාලන රාමුව සමන්විත වන්නේ පහත දැක්වෙන ආරක්ෂක විධි විධාන තුනකින්ය. 'පළමු පෙළ ආරක්ෂක මාර්ගය' ලෙස සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මැද කාර්යාලය අරමුදල් කළමනාකරණ කටයුතුවලට අදාළ මූල්‍ය නොවන අවදානම් හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම, ඇගයීම, අධීක්ෂණය, සමාලෝචනය සහ ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම සිදු කරනු ලබයි. 'දෙවන පෙළ ආරක්ෂක මාර්ගය' ලෙස ප්‍රතිපත්ති රාමුව සැපයීම සඳහා වගකිය යුතු අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, එනම් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ ආයෝජන මාර්ගෝපදේශ සැකසීම, සේ.අ.අ. හි අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් ස්වාධීනව තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සිදු කරනු

සිංහල

ලබයි. 'තෙවන පෙළ ආරක්ෂක මාර්ගය' ලෙස අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව තම ක්‍රියාවලිය තුළ දී අවදානම් සහතිකයන් සපයනු ලබයි.

සේ.අ. අරමුදලේ ආයෝජන කටයුතුවල වගකීම සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින්, එහි සමස්ත අවදානම් කළමනාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා 2018 වර්ෂය තුළදී පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, සේ.අ.අ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුව යටතට ගෙන එන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව 'දෙවන පෙළ ආරක්ෂක මාර්ගය' ලෙස සේ.අ.අ. හි අවදානම් කළමනාකරණ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කරයි. තවද, මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, 2018 දී මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ නිර්දේශය ඇතිව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නව ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සහ ආයෝජන මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී. මෙම මාර්ගෝපදේශවල පරමාර්ථය වනුයේ, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයන් හි දක්වා ඇති පරිදි අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සේ.අ.අරමුදලට අදාළ ආයෝජන ක්‍රියාකාරකම්වල තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා ශක්තිමත් කිරීමයි. ඒ අනුව, අරමුදල් කළමනාකරණ කටයුතු සඳහා වන නීති රීති සහ ක්‍රියාපටිපාටි ආයෝජන මාර්ගෝපදේශ විසින් දක්වා ඇත. තවද, එහි අවදානම අවම කිරීම සඳහා අරමුදල කළමනාකරණය කළ යුතු සීමාවන් සහ පාලන රාමුව ද ඇතුළත් වේ. ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව, සේ.අ.අ. අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා එක් එක් පාර්ශවයන්ගේ කාර්යභාරය පැහැදිලිව හඳුනාගෙන ඇති අතර, එමගින් එහි අරමුණු සාර්ථකව සාක්ෂාත් කර ගැනීම සහතික කෙරේ.



'ඇ' කොටස

# මූල්‍ය ප්‍රකාශන

# සේවක අර්ථසාධක අරමුදල
## ආදායම් හා වියදම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2018 | | | 2017 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පොලී ආදායම් | 5 | 229,446,025 | - | 229,446,025 | 219,635,331 |
| ලාභාංශ ආදායම් | 6 | 3,887,578 | - | 3,887,578 | 2,993,591 |
| මූල්‍ය වත්කම් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ | 7 | 7,216 | - | 7,216 | 5 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභය | 8 | (10,901,286) | - | (10,901,286) | 1,476,850 |
| මූල්‍ය වත්කම් හානිකරණය | 9 | 585 | - | 585 | (1,502,111) |
| **ආයෝජන ආදායම්** | | 222,440,118 | - | 222,440,118 | 222,603,666 |
| වෙනත් ආදායම් | 10 | 389,944 | 13,035 | 402,979 | 588,818 |
| **දළ ආදායම** | | 222,830,062 | 13,035 | 222,843,097 | 223,192,484 |
| මෙහෙයුම් වියදම් | 11 | (901,826) | (603,511) | (1,505,337) | (1,348,672) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | | 221,928,236 | (590,476) | 221,337,760 | 221,843,812 |
| ආදායම් බදු වියදම් | 12 | (30,720,357) | - | (30,720,357) | (18,897,051) |
| **වර්ෂයේ මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 191,207,879 | (590,476) | 190,617,403 | 202,946,761 |
| **ඉදිරියට ගෙන එන ලද රඳවා ගත් ලාභ** | | | | 268,002 | 189,341 |
| ආරම්භක ශේෂ ගැළපීම (සටහන 28.6) | | | | 2,202,948 | - |
| ගළපන ලද ආරම්භක රඳවාගත් ලාභ | | | | 2,470,950 | 189,341 |
| **බෙදාහැරීම සඳහා ඇති ලාභය** | | | | 193,088,353 | 203,136,102 |
| **ලාභ බෙදාහැරීම**<br>අඩු කළා : වර්ෂය තුළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී | | | | (4,296,117) | (4,624,262) |
| එකතු/(අඩු) කළා : ලාභ සම කිරීමේ සංචිත අරමුදලෙන්/(අරමුදලට) මාරු කිරීම | | | | 6,000,000 | (7,000,000) |
| 2018.12.31 දිනට සාමාජික ශේෂ මත පොලිය - 9.50% (2017 - 10.50%) | | | | (194,632,761) | (191,243,838) |
| **ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙනයන ලද ශේෂය** | | | | 159,475 | 268,002 |

පිටු අංක 50 සිට 120 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

............................................................
(අත්සන් කළේ)
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

..................
(අත්සන් කළේ)
කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2019 පෙබරවාරි 21

# සේවක අර්ථසාධක අරමුදල
# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2018<br>රු.000 | 2017<br>රු.000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | | 190,617,403 | 202,946,761 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම මත ශුද්ධ ලාභය/(අලාභය) | 13 | - | 6,033,647 |
| **කාලපරිච්ඡේදය සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම** | | 190,617,403 | 208,980,408 |

පිටු අංක 50 සිට 120 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

(අත්සන් කළේ)
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

(අත්සන් කළේ)
කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2019 පෙබරවාරි 21

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2018 රු.000 | 2017 රු.000 |
|---|---|---|---|
| වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 14 | 286,150 | 298,672 |
| අස්පෘශ්‍ය වත්කම් | 15 | 4,220 | 1,137 |
| ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | 16 | 9,914,892 | - |
| ස්කන්ධ සාධන පත්‍ර - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | 17 | 64,937,663 | - |
| ක්‍රමක්ෂය පිරිවැයට ණය සාධන පත්‍ර | 18 | 2,223,978,499 | - |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | 19 | - | 15,699,351 |
| මූල්‍ය වත්කම් - විකිණීමට ඇති | 20 | - | 138,947,786 |
| මූල්‍ය වත්කම් - කල්පිරීම තෙක් තබාගත් | 21 | - | 1,789,725,122 |
| මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ | 22 | - | 48,000,000 |
| තොගය | | 10,020 | 11,928 |
| ලැබිය යුතු පොලී | | 783,109 | 59,674,181 |
| ලැබිය යුතු දායක මුදල් | | 12,574,614 | 11,653,125 |
| වෙනත් ජංගම වත්කම් | 23 | 1,057,336 | 1,250,540 |
| මුදල් හා මුදල් සමාන දෑ | 24 | 3,419,043 | 3,273,943 |
| | | 2,316,965,546 | 2,068,535,786 |
| වගකීම් | | | |
| ගෙවිය යුතු ගිණුම් | 25 | 3,677 | 1,411 |
| උපචිත වියදම් | | 249,485 | 149,016 |
| වෙනත් ජංගම වගකීම් | 26 | 27,351,459 | 2,085,939 |
| | | 27,604,621 | 2,236,367 |
| මුළු ශුද්ධ වත්කම් | | 2,289,360,925 | 2,066,299,419 |
| නියෝජනය කරනු ලබන්නේ, | | | |
| සාමාජික ශේෂ | 27 | 2,254,194,450 | 2,020,782,471 |
| සංචිත | 28 | 35,007,000 | 45,248,946 |
| රඳවාගත් ලාභ | | 159,475 | 268,002 |
| | | 35,166,475 | 45,516,948 |
| අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම | | 2,289,360,925 | 2,066,299,419 |

පිටු අංක 50 සිට 120 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

(අත්සන් කළේ)
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

(අත්සන් කළේ)
කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2019 පෙබරවාරි 21

# සේවක අර්ථසාධක අරමුදල
# ලැබීම් හා ගෙවීම් ගිණුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2018 | | | 2017 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වසරේ ආරම්භක මුදල් ශේෂය | | 3,273,943 | 57,694 | 3,331,637 | 4,452,756 |
| මුළු ලැබීම් | 29 | 352,463,484 | 624,664 | 353,088,148 | 310,809,409 |
| මුළු ගෙවීම් | 30 | (352,318,349) | (605,102) | (352,923,451) | (311,930,528) |
| වසර අවසාන මුදල් ශේෂය | | 3,419,078 | 77,256 | 3,496,334 | 3,331,637 |

පිටු අංක 50 සිට 120 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

(අත්සන් කළේ)
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

(අත්සන් කළේ)
කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2019 පෙබරවාරි 21

# සේවක අර්ථසාධක අරමුදල
## ආයෝජන ප්‍රකාශනය

| ආයෝජන කාණ්ඩය | සටහන | මුහුණත අගය රු.000 | පිරිවැය රු.000 | සාධාරණ අගය රු.000 | ක්‍රමක්ෂය අගය රු.000 | පොත් අගය රු.000 |
|---|---|---|---|---|---|---|
| **2018 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 18.1.1 | 2,110,854,987 | 1,970,722,277 | 2,017,224,894 | 2,084,497,740 | 2,084,497,740 |
| භාණ්ඩාගාර බිල්පත් | 18.1.2 | 36,321,220 | 33,398,583 | 34,413,982 | 34,733,240 | 34,733,240 |
| සාංගමික ණයකර | 18.2/18.6 | 42,962,299 | 42,962,502 | 41,989,973 | 43,658,095 | 43,654,523 |
| භාරකාර සහතිකපත් | 18.3 | 1,230,857 | 831,235 | 1,132,594 | 1,132,594 | 1,132,558 |
| ප්‍රති විකුණුම් | 18.4 | 26,325,000 | 26,325,000 | 26,350,903 | 26,350,903 | 26,350,903 |
| ස්ථාවර තැන්පතු | 18.5 | 32,500,000 | 32,500,000 | 33,609,718 | 33,609,718 | 33,609,534 |
| ලැයිස්තුගත කොටස් | 17 | - | 80,467,243 | 64,937,663 | 80,467,243 | 64,937,663 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 16 | - | 10,414,892 | 9,914,892 | 10,414,892 | 9,914,892 |
| | | 2,250,194,363 | 2,197,621,733 | 2,229,574,618 | 2,314,864,426 | 2,298,831,054 |
| **2017 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 19,20,21 | 1,855,665,266 | 1,692,832,248 | 1,851,789,868 | 1,748,768,953 | 1,748,785,406 |
| භාණ්ඩාගාර බිල්පත් | 20,21 | 74,475,428 | 68,295,753 | 69,832,608 | 69,746,857 | 69,783,696 |
| සාංගමික ණයකර | 19,20,21 | 38,850,712 | 38,850,915 | 35,975,818 | 38,850,790 | 38,744,349 |
| භාරකාර සහතිකපත් | 21 | 3,046,772 | 2,225,489 | 2,746,076 | 2,746,075 | 2,746,076 |
| ලැයිස්තුගත කොටස් | 19,20 | - | 78,670,401 | 74,042,107 | 78,670,401 | 74,042,107 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 20 | - | 10,770,625 | 10,270,625 | 10,770,625 | 10,270,625 |
| ස්ථාවර තැන්පතු | 22 | 48,000,000 | 48,000,000 | 48,000,000 | 48,000,000 | 48,000,000 |
| | | 2,020,038,178 | 1,939,645,432 | 2,092,657,102 | 1,997,553,701 | 1,992,372,259 |

නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 09 - මූල්‍ය උපකරණහි අවශ්‍යතා අනුව මූල්‍ය වත්කම් වර්ගීකරණය 2018.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කරන ලදී. ඒ අනුව, SLFRS 09 හි විධි විධාන අනුව සේවක අර්ථ සාධක අරමුදල විසින් මූල්‍ය වත්කම් ගිණුම්ගත කර ඇති අතර, විස්තරාත්මක තොරතුරු සැසඳුමක් සටහන 34 හි දක්වා ඇත.

පිටු අංක 50 සිට 120 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

.............................................
(අත්සන් කළේ)
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

.............................................
(අත්සන් කළේ)
කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2019 පෙබරවාරි 21

# සේවක අර්ථසාධක අරමුදල
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2018<br>රු.000 | 2017<br>රු.000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | |
| ආයෝජන මගින් ලද පොලී | 198,799,665 | 172,452,670 |
| කොටස්වලින් ලද ලාභාංශ | 3,045,185 | 3,570,306 |
| අධිභාර සහ වෙනත් ආදායම් | 402,031 | 587,559 |
| ලැබිය යුතු දෑ වලින් අයකර ගැනීම් | 4,897,839 | 52,523 |
| මෙහෙයුම් වියදම් සඳහා ගෙවීම් | (1,197,440) | (1,131,957) |
| අත්තිකාරම් ගෙවීම් | (3,220) | (6,819) |
| සැපයුම්කරුවන්ට සහ අනෙකුත් ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම් | (4,226,687) | (2,659,197) |
| **මෙහෙයුම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **201,717,372** | **172,865,085** |
| | | |
| බදු ගෙවීම් | (5,437,603) | (10,214,556) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්** | **196,279,770** | **162,650,529** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | (1,039,650,828) | (586,459,418) |
| ආයෝජන කල්පිරීම් | 805,119,460 | 406,955,384 |
| දේපළ පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (39,606) | (64,314) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | **(234,570,974)** | **(179,568,348)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල්** | | |
| ලද දායක මුදල් | 144,996,456 | 133,353,013 |
| පොදු තැන්පතු ගිණුම - කම්කරු දෙපාර්තමේන්තුව | 14,301 | (12,292) |
| සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම් | (106,497,162) | (117,476,507) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **38,513,595** | **15,864,214** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්** | 222,391 | (1,053,605) |
| | | |
| වර්ෂය ආරම්භක දිනට මුදල් හා මුදල් සමාන දෑ | 3,273,943 | 4,385,242 |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ - ගැළපුම් වලට පෙර** | **3,496,334** | **3,331,637** |
| ගැළපීම් : | | |
| කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ෂ අවසාන මුදල් ශේෂය | (77,256) | (57,694) |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)** | **3,419,078** | **3,273,943** |
| | | |
| **සටහන අ** | | |
| දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය | | |
| අතැති මුදල් | 20 | 20 |
| බැංකුවේ ඇති මුදල් | 3,419,058 | 3,273,923 |
| | **3,419,078** | **3,273,943** |
| (-) හානිකරණ සඳහා වෙන්කිරීම් | (35) | - |
| | **3,419,043** | **3,273,943** |

## සේවක අර්ථසාධක අරමුදල
## හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයන්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සාමාජික ශේෂය<br>රු.000 | තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල ගොඩනැගිලි සංචිත අරමුදල<br>රු.000 | ලාභ සම කිරීමේ සංචිත අරමුදල<br>රු.000 | පොදු සංචිත අරමුදල<br>රු.000 | ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත<br>රු.000 | රඳවාගත් ලාභ<br>රු.000 | එකතුව<br>රු.000 |
|---|---|---|---|---|---|---|---|
| 2016.12.31 දිනට ශේෂය | 1,810,594,518 | 3,157,000 | 23,850,000 | 6,650,000 | (3,293,812) | 189,341 | 1,841,497,047 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම | - | - | - | - | 7,535,758 | - | 7,535,758 |
| 2017 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | 202,946,761 | 202,946,761 |
| 2017 වසරේ ශුද්ධ දායක මුදල් | 18,944,115 | - | - | - | - | - | 18,944,115 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2017 | - | - | - | - | - | (4,624,262) | (4,624,262) |
| ගෙවිය යුතු සාමාජික පොලී (2017 : 10.50%) | 191,243,838 | - | - | - | - | (191,243,838) | - |
| ලාභසම කිරීමේ සංචිතයෙන් මාරු කිරීම් | - | - | 7,000,000 | - | - | (7,000,000) | - |
| **2017.12.31 දිනට ශේෂය** | **2,020,782,471** | **3,157,000** | **30,850,000** | **6,650,000** | **4,241,946** | **268,002** | **2,066,299,419** |
| SLFRS 09 අනුගත වීමේ සිදුවන බලපෑම (34.2) | - | - | - | - | (4,241,946) | 2,206,626 | (2,035,320) |
| SLFRS 09 යටතේ ගලපන ලද ආරම්භක ශේෂ | **2,020,782,471** | **3,157,000** | **30,850,000** | **6,650,000** | **-** | **2,474,628** | **2,064,264,098** |
| රඳවා ගත් ලාභයට ආරම්භක ශේෂ ගැළපීම - කම්කරු දෙපාර්තමේන්තුව. | - | - | - | - | - | (3,678) | (3,678) |
| ගලපන ලද ආරම්භක ශේෂ | **2,020,782,471** | **3,157,000** | **30,850,000** | **6,650,000** | **-** | **2,470,950** | **2,064,260,420** |
| 2018 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | 190,617,403 | 190,617,403 |
| 2018 වසරේ ශුද්ධ දායක මුදල් | 38,779,219 | - | - | - | - | | 38,779,219 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2018 | - | - | - | - | - | (4,296,117) | (4,296,117) |
| ගෙවිය යුතු සාමාජික පොලී (2018 : 9.50%) | 194,632,761 | - | - | - | - | (194,632,761) | - |
| ලාභ සම කිරීමේ සංචිතයට මාරු කිරීම | - | - | (6,000,000) | - | - | 6,000,000 | - |
| 2018.12.31 දිනට ශේෂය | **2,254,194,450** | **3,157,000** | **24,850,000** | **6,650,000** | **-** | **159,475** | **2,289,360,925** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

සේවක අර්ථසාධක අරමුදල (''සේ.අ.අ.'' හෝ ''අරමුදල'') යනු 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ඇති කරන ලද අනිවාර්ය දායකත්ව විශ්‍රාම වැඩසටහනකි. අරමුදලේ පොදු පරිපාලක ලෙස කම්කරු කොමසාරිස්වරයා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, යුතුකම් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ. පනත මගින් මුදල් මණ්ඩලයට පවරා ඇති බලතල, යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පහසුකම් සපයනු ලබයි.

## 2. ගිණුම්කරණ පදනම

### 2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සහ 1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇත.

1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ 5 (1) (ඌ) සහ (ඒ) වගන්ති යටතේ, මුදල් මණ්ඩලය විසින් අරමුදලට අදාළ පොදු ගිණුම් පවත්වාගෙන යාම සහ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කළ යුතු වේ.

- අ) ආදායම් හා වියදම් ප්‍රකාශනය,
- ආ) වත්කම් හා වගකීම් ප්‍රකාශනය,
- ඇ) ලැබීම් හා ගෙවීම් ප්‍රකාශනය හා
- ඇ) එක් එක් ආයෝජනයේ මුහුණත වටිනාකම, මිලදී ගත් පිරිවැය හා වෙළෙඳපොළ වටිනාකම දක්වමින් ආයෝජන ප්‍රකාශනය

### 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ ප්‍රතිපාදන වලට අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ.

### 2.3 මුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුමැතිය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2019 පෙබරවාරි 21 වන දින මුදල් මණ්ඩලය විසින් බලය පවරන ලදී.

**2.4 පිළියෙල කිරීමේ පදනම**

පහත සඳහන් විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් හඳුනාගත් සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

**2.5 කෘත්‍යයාත්මක හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල**

අරමුදලේ කෘත්‍යයාත්මක හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් අරමුදලේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

**2.6 ප්‍රමාණාත්මකභාවය, හිලව් කිරීම සහ වැටයීම භාවිතය**

ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක සමූහය මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අයිතම හැර වෙනස් ස්වරූප අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

හිලව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය වන හෝ අවසර ලබා දෙන විට හැර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

වැටයීම

වෙනත් විදියකින් සඳහන් කර නොමැති විට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් ආසන්නතම රුපියල් දහස් වලට වටයා ඇත.

**2.7 විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය**

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම්, වියදම් අගයන් සහ අසම්භාව්‍ය වගකීම් වලට අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන මුදල් මණ්ඩලය විසින් සිදු කර ඇත. එම විනිශ්චයන් සහ ඇස්තමේන්තු අතීත අත්දැකීම් සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි පිළිගත හැකි අපේක්ෂාවන් ද ඇතුළුව අනෙකුත් සාධක මත පදනම් වේ. මේ නිසා සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, විනිශ්චයන් හා ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා බලපවත්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද පහත සඳහන් වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරීත්වය විසින් සලකා බලන ලදී.

**අඛණ්ඩ පැවැත්ම**

කළමනාකාරීත්වය විසින් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කරන ලද තක්සේරු කිරීමක දී නුදුරු අනාගතයක් සඳහා අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නියැලීමට අරමුදල සතුව සම්පත් පවතින බවට තහවුරු විය. එම නිසා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කරනු ලැබේ.

මීට අමතරව පහත සඳහන් අනාවරණයන් සඳහා විශේෂිත ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගන්නා ලදී.

- මූල්‍ය සාධන පත්‍ර අගය කිරීම
- වත්කම් හානිකරණය
- දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම
- වගකීම් සඳහා වෙන්කිරීම

### 2.8 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී වාර්තා කරන දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා ඇත. හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන්කිරීම් හා අදාළ අනාවරණයන් සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 ආදායම් හා වියදම් හඳුනාගැනීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒම භව්‍ය වන විට හා එම ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස මැනීමට හැකි වන විට අයභාරය හඳුනා ගැනේ. ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ නිශ්චිත ආදායම් අයිතමයක ඉපයීම සහ දරන ලද පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය මත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය විසින් අරමුදල කළමනාකරණය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අරමුදලෙහි වියදම ලෙස අය කරනු ලබයි.

#### 3.1.1. පොලී ආදායම

ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ, සියලුම පොලී දරන මූල්‍ය සාධන පත්‍ර සඳහා පොලී ආදායම උපචිත පදනම යටතේ සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් හඳුනා ගනු ලැබේ. පොලී ආදායම තුළ පොලී අනුපාතික ආදායම් හා මූල්‍ය උපකරණයන්හි වට්ටම් හෝ අධි මිල මත ක්‍රමක්ෂය වන ලාභ හෝ අලාභ ඇතුළත්ය.

#### 3.1.2. ලාභාංශ

අරමුදලට ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත. ලාභාංශ ආදායම ඉදිරිපත් කර ඇත්තේ නැවත අයකරගත නොහැකි රඳවාගත් බදු රහිතවය.

### 3.1.3. වෙළෙඳාම සඳහා තබාගෙන ඇති ආයෝජන විකිණීම මත ලාභ ලැයිස්තුගත කොටස් විකිණීම තුළින් උපලබ්ධි වූ වෙළෙඳ ලාභ

වෙළෙඳාම සඳහා තබාගෙන ඇති ලාභ අලාභ තුළින් සාධාරණ අගයට ඇති ආයෝජන විකිණීමෙන් ලද ලාභ තුළ අන්තර්ගත වන අතර, ඒවා ආදායම් හා වියදම් ප්‍රකාශනයේ සෘජු ආදායම් තුළ ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් විකිණීම තුළින් ලද ආදායම් ලෙස ඉදිරිපත් කර ඇත.

### 3.1.4. වෙනත් විස්තිරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන ආයෝජන ඉවත්කිරීමෙන් ලද ලාභ

වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන ඉවත්කිරීමෙන් ලද ලාභ තුළ අන්තර්ගත වන්නේ සාධාරණ අගය තුළින් වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස වර්ගීකරණය කරන ලද කොටස් ආයෝජන වලින් උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ වන අතර, එය සෘජුවම රඳවාගත් ලාභ වලට මාරු වන අතර, ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රතිචක්‍රීකරණ බලපෑමක් වාර්තා නොවේ.

### 3.1.5. වෙළෙඳාම සඳහා තබාගෙන ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමෙන් ලද ලාභ

විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමේ වෙනස්වීම්වල ලැයිස්තුගත කොටස් ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීම මත වන උපලබ්ධි නොවූ ලාභ අන්තර්ගත වන අතර, එය ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය ආයෝජන සාධාරණ අගයට අගය කිරීම මගින් ඇති වූ ලාභ හෝ අලාභ යටතේ දක්වා ඇත.

### 3.1.6. වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමෙන් ලද ලාභ

සාධාරණ අගයට වෙනත් විස්තීරණ ආදායම් අනුව ඇති මූල්‍ය ආයෝජනයන් හි සාධාරණ අගයෙහි වෙනස්වීම්වල ලැයිස්තුගත නොකළ කොටස් මත වන උපලබ්ධි නොවූ ලාභ අන්තර්ගතවන අතර, එවැනි ලාභාලාභ ඇත්නම් වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් විස්තීරණ ඇගයීම් මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට මැනීම මත ඇති වූ ලාභ හෝ අලාභ යටතේ ඉදිරිපත් කර ඇත. සාධාරණ අගය තුළින් වෙනත් විස්තීර්ණ ආදායම් මනින මූල්‍ය ආයෝජන, සාධාරණ අගයට තක්සේරු කිරීම මත ලාභ හෝ අලාභ ලෙස ඉදිරිපත් කෙරේ.

### 3.1.7. සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම් තුළ අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශයේ සියලුම කාර්ය මණ්ඩල සඳහා වැය වූ වියදම් වේ. අරමුදල විසින් වෙන්වූ විශ්‍රාම අරමුදලක් හෝ වෙනත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් පවත්වාගෙන නොයයි.

3.1.8. ආදායම් බදු

වත්මන් හා පෙර වර්ෂය සඳහා පවත්නා බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු අය කිරීමේ බලාධිකාරය වෙතින් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන වටිනාකම මතයි. එම මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති වාර්තා කරන දිනය වන විට බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවා වේ.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අනුව අරමුදල 2018 මාර්තු 31 දින දක්වා 10% අනුපාතයට ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. 2018 අප්‍රේල් 01 සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතට අනුව, අරමුදල 14% ක ආදායම් බදු ගෙවීමට බැඳී සිටී.

සේවක අර්ථසාධක අරමුදල 2006 සැප්තැම්බර් 01 දින සිට භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් ආයෝජන කළඹ සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම් වලට අනුව, බදු පසු බර තැබූ සාමාන්‍ය පිරිවැයට අගය කරන බැවින් ක්‍රමක්ෂය ලාභ ද බදු පසු ශුද්ධ අගය මත සටහන් කෙරේ.

ඒ අනුව, ක්‍රමක්ෂය ලාභ හා බදු වියදම පිළිබඳ වඩාත් සාධාරණ අදහසක් ලබා ගැනීම සඳහා වසර තුළ ඉපයූ ආදායම මත රඳවා ගැනීමේ බදු වියදම ක්‍රමක්ෂය ලාභ ගිණුමට නැවත එකතු කර ඇත. කෙසේ වෙතත්, නව දේශීය ආදායම් පනත සමඟ රජයේ සුරැකුම්පත්වල රඳවා ගැනීමේ බදු අහෝසි කිරීම හේතුවෙන්, 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, ක්‍රමක්ෂය කිරීම සලකා බලනු නොලැබේ.

## 3.2 වත්කම්

3.2.1. මූල්‍ය උපකරණ

**3.2.1.1. මූලික හඳුනාගැනීම, වර්ගීකරණය සහ පසු අගය කිරීම.**

සේ.අ.අ. එහි මූල්‍ය වත්කම් පහත දැක්වෙන මිනුම් කාණ්ඩවලට වර්ග කරයි.

i. සාධාරණ අගයට මැනිය යුතු (වෙනත් විස්තීරණ ආදායම් මගින් හෝ ලාභ හෝ අලාභ මගින්) සහ

ii. ක්‍රමක්ෂය පිරිවැයට මැනිය යුතු

වර්ගීකරණය රඳාපවතින්නේ මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන සේ.අ.අ. හි ව්‍යාපාරික ආකෘතිය සහ මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම් කොන්දේසි මතය.

i. **ක්‍රමක්ෂය පිරිවැය මත මනින මූල්‍ය වත්කම්**

**ණය උපකරණ**

ණය උපකරණවල ආයෝජන වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන්නේ එම ආයෝජනයන්හි,

- නිශ්චිත දිනයන්හි ප්‍රාග්ධනය හා ප්‍රාග්ධනය මත පොලිය පමණක් නියෝජනය වන මුදල් ප්‍රවාහයන්වලට තුඩු දෙන ගිවිසුම් කොන්දේසි තිබීම.

සහ

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකින්ම අරමුණු සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තිබීම මතයි.

**ii. වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්**

**ණය උපකරණ**

ණය උපකරණවල ආයෝජන වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනිනු ලබන්නේ එම ආයෝජනයන්හි,

නිශ්චිත දිනයන්හි ප්‍රාග්ධනය හා ප්‍රාග්ධනය මත පොලිය පමණක් නියෝජනය වන මුදල් ප්‍රවාහයන්වලට තුඩු දෙන ගිවිසුම් කොන්දේසි තිබීම.

සහ

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකින්ම අරමුණු සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තිබීම මතයි.

මෙම ණය උපකරණ මුලින් සාධාරණ අගය සහ ඍජුවම ආයෝජනය කළ හැකි ගනුදෙනු පිරිවැයට හඳුනාගන්නා අතර, පසුව ක්‍රමක්ෂය පිරිවැය මත අගය කරනු ලැබේ. ණය හානිකරණය මැනීම පදනම් වී ඇත්තේ සටහන 3.2.1.2 හි විස්තර කර ඇති පරිදි අදියර තුනක අපේක්ෂිත ණය පාඩු ආකෘතිය මතය.

මෙම ණය උපකරණ මුලින් සාධාරණ අගයට හා ගනුදෙනු පිරිවැයට හඳුනාගන්නා අතර, පසුව සාධාරණ අගයට මනිනු ලැබේ. සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ, හිමිකම්හි වෙනමම අංගයක් තුළ ඇතුළත් වේ. හානිකරණ අලාභ හෝ ආපසු ලියා හැරීම්, පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ, ලාභ හා අලාභ තුළින් හඳුනාගනී. ඉවත් කිරීමේ දී වෙනත් විස්තීර්ණ ආදායම් හි හඳුනාගෙන ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, හිමිකම් වලින් ආදායම් ප්‍රකාශයනට නැවත වර්ගීකරණය කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්වල මෙන්ම ණය හානිකරණය මැනීම අදියර තුනක අපේක්ෂිත ණය පාඩු ආකෘතිය මත පදනම්ව ඇත. අපේක්ෂිත ණය අලාභ ආකෘතිය පහත සටහන 3.2.1.2 මූල්‍ය වත්කම් හානිකරණය හි දක්වා ඇත.

**ස්කන්ධ සාධන පත්‍ර**

විකිණීම සඳහා නොවන හෝ SLFRS 03 ව්‍යවහාර වන ව්‍යාපාර සංයෝජනයක අත්පත්කර ගන්නා විසින් අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාවක් ලෙස හඳුනා නොගන්නා ස්කන්ධ සාධන පත්‍ර ආයෝජන කළමනාකරණය විසින් ආපසු හැරවිය නොහැකි තීරණයක් ඇතිවිට විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට අනුව මනිනු ලැබේ. කළමනාකරණය විසින් වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මැනීමට, වෙනස් ආපසු හැරවිය නොහැකි තීරණයක් ගෙන නැති විටදී, එම ආයෝජන ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මනින ආයෝජන ලෙස සලකනු ලබයි.

වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇති වටිනාකම් පසුව ලාභ හෝ අලාභ වලට මාරු කරනු නොලැබේ. එවැනි ආයෝජනවල ලාභාංශ, ලාභ හෝ අලාභ සඳහා හඳුනා ගනී.

iii. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මනිනු ලබන අයිතම

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමක් ඇති අයිතම පහත අයිතම වලින් සමන්විත වේ.

1. වෙළෙඳාම සඳහා තබා ඇති අයිතම

   මූල්‍ය මෙවලමක් මෑත කාලීනව අත්පත්කර ඇත්නම් හෝ විකිණීම හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින් මූලික වශයෙන් දරා ඇත්නම් හෝ එක්ව කළමනාකරණය කර ඇති සහ කෙටිකාලීන ලාභ ලබා ගැනීම සඳහා සාක්ෂි ඇති මූල්‍ය උපකරණ කළඹක කොටසක් වේ නම් හෝ ව්‍යුත්පන්න ඉදිරි රැකුම් සම්බන්ධතාවයක් නැති වෙළෙඳාම සඳහා රඳවා ඇති බවට වර්ගීකරණය කර ඇති අයිතම වේ.

   වෙළෙඳ ව්‍යුත්පන්නයන් සහ වෙළෙඳ සුරැකුම්පත් වෙළෙඳාම සඳහා තබා ඇති අතර සාධාරණ වටිනාකමින් පිළිගැනේ.

2. මූලික හඳුනාගැනීමේ දී ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ලෙස නිශ්චිතව නම් කරන ලද අයිතම.

   මූලික පිළිගැනීම මත, ලාභය හෝ අලාභය තුලින් මූල්‍ය උපකරණ සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. මූල්‍ය වත්කමක් ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කළ හැක්කේ එසේ කිරීමෙන් හඳුනාගත් හෝ මනිනු ලැබූ ගිණුම් නොගැළපීම් සැහෙන ප්‍රමාණයකින් අඩුවීම මත වන අතර, එසේ නොවන විට මූල්‍ය වත්කම් හා වගකීම් වෙන ආකාරයකට මනිනු ලැබේ.

3. මූලික හා පොලී ගෙවීම් පමණක් නියෝජනය නොකරන ගිවිසුම් කොන්දේසි සහිත ණය උපකරණ.

   ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය උපකරණ මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර, ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ ඇති බව හඳුනාගෙන ඇත.

   පසුව, ඒවා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර, යම් යම් ලාභ හෝ අලාභයන් පැන නගින විට ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

   මූල්‍ය වත්කමක් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන විට, ණය අවදානම් වෙනස්වීම්වලට හේතු වන සාධාරණ වටිනාකමේ චලනය නියෝජනය කරමින්, පාර්ශවකරුගේ ණය සුදුසුකම් පිළිබිඹු කිරීම සඳහා ණය තක්සේරුකරණ ගැලපුමක් ඇතුළත් වේ.

   **මූල්‍ය උපකරණ සඳහා ඇති ව්‍යුත්පන්නයන් සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය**

   ව්‍යුත්පන්න කරන ලද මූල්‍ය උපකරණ යනු එකකින් හෝ ඊට වැඩි තීරණය කළ මිල අනුව, ලබාගත් ව්‍යුත්පන්න වටිනාකමක්, දර්ශකයක් හෝ වෙනත් විචල්‍යයක් හෝ හුවමාරු, ඉදිරි අනුපාත ගිවිසුම්, අනාගත ගිවිසුම් සහ මනාප වැනි උපකරණ වේ.

සියලුම ව්‍යුත්පන්නයන් ශේෂ පත්‍රයේ සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර, ඒවා ඵලදායී හෙජ් සම්බන්ධතාවයක කොටසක් ලෙස නම් කර ඇති අතර, ඒවා හෙජ් ව්‍යුත්පන්නයන් ලෙස වර්ගීකරණය කර ඇත. ව්‍යුත්පන්නයන්ගේ රැගෙන යන වටිනාකම ගිවිසුමේ කාලය පුරාවට සාධාරණ වටිනාකමට නැවත මනිනු ලැබේ. සාධාරණ වටිනාකම ධන වන විට ව්‍යුත්පන්නයන් වත්කම් ලෙසත් සෘණ වන විට වගකීම් ලෙසත් සලකුණු කෙරේ.

### 3.2.1.2. මූල්‍ය වත්කම් හානිකරණය

සාධාරණ අගය තුළින් ලාභ හෝ පාඩු මනින්නේ නැති පහත දැක්වෙන මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු (ECL) මැනීම සඳහා අදියර තුනක ප්‍රවේශයක් සේ.අ.අ. අදාළ කර ගනී.

- ණය උපකරණ සාධාරණ අගය තුළින් වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සහ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ.
- ණය බැඳීම්, සහ
- මූල්‍ය ඇපකර ගිවිසුම්

කොටස් ආයෝජන මත අපේක්ෂිත ණය හානි හඳුනාගෙන නැත.

මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානම වෙනස්වීම මත පදනම්ව මූල්‍ය වත්කම් පහත සඳහන් අදියර තුන හරහා සංක්‍රමණය වේ.

අදියර 1 - මාස 12 අපේක්ෂිත ණය හානි

මූලික හඳුනා ගැනීමෙන් පසු ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදු නොවූ සහ ආරම්භයේ සිටම ණය දුර්වල නොවූ නිරාවරණ සඳහා ඉදිරි මාස 12 තුළ සිදුවන පෙරනිමිති සිදුවීම්වල සම්භාවිතාවය හා සම්බන්ධ ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය අලාභයේ කොටස හඳුනාගැනේ.

සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක් නොවූ ගනුදෙනුකරුවන්ගෙන් සේ.අ.අ. මාස 12 ක අපේක්ෂිත ණය හානි තීරණය කරයි.

අදියර 2 ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණය නොකෙරේ.

මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් ඇති නමුත් ණය හානිකරණය නොවූ නිරාවරණ සඳහා, අපේක්ෂිත ණය හානිය ජීවිත කාලය පුරාම (මූල්‍ය වත්කම්වල ඉදිරි ආයුකාලය පිළිබිඹු කරයි) හඳුනා ගැනේ.

සේ.අ.අ. හි ප්‍රතිපත්තිවලට අනුකූලව, BBB ට වඩා පහළින් ශ්‍රේණිගත කර ඇත්තේ ආයෝජන නොවන ශ්‍රේණියේ ආයෝජන ලෙස සලකනු ලබන අතර, එම ආයෝජන ණය අවදානම් සැලකිය යුතු පිරිහීම් ලෙස සලකයි. එවැනි ආයෝජන ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය හානි ගණනය කිරීම සඳහා සලකා බලනු ලැබේ.

තවද, ආයෝජන ශ්‍රේණිගත කිරීම් තුළ සිදුවන චලනයන් මගින් ණය අවදානම සැලකිය යුතු ලෙස පිරිහීමට ලක්වේ. සැලකිය යුතු පිරිහීම මනිනු ලබන්නේ උපකරණයේ ආරම්භයේ සිට ප්‍රති පාර්ශවයේ බාහිර ණය ශ්‍රේණිගත කිරීම් 02 ක් පහත හෙලීම් මගිනි.

ස්වෛරී උපකරණ සඳහා සැලකිය යුතු පිරිහීම අර්ථ දැක්වෙන්නේ ප්‍රති පාර්ශවයේ බාහිර ණය ශ්‍රේණිගත කිරීම්වල පහළ බැසීම් සටහන් 4 ක් ලෙසයි.

අදියර 3 - ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය හානිය - ණය හානිකරණය කෙරේ.

එම වත්කම්වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයක අහිතකර ලෙස බලපාන සිදුවීම් 1 ක් හෝ කිහිපයක් සිදු වූ විට ඇති හානිකරණය නිරාවරණය ලෙස තක්සේරු කෙරේ. ණය හානිකරණ බවට පත්ව ඇති නිරාවරණ සඳහා ජීවිතකාලය පුරාම අපේක්ෂිත ණය හානිය හඳුනාගෙන ඇති අතර, පොලී අනුපාතය ගණනය කරනු ලබන්නේ දළ රැගෙන යන මුදලට වඩා ඵලදායී පොලී අනුපාතය ක්‍රමක්ෂය පිරිවැයට යෙදවීමෙනි.

**හානිය සඳහා පියවර තීරණය කිරීම**

සෑම වාර්තාකරණ දිනයකදීම, සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්දැයි සේ.අ.අ. තක්සේරු කරයි. පෙරනිමිති අවදානම සංසන්දනය කිරීමෙන් මූලික හඳුනා ගැනීමෙන් පසු නිරාවරණය සඳහා ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න සේ.අ.අ. තක්සේරු කරයි.

මෙම අරමුණු සඳහා අනවශ්‍ය පිරිවැයක් හෝ වෑයමක් නොමැතිව අදාළ සහ ලබාගත හැකි සාධාරණ හා අනුමත කළ හැකි තොරතුරු සේ.අ.අ. විසින් සලකනු ලැබේ. මෙයට ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සහ ඉදිරි දැක්ම විශ්ලේෂණය ඇතුළත් වේ.

නිරාවරණයක් මත ණය අවදානම පුද්ගල හෝ සාමූහික පදනමින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත්දැයි සේ.අ.අ. තක්සේරු කරයි. හානිය පිළිබඳ සාමූහික ඇගයීමක අරමුණු සඳහා, මූල්‍ය වර්ගය, හවුල් ණය අවදානම් ලක්ෂණ මත පදනම්ව උපකරණ වර්ගය, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම්, ආරම්භක පිළිගැනීමේ දිනය, කල්පිරීමේ ඉතිරි කාලය, කර්මාන්තය, ණය ගැනුම්කරු සහ වෙනත් අදාළ සාධක සැලකිල්ලට ගනිමින් කාණ්ඩගත කර ඇත.

**අපේක්ෂිත ණය අලාභ මැනීම.**

අපේක්ෂිත ණය අලාභය අපක්ෂපාතී හා ලාභදායීතාවයෙන් අපේක්ෂිත අලාභය පිළිබඳ තක්සේරු කර ඇති අතර, ඒවා පහත පරිදි මනිනු ලැබේ.

- වාර්තා කරන දිනයේ දී ණය හානිකරණය වාර්තා නොකළ මූල්‍ය වත්කම් : සඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ආයුකාලය පුරා ඇති සියලුම මුදල් හිඟයන්ගේ වර්තමාන වටිනාකමයි. මුදල් හිඟයේ වෙනස වනුයේ සේ.අ.අ. හි කොන්ත්‍රාත් වලට අනුකූලව ඇතිවන මුදල් ප්‍රවාහයන් සහ සේ.අ.අ. ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන්ගේ වෙනසයි.

- වාර්තා කරන දිනයේ දී ණය හානිකරණය වාර්තා කරන මූල්‍ය වත්කම් : සඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද දළ රැගෙන යා හැකි මුදල සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනසයි.

- ලබා නොගත් ණය බැඳීම් : සේ.අ.අ. විසින් ගෙවි යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් සහ සේ.අ.අ. ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනසෙහි වර්තමාන වටිනාකම.

- මූල්‍ය ඇපකාර ගිවිසුම් : හිමිකරුට ප්‍රතිපූරණය කිරීම සඳහා අපේක්ෂිත ගෙවීම් වලින් සේ.අ.අ. අයකර ගැනීමට අපේක්ෂා කරන ඕනෑම මුදලක් අඩු කිරීමෙනි.

සේ.අ.අ. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා සටහන 34.6 හි මූල්‍ය වත්කම් අංශයේ ණය ගුණාත්මකභාවය බලන්න.

අපේක්ෂිත ණය අලාභයන් ආදායම් ප්‍රකාශනයේ අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම යටතේ හඳුනාගනී. ණය උපකරණ මතින්නේ සාධාරණ අගය තුළින් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේය. අපේක්ෂිත ණය අලාභය මැනීම පදනම් වී ඇත්තේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් සඳහා භාවිතා කරන අදියර තුනේ ප්‍රවේශය මතය. සේ.අ.අ. ප්‍රතිපාදන වියදම් ලාභ අලාභ ගිණුම යටතේ හඳුනා ගනී. අනුරූප අගය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගනිමින්, සේ.අ.අ. ශේෂපත්‍රයේ සඳහන් වත්කමේ ධාරණ අගයේ අඩුවීමකින් තොරව ප්‍රතිපාදන වියදම ආදායම් හා වියදම් ගිණුම යටතේ හඳුනාගනී.

### 3.2.1.3. මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ ප්‍රති හඳුනාගැනීම

මූල්‍ය වත්කමක්/මූල්‍ය වගකීමක් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබන්නේ සාමාන්‍යයෙන් වෙළෙඳ දිනයට සාධන පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනවලට පාර්ශවරුවෙක් වන අවස්ථාවේදී පමණි. ණය සහ ලැබිය යුතු දේ හඳුනාගනු ලබන්නේ ණය ගැනුම්කරුවන්ට මුදල් ලබාදුන් විටය.

මූල්‍ය වත්කම ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මූලිකව හඳුනා ගැනීමේ දී සාධාරණ අගය පදන ම්කර ගනී. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් මූලිකව හඳුනා ගැනීමේ දී සාධාරණ අගයට ඍජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය එකතු කර හඳුනාගනී.

සේ.අ.අ., ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයක කාලය ඉකුත්වන විට හෝ ගනුදෙනුවක දී මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයක හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීමේ දී වත්කම ප්‍රති හඳුනාගනී. සේ.අ.අ. විසින් නිර්මාණය කරන ලද හෝ රඳවා ගෙන ඇති මාරු කරන ලද මූල්‍ය වත්කම් පිළිබඳ කොටස වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

සේ.අ.අ. විසින් මූල්‍ය වගකීමක් ශේෂපත්‍රයේ ප්‍රතිහඳුනාගනු ලබන්නේ ගිවිසුමේ පැහැදිලිව සඳහන් කර ඇති බැඳීම ක්‍රියාත්මක කිරීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීම සිදුවන විටදීය.

### 3.2.1.4. හිලව් කිරීම

හිලව්කිරීමට නීතිමය බැඳියාවක් ඇතිවිට සහ ශුද්ධ පදනම මත පියවීමට අදහසක් ඇතිවිට හෝ එකවර වත්කම උපලබ්ධි කිරීමෙන් සහ වගකීම නිදහස් කිරීමේ දී සේ.අ.අ. මූල්‍ය වත්කම් හා වගකීම් ශුද්ධ අගය මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කරයි.

### 3.2.1.5. වැදගත් ගිණුම්කරණ උපකල්පන සහ ඇස්තමේන්තු

එක් එක් වාර්තාකරණ දිනයේ දී කරන ලද උපකල්පන එම දිනයේ හොඳම ඇස්තමේන්තු මත පදනම් වේ. ඇස්තමේන්තු විශ්වාසනීයව මිනුම් කර ඇති බව සහතික කර ගැනීම සඳහා සේ.අ.අ. හි අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතත් සත්‍ය ප්‍රමාණයන් එම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ පාදකව පවත්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ සහ අනාගතයේ දී බලපාන ඕනෑම කාලපරිච්ඡේදයක් තුළ හඳුනා ගැනේ.

විනිශ්චය, ඇස්තමේන්තු හා උපකල්පන වලට සංවේදී ගිණුම් ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

**සාධාරණ අගය මැනීම**

මූල්‍ය උපකරණවල සැලකිය යුතු කොටසක් සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ මතට ගෙන යනු ලබයි.

සාධාරණ වටිනාකම යනු මිනුම් දිනයකදී වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීම සඳහා ලැබිය යුතු හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි.

එහිදී මූල්‍ය වත්කමක් හෝ වගකීමක් වර්ගීකරණය කිරීමෙන් හැකි සෑම තැනකම එය සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර, සාධාරණ වටිනාකම තීරණය වන්නේ සේ.අ.අ. වෙත ක්ෂණිකව ප්‍රවේශ විය හැකි වඩාත්ම වාසිදායක ක්‍රියාකාරී වෙළෙඳපොළේ මිල ගණන් ඉදිරිපත් කළ ලංසුව හෝ මිල ගණන් යොමු කිරීමෙනි. ණය අවදානම සඳහා වන ගැලපීමක් ද සාධාරණ වටිනාකමට සුදුසු පරිදි ඇතුළත් කර ඇත.

සක්‍රීය වෙළෙඳපොළක උපුටා දක්වා ඇති මූල්‍ය වගකීමක් වන ශුද්ධ විවෘත තත්ත්වයක් සඳහා සාධාරණ වටිනාකම වන වර්තමාන දීමනා මිල, සහ මූල්‍ය වත්කමක් සඳහා ලංසු මිල, රඳවා තබා ඇති හෝ නිකුත් කරන ලද උපකරණයේ ඒකක ගණනින් ගුණකිරීමෙන් ලැබේ.

විශේෂිත වත්කමක් හෝ වගකීමක් සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළක් නොපවතින විට, සේ.අ.අ. සාධාරණ වටිනාකමට ලඟා වීමට තක්සේරුකරණ ක්‍රමයක් භාවිතා කරන අතර, අතේ දුරින් වූ ගනුදෙනු වලදී භාවිතා කරන ලද හුවමාරු මිල ගණන් ඇතුළත් කර ඇත. වට්ටම් කළ මුදල් ප්‍රවාහ විශ්ලේෂණ, විකල්ප මිලකරණ ආකෘති සහ වෙනත් තක්සේරුකරණ ක්‍රම, වාර්තා කිරීමේ දිනයේ පවතින වෙළෙඳපොළ තත්ත්වයන් හා අවදානම් මත රඳා පවතී. එසේ කිරීමෙන්, තක්සේරු කළ හැකි වෙළෙඳපොළ යෙදවුම් උපරිම ලෙස භාවිතා කරන තක්සේරුකරණ ක්‍රමවේදයක් භාවිතා කරමින් සාධාරණ වටිනාකම තක්සේරු කර ඇති අතර, ආයතනය විශේෂිත යෙදවුම් මත අවම විශ්වාසයක් තබයි.

### 3.2.2. දේපළ, පිරියත හා උපකරණ

**හඳුනාගැනීම**

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම සිදු වේ.

**මැනීම**

ආරම්භයේ දී සියලුම දේපළ පිරියත හා උපකරණ එහි පිරිවැයට අගය කරනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීමට සෘජුව දායක වන වියදම් හා පසුව දරන පිරිවැය (''පසුකාලීන පිරිවැය'' යටතේ පැහැදිලි කර ඇති ආකාරයට), පිරිවැයට ඇතුළත් වේ. උපකරණයක ක්‍රියාකාරීත්වයට අවශ්‍යව මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

**පිරිවැය ආකෘතිය**

දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයට, ශුද්ධ සමුච්චිත ක්ෂය වීම් වලට හා සමුච්චිත හානිකරණ අලාභ වලටය. වත්කමක ධාරණ අගය, ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි වන විට ධාරණ අගය අයකර ගත හැකි අගය දක්වා කපා හරිනු ලබයි (කරුණාකර සටහන 3.2.6 ට මූල්‍ය නොවන වත්කම් හානිකරණය සටහන බලන්න).

**පසුකාලීන පිරිවැය**

ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ්හි වරණීය කොටස්වල ආයෝජනය, LKAS 39 යටතේ ලැයිස්තුගත නොවූ කොටස්වල ආයෝජනයක් ලෙස සලකන ලදී. SLFRS 09 හි මාර්ගෝපදේශයන්ට අනුව, ස්ථාවර පොලී ගෙවීම් හා ස්ථාවර කල්පිරීම් ඇතුළත් වූ මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගනිමින්, මෙම උපකරණ ණය උපකරණ ලෙස නැවත වර්ගීකරණය කරන ලදී. එම නිසා, ඉහත වරණීය කොටස්වල ක්‍රමක්ෂය කළ පිරිවැය 2018.01.01 දිනට ගණනය කරන ලද අතර, පිරිවැය හා ක්‍රමක්ෂය කළ පිරිවැය අතර වෙනස රඳවාගත් ඉපැයුම් ලෙස ගළපන ලදී.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**2018.01.01 දිනට මූල්‍ය ආයෝජන (සම්බන්ධයි...)**

| | රු.000 | |
|---|---|---|
| 2018.01.01 දිනට පිරිවැය | 1,005,000,000 | ලැයිස්තුගත නොවූ කොටස් වර්ගීකරණයෙන් ඉවත් කරන ලදී. |
| 2018.01.01 දිනට ක්‍රමක්ෂය කළ පිරිවැය | 998,391,666 | සාංගමික ණය සුරැකුම්පත්වල ආයෝජනය යටතේ වාර්තාගත කරන ලදී. |
| වෙනස | 6,608,334 | රඳවාගත් ඉපැයුම් ලෙස ගලපන ලද වෙනස |

**34.1.2.** ලැබිය යුතු පොලිය වෙනස් කිරීම්

| උපකරණ | LKAS 39 යටතේ වර්ගීකරණය | 2017.12.31 දිනට ශේෂය රු.000 | රඳවාගත් ලාභයට ගැළපීම රු.000 | SLFRS 09 යටතේ 2018.01.01 දිනට ශේෂයන් (රු.000) | |
|---|---|---|---|---|---|
| | | | | ආයෝජන ශේෂය | ලැබිය යුතු පොලී ශේෂය |
| භාණ්ඩාගාර බැඳුම්කර | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | 390,192 | (390,192) | - | - |
| | විකිණීම සඳහා පවතින | 1,588,259 | (1,588,259) | - | - |
| | කල්පිරීම තෙක් තබාගත් | 54,925,866 | - | 54,925,866 | - |
| | | **56,904,318** | **(1,978,451)** | **54,925,866** | **-** |
| සාංගමික ණයකර | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | 4,084 | - | - | 4,084 |
| | විකිණීම සඳහා පවතින | 136,520 | (13,057) | - | 123,463 |
| | කල්පිරීම තෙක් තබාගත් | 1,357,165 | - | 461,333 | 895,833 |
| | | **1,497,769** | **(13,057)** | **461,333** | **1,023,380** |
| ස්ථාවර තැන්පතු | ණය සහ ලැබිය යුතු දෑ | 1,272,095 | - | 1,272,095 | - |
| | | **59,674,181** | **(1,991,508)** | **56,659,293** | **1,023,380** |

ක්‍රමක්ෂය පිරිවැයකරණ ක්‍රමය යටතේ ලැබිය යුතු පොලිය ආයෝජනවල කොටසක් ලෙස සලකයි.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)

**34.1.3** 2018.01.01 දිනට, LKAS 39 යටතේ වූ ඉදිරියට ගෙන යන ශේෂයන් හා SLFRS 09 යටතේ වාර්තාගත කරන ලද ශේෂයන් සැසඳීම.

| මූල්‍ය වත්කම් | යොමුව | වර්ගීකරණය (LKAS 39 යටතේ මිනුම් කිරීම) | වටිනාකම (LKAS 39 යටතේ මිනුම් කිරීම) | නැවත වර්ගීකරණය (නැවත මිනුම් කිරීම) | ECL (නැවත මිනුම් කිරීම) | වෙනත් (නැවත මිනුම් කිරීම) | වටිනාකම (SLFRS 9) | වර්ගීකරණය (SLFRS 9) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | |
| මුදල් හා මුදල් සමාන වත්කම් | | ණය සහ ලැබිය යුතු දෑ | 3,273,923 | - | (36) | - | 3,273,888 | ක්‍රමක්ෂය කළ පිරිවැයට |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට ණය උපකරණ | | | | | | | | |
| | | | **(1,908,059,527)** | **1,908,059,527** | **(4,376)** | **2,270,486** | **1,910,325,637** | ක්‍රමක්ෂය කළ පිරිවැයට |
| ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් | A | | | 13,247,608 | (45) | - | 13,247,563 | |
| විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් | A | | | 57,086,797 | (1,032) | 998,392 | 58,084,157 | |
| කල්පිරීම තෙක් තබාගත් මූල්‍ය වත්කම් | | | | 1,789,725,122 | (2,957) | - | 1,789,722,165 | |
| ණය සහ ලැබිය යුතු දෑ යටතේ මූල්‍ය වත්කම් | | | | 48,000,000 | (342) | 1,272,095 | 49,271,753 | |
| | | | **(1,908,059,527)** | **1,908,059,527** | **(4,376)** | **2,270,486** | **1,910,325,637** | |
| වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ හිමිකම් උපකරණ | | | | | | | | |
| | | | **(10,270,625)** | **10,270,625** | **-** | **(1,005,000)** | **9,265,625** | වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට |
| ලාභ අලාභ තුළින් සාධාරණයට වූ හිමිකම් උපකරණ | B | | | 10,270,625 | - | (1,005,000) | 9,265,625 | |
| | | | **(10,270,625)** | **10,270,625** | **-** | **(1,005,000)** | **9,265,625** | |
| ලාභ අලාභ තුළින් සාධාරණ අගයට වූ හිමිකම් උපකරණ | | | | | | | | |
| | | | **(74,042,107)** | **74,042,107** | **-** | **-** | **71,590,364** | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට |
| ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට වූ මූල්‍ය ආයෝජන | | | | 2,451,743 | - | - | 2,451,743 | |
| විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන | C | | | 71,590,364 | - | - | 71,590,364 | |
| | | | **(74,042,107)** | **74,042,107** | **-** | **-** | **71,590,364** | |
| මූල්‍ය ආයෝජන විකිණීම සඳහා පවතින | | | | | | | | |
| | | | **81,860,989** | **(81,860,989)** | **-** | **-** | **N/A** | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට | | විකිණීම සඳහා පවතින | | (57,086,797) | - | - | - | |
| හිමිකම් උපකරණ - ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | | විකිණීම සඳහා පවතින | | (71,590,364) | - | - | - | |
| හිමිකම් උපකරණ - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | | විකිණීම සඳහා පවතින | | (10,270,625) | - | - | - | |
| | | | **81,860,989** | **(81,860,989)** | | | **N/A** | |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)

| මූල්‍ය වත්කම් | යොමුව | LKAS 39 යටතේ මිනුම් කිරීම | | නැවත මිනුම් කිරීම | | | SLFRS 9 | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගීකරණය | වටිනාකම | නැවත වර්ගීකරණය | ECL | වෙනත් | වටිනාකම | වර්ගීකරණය |
| | | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | |
| <u>මූල්‍ය ආයෝජන - කල්පිරීම තෙක් තබාගත්</u> | | | | | | | | |
| | | | **1,789,725,122** | **(1,789,725,122)** | - | - | **N/A** | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැය | | කල්පිරෙන තෙක් පැවති | | (1,789,725,122) | - | - | - | |
| | | | **1,789,725,122** | **(1,789,725,122)** | | | **N/A** | |
| <u>මූල්‍ය ආයෝජන - ණය සහ ලැබිය යුතු දෑ</u> | | | | | | | | |
| | | | **48,000,000** | **(48,000,000)** | - | - | **N/A** | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැය | | ණය හා ලැබිය යුතු දෑ | | (48,000,000) | - | - | | |
| | | | **48,000,000** | **(48,000,000)** | | | **N/A** | |

සටහන අ

මෙම උපකරණවල මුදල් ප්‍රවාහ ලක්ෂණ මත පදනම්ව ඒවා එස්.පී.පී.අයි. (මුල් මුදල හා පොලිය ගෙවීම) පරීක්ෂණයට සමත්ය. සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම් ව්‍යාපාර ආකෘතියට අනුව, සිය මූල්‍ය ආයෝජනවල ගිවිසුම්ගත මුදල් ලබා ගන්නා අතර, ඒවා කල්පිරීමට පෙර විකිණීමට අදහස් නොකරයි. ඒ අනුව, මුදල් ප්‍රවාහයන් කළමනාකරණය කිරීමේ දී ඒවා ක්‍රමක්ෂය කළ පිරිවැය කාණ්ඩයේ ණය උපකරණ ලෙස නැවත වර්ගීකරණය කරන ලදී.

සටහන ආ

ලැයිස්තුගත නොකළ කොටස් වල ආයෝජන සඳහා සක්‍රිය වෙළෙඳපොළක් නොමැති බැවින් ඒවා වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට ලෙස නම් කරනු ලැබේ.

සටහන ඇ

SLFRS 09 ට අනුව, පසුව සිදුවන සාධාරණ වටිනාකම් වෙනස්වීම්, වෙනත් විස්තීර්ණ ආදායම් ඉදිරිපත් කිරීමට අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් පවතින තත්ත්වයක දී හැර අන් සෑම අවස්ථාවකදීම, කොටස් වල (ස්කන්ධ සාධන පත්‍ර) ආයෝජන ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට යටතේ වර්ගීකරණය කරනු ලබයි.

## සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)**

**34.2.** SLFRS 09 වෙත මාරුවීම නිසා සංචිත හා රඳවාගත් ඉපැයීම් මත වූ බලපෑම පහත පරිදි වේ.

| | **සංචිත සහ රඳවාගැනීම් රු.000** |
|---|---|
| **ප්‍රත්‍යාගණන සංචිත ආයෝජනය** | |
| 2017.12.31 දිනට LKAS 39 යටතේ අවසාන ශේෂය | 4,241,946 |
| රඳවාගත් ලාභයට මාරු කිරීම | |
| ණය සුරැකුම්පත් විකිණීම සඳහා පවතින අගයෙන් ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම | 952,407 |
| ලැයිස්තුගත නොකළ කොටස් විකිණීම සඳහා පවතින අගයෙන් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට නැවත වර්ගීකරණය කිරීම | (5,194,353) |
| 2018.01.01 දිනට SLFRS 09 යටතේ ආරම්භක ශේෂය | - |
| **රඳවාගත් ලාභය** | |
| 2017.12.31 දිනට LKAS 39 යටතේ අවසාන ශේෂය | 268,002 |
| ප්‍රත්‍යාගණන සංචිත ආයෝජන මාරු කිරීම් | 4,241,946 |
| වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ වරණීය කොටස් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ණය සුරැකුම්පත් ලෙස නැවත වර්ගීකරණය කිරීමෙන් ඇතිවන බලපෑම නැවත අගය කිරීම (සටහන 01) | (39,401) |
| ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට සහ විකිණීම සඳහා පවතින වලින් වූ ණය සුරැකුම්පත් ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීමෙන් ඇතිවන බලපෑම නැවත අගය කිරීම (සටහන 34.1.2) | (1,991,508) |
| වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට යටතේ අගය කරන ලද අගයන් ඇතුළුව යටතේ SLFRS 09 අපේක්ෂිත ණය අලාභ | (4,412) |
| 2018.01.01 දිනට SLFRS 09 යටතේ ආරම්භක ශේෂය | 2,474,628 |
| SLFRS 09 ට අනුගත වීම නිසා රඳවාගත් ලාභයේ ඇතිවන වෙනස | 2,206,626 |
| SLFRS **09 ට අනුගතවීම නිසා හිමිකම් ප්‍රාග්ධනයේ ඇතිවන මුළු වෙනස** | **(2,035,320)** |

**සටහන 01**

| | |
|---|---|
| වර්ගීකරණ වෙනස්කම් නිසා | 6,608 |
| ලාභාංශ ලැබීම් වලින් මාරු කිරීම් | 32,793 |
| | **39,401** |

**34.3. SLFRS 09 වලට මාරුවීම නිසා හානිකරණ සඳහා වෙන්කිරීම් වලට වන බලපෑම පහත පරිදි වේ.**

| | **LKAS 39/LKAS** 37 යටතේ වෙන්කිරීම් 2017.12.31 දිනට | නැවත අගයකිරීම් | **SLFRS 9 යටතේ** අපේක්ෂිත ණය අලාභ 2018.01.01 |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| හානිකරණ දීමනාව සඳහා | | | |
| ණය උපකරණ - ක්‍රමක්ෂය කළ පිරිවැයට | - | 4,376 | 4,376 |
| ස්කන්ධ සාධන පත්‍ර - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | - | - | - |
| ස්කන්ධ සාධන පත්‍ර - වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | - | - | - |
| බැංකු ශේෂය | - | 36 | 36 |
| | **-** | **4,412** | **4,412** |

SLFRS 09 වල වෙන්කිරීම් අනුව හානිකරණ ආකෘතිය දරා ඇති අලාභ ආකෘතියේ සිට අපේක්ෂිත ණය අලාභ ආකෘතියට වෙනස් විය. විස්තරාත්මක තොරතුරු සටහන් අංක 34.6 දී ඇත.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)

**34.4.** 2018.12.31 දිනට ආයෝජන ශේෂයන් සැසඳීම

| උපකරණ | SLFRS 09 අනුව | | | LKAS 39 අනුව | | | වැඩිවීම/(අඩු වීම) (රු.'000) |
|---|---|---|---|---|---|---|---|
| | වර්ගීකරණය | මිනුම් කිරීම | වටිනාකම (රු.'000) | වර්ගීකරණය | මිනුම් කිරීම | සාධාරණ අගයට (රු.'000) | |
| භාණ්ඩාගාර බැඳුම්කර | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 2,084,497,740 | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | සාධාරණ අගයට | 11,601,675 | |
| | | | | විකිණීම සඳහා පවතින | සාධාරණ අගයට | 43,299,225 | |
| | | | | කල්පිරීම තෙක් පැවති | ක්‍රමක්ෂය පිරිවැය | 2,024,530,332 | |
| | | | **2,084,497,740** | | | **2,079,431,232** | 5,066,508 |
| භාණ්ඩාගාර බිල්පත් | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 34,733,240 | කල්පිරීම තෙක් පැවති | ක්‍රමක්ෂය පිරිවැය | 34,733,240 | - |
| | | | **34,733,240** | | | **34,733,240** | - |
| සාංගමික ණයකර | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 42,649,463 | විකිණීම සඳහා පවතින | සාධාරණ අගයට | 1,352,730 | |
| | | | | කල්පිරීම තෙක් පැවති | ක්‍රමක්ෂය පිරිවැය | 41,244,047 | |
| | | | **42,649,463** | | | **42,596,777** | 52,687 |
| වරණීය කොටස් | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 1,005,060 | විකිණීම සඳහා පවතින | සාධාරණ අගයට | 1,005,000 | 60 |
| | | | **1,005,060** | | | **1,005,000** | |
| භාරකාර සහතිකපත් | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 1,132,558 | කල්පිරීම තෙක් පැවති | ක්‍රමක්ෂය පිරිවැය | 1,132,594 | (36) |
| | | | **1,132,558** | | | **1,132,594** | |
| ස්ථාවර තැන්පතු | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 33,609,534 | ණය සහ ලැබිය යුතු දෑ | ක්‍රමක්ෂය පිරිවැය | 33,609,718 | (183) |
| | | | **33,609,534** | | | **33,609,718** | |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය කළ පිරිවැය | 26,350,903 | ණය සහ ලැබිය යුතු දෑ | ක්‍රමක්ෂය පිරිවැය | 26,350,903 | - |
| | | | **26,350,903** | | | **26,350,903** | |
| ලැයිස්තුගත කොටස් | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | සාධාරණ අගයට | 64,937,663 | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | සාධාරණ අගයට | 2,587,958 | - |
| | | | | විකිණීම සඳහා පවතින | සාධාරණ අගයට | 62,349,705 | - |
| | | | **64,937,663** | | | **64,937,663** | |
| ලැයිස්තුගත නොකළ කොටස් | වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | පිරිවැය | 9,914,892 | විකිණීම සඳහා පවතින | පිරිවැය | 9,914,892 | - |
| | | | **9,914,892** | | | **9,914,892** | |
| එකතුව | | | **2,298,831,054** | | | **2,292,707,019** | **5,119,035** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)

**34.5** 2018 වර්ෂය සඳහා ආයෝජන ආදායම් සැසඳීම

| උපකරණ | SLFRS 09 අනුව | | | | LKAS 39 අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වර්ගීකරණය | ආදායම් වර්ගය | හඳුනාගැනීම: ලාභ හෝ අලාභ (රු.'000) | හඳුනාගැනීම: වෙනත් විස්තීර්ණ ආදායම් (රු.'000) | වර්ගීකරණය | ආදායම් වර්ගය | හඳුනාගැනීම: ලාභ හෝ අලාභ (රු.'000) | හඳුනාගැනීම: වෙනත් විස්තීර්ණ ආදායම් (රු.'000) |
| භාණ්ඩාගාර බැඳුම්කර | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය ආදායම් | 212,232,470 | - | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | (1,035,305) | - |
| | | | - | - | | ක්‍රමක්ෂය ආදායම් | 1,360,487 | - |
| | | | - | - | | ප්‍රාග්ධන ලාභ/(අලාභ) | 37,583 | - |
| | | | - | - | විකිණීම සඳහා පවතින | ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | - | (4,006,721) |
| | | | - | - | | ක්‍රමක්ෂය ආදායම් | 5,077,581 | - |
| | | | - | - | | ප්‍රාග්ධන ලාභ/(අලාභ) | 212,711 | - |
| | | | - | - | කල්පිරීම තෙක් තබාගත් | ක්‍රමක්ෂය ආදායම් | 205,736,539 | - |
| | | | **212,232,470** | - | | | **211,389,595** | **(4,006,721)** |
| භාණ්ඩාගාර බිල්පත් | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය ආදායම් | 6,026,390 | - | විකිණීම සඳහා පවතින | ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | - | (36,839) |
| | | | | - | | ක්‍රමක්ෂය ආදායම් | 170,225 | - |
| | | | - | - | කල්පිරීම තෙක් තබාගත් | ක්‍රමක්ෂය ආදායම් | 5,893,003 | - |
| | | | **6,026,390** | **-** | | | **6,063,229** | **(36,839)** |
| සාංගමික ණයකර | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය ආදායම් | 4,983,538 | - | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | ක්‍රමක්ෂය ආදායම් | 12,118 | - |
| | | | - | - | විකිණීම සඳහා පවතින | ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | - | (59) |
| | | | - | - | | ක්‍රමක්ෂය ආදායම් | 285,478 | - |
| | | | - | - | | ප්‍රාග්ධන ලාභ/(අලාභ) | | |
| | | | - | - | කල්පිරීම තෙක් තබාගත් | ක්‍රමක්ෂය ආදායම් | 4,582,204 | - |
| | | | **4,983,538** | - | | | **4,879,799** | **(59)** |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

2018 වර්ෂය සඳහා ආයෝජන ආදායම් සැසඳීම (සම්බන්ධයි)

| උපකරණ | SLFRS 09 අනුව | | | | LKAS 39 අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වර්ගීකරණය | ආදායම් වර්ගය | හඳුනාගැනීම | | වර්ගීකරණය | ආදායම් වර්ගය | හඳුනාගැනීම | |
| | | | ලාභ හෝ අලාභ (රු.'000) | වෙනත් විස්තීර්ණ ආදායම් (රු.'000) | | | ලාභ හෝ අලාභ (රු.'000) | වෙනත් විස්තීර්ණ ආදායම් (රු.'000) |
| ලැයිස්තුගත කොටස් | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | වෙළෙඳපොළ අගයට ගණන් තබනු ලැබූ ලාභය/(අලාභය) | (10,901,286) | - | ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට | වෙළෙඳපොළ අගයට ගණන් තබනු ලැබූ ලාභය/(අලාභය) | (257,754) | - |
| | | ලාභාංශ ආදායම | 2,663,693 | - | විකිණීම සඳහා පවතින | වෙළෙඳපොළ අගයට ගණන් තබනු ලැබූ ලාභය/(අලාභය) | - | (10,649,532) |
| | | ප්‍රාග්ධන ලාභ/(අලාභ) | 7,216 | | | Impairment | (5,933,593) | - |
| | | | - | - | | ලාභාංශ ආදායම | 2,634,629 | - |
| | | | - | - | | ප්‍රාග්ධන ලාභය/(අලාභය) | 7,216 | - |
| | | | **(8,230,376)** | - | | | **(3,543,502)** | **(10,649,532)** |
| ලැයිස්තුගත නොකළ කොටස් | වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට | වෙළෙඳපොළ අගයට ගණන් තබනු ලැබූ ලාභය/(අලාභය) | - | - | විකිණීම සඳහා පවතින | වෙළෙඳපොළ අගයට ගණන් තබනු ලැබූ ලාභය/(අලාභය) | - | - |
| | | ලාභාංශ ආදායම | 1,095,986 | - | | ලාභාංශ ආදායම | 1,095,986 | - |
| | | | **1,095,986** | - | | | **1,095,986** | - |
| වරණීය කොටස් | ක්‍රමක්ෂය කළ පිරිවැය | ලාභාංශ ආදායම | 127,900 | - | විකිණීම සඳහා පවතින | ලාභාංශ ආදායම | 121,018 | - |
| | | | **127,900** | - | | | **121,018** | - |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය ආදායම් | 685,316 | - | ණය සහ ලැබිය යුතු දෑ | ක්‍රමක්ෂය ආදායම් | 685,316 | - |
| | | | **685,316** | - | | | **685,316** | - |
| ස්ථාවර තැන්පතු | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය ආදායම් | 5,358,990 | - | L&R | ක්‍රමක්ෂය ආදායම් | 5,358,990 | - |
| | | | **5,358,990** | - | | | **5,358,990** | - |
| භාරකාර සහතිකපත් | ක්‍රමක්ෂය කළ පිරිවැය | ක්‍රමක්ෂය ආදායම් | 159,321 | - | කල්පිරීම තෙක් තබාගත් | ක්‍රමක්ෂය ආදායම් | 159,321 | - |
| | | | **159,321** | - | | | **159,321** | - |
| | | | | | | | | |
| එකතුව | | | **222,439,533** | - | | | **226,209,752** | **14,693,151** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**වෙනස්වීම් අනාවරණය කිරීම (සම්බන්ධයි ....)**

**34.6 හානිකරණ තක්සේරුවට යටත් වූ මූල්‍ය ආයෝජන මත හානිකරණ අලාභ**

SLFRS 09 ට අනුගත වීමේ දී සේවක අර්ථසාධක අරමුදල, LKAS 39 යටතේ දරා ඇති අලාභ ආකෘතිය මත පදනම්ව ගණනය කළ හානිකරණය වෙනුවට ගනුදෙනුකරුවන්ගේ ණය ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව අපේක්ෂිත ණය අලාභ ආකෘතිය භාවිතා කමින් නිර්ණය කළ හානිකරණය දක්වයි. ඒ අනුව, පහත දැක්වෙන මූල්‍ය උපකරණ අපේක්ෂිත ණය අලාභ ආකෘතිය භාවිතා කරමින් වූ හානිකරණ වෙන්කිරීම් වලට යටත් වේ.

I හිමිකම් කොටස් වල ආයෝජනයන් හැර, වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද සියලුම මූල්‍ය වත්කම්.

II ක්‍රමක්ෂය කළ පිරිවැයට මිනුම් කරන ලද සියලුම මූල්‍ය වත්කම්

ඒ අනුව, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, සාංගමික ණය සුරැකුම්පත්, භාරකාර සහතිකපත්, ප්‍රති විකුණුම්, ස්ථාවර තැන්පතු සහ බැංකු ශේෂයන් හානිකරණ වෙන් කිරීම් සඳහා සලකනු ලබයි. කෙසේ වෙතත්, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වැනි රාජ්‍ය සුරැකුම්පත් හානිකරණයට හේතු නොවේ. මන්ද, රටේ පරමාධිපත්‍ය, ගනුදෙනුකාර පාර්ශවය වන අතර, මෙම උපකරණ මනිනු ලබන්නේ රුපියල් අගයන් මතය.

**ක්‍රමවේදයන්**

අතීත අලාභයන් සැලකිල්ලට ගනිමින් අපේක්ෂිත ණය අලාභ ආකෘතියන් ගොඩනැගීමේ හැකියාවක් පවතින නමුත් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට අතීත අලාභයන් පිළිබඳව අත්දැකීමක් නොමැත. එහිදී සේවක අර්ථසාධක අරමුදල, බාහිර ප්‍රවාහයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද අලාභ සංඛ්‍යාලේඛන සැලකිල්ලට ගනී. උදා : ප්‍රසිද්ධියේ ලබාගත හැකි බ්ලූම්බර්ග් තොරතුරු.

සේවක අර්ථසාධක අරමුදල විසින් බ්ලූම්බර්ග් මගින් ප්‍රකාශයට පත් කරන ලද ණය පැහැර හැරීම්වල සම්භාවිතාවයට එරෙහිව නිකුත් කරන්නාගේ ශ්‍රේණිගත කිරීම් ගළපන අතර, එහිදී පහත සඳහන් වෙනස්කිරීම් සලකා බලයි.

I **ණය පැහැර හැරීමේ සම්භාවිතා චක්‍රය හරහා වෙනස් වීම (TTC PD)**
බ්ලූම්බර්ග් හානි සංඛ්‍යා මගින් TTC PD දක්වන අතර, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාග මනය පදනම් පරිවර්තන ප්‍රවේශයට අනුකූලව සිදු කළ ආර්ථික සාධක ගැලපීම් යොදා ගනිමින්, එය (TTC PD ) නියමිත කොටසට නියමිත වේලාවට (PiT) පරිවර්තනය කරනු ලබයි.

II **ණය පැහැර හැරීමේ සම්භාවිතා ආකෘතියේ ආයු කාලය**
බ්ලූම්බර්ග් ණය පැහැර හැරීමේ සම්භාවිතාවය මගින් සැලකිය යුතු ලෙස පිරිහී ඇති ආයෝජන වල මාස 12 ක අපේක්ෂිත ණය අලාභය ඉදිරිපත් කරයි.

III **ණය පැහැර හැරීම් අවධානමේ සැලකිය යුතු පිරිහීම නිර්ණය කිරීම**
සේවක අර්ථසාධක අරමුදල විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් ප්‍රකාශයට පත් කරන ලද පොදුවේ පිළිගත් ආයෝජන හා ආයෝජන නොවන ශ්‍රේණි නිර්වචන මත පදනම්ව ණය ගෙවීම් පැහැර හැරීම පිළිබඳ අවධානම සැලකිය යුතු ලෙස තීරණය කරයි. සාමාන්‍යයෙන් "BBB" වලට පහළින් වූ ශ්‍රේණිගත කිරීම් ආයෝජන නොවන ශ්‍රේණියේ ඒවා ලෙස සලකයි. මේ අනුව, සේවක අර්ථසාධක අරමුදල විසින් මෙවැනි ආයෝජන, ණය පැහැර හැරීමේ අවධානමේ සැලකිය යුතු පිරිහීමක් සිදු වීමක් ලෙස සලකයි. මෙවැනි ආයෝජන සඳහා සේවක අර්ථසාධක අරමුදල විසින් එහි ආයු කාලයටම අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සිදු කරයි.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

ගෝලීය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සාමාන්‍යයෙන් පිළිගත් ශ්‍රේණිගත කිරීම් විශ්ලේෂණය කිරීම පහත පරිදි වේ.

| ICRA ණය ශ්‍රේණිගත කිරීම් | ෆිට්ච් ණය ශ්‍රේණිගත කිරීම් | මූඩීස් ශ්‍රේණිගත කිරීම් | බ්ලූම්බර්ග් අවුරුද්දක ණය ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | ණය පැහැර හැරීම පිළිබඳ සම්භාවිතාව |
| AAA | AAA | Aaa | IG-1 | 0.00% |
| AA+ | AA+ | Aa1 | IG-2 | 0.00% |
| AA | AA | Aa2 | IG-3 | 0.01% |
| AA- | AA- | Aa3 | IG-4 | 0.02% |
| A+ | A+ | A1 | IG-5 | 0.03% |
| A | A | A2 | IG-6 | 0.05% |
| A- | A- | A3 | IG-7 | 0.10% |
| BBB+ | BBB+ | Baa1 | IG-8 | 0.17% |
| BBB | BBB | Baa2 | IG-9 | 0.30% |
| BBB- | BBB- | Baa3 | IG-10 | 0.52% |
| BB+ | BB+ | Ba1 | HY-1 | 0.88% |
| BB | BB | Ba2 | HY-2 | 1.50% |
| BB- | BB- | Ba3 | HY-3 | 2.40% |
| B+ | B+ | B1 | HY-4 | 4.00% |
| B | B | B2 | HY-5 | 6.00% |
| B- | B- | B3 | HY-6 | 10.00% |
| | CCC | Caa1 | DS-1 | 15.00% |
| | CCC | Caa2 | DS-2 | 22.00% |
| | CCC | Caa3 | DS-3 | 30.00% |
| | CCC | Ca | DS-4 | 50.00% |
| | DDD | C | DS-5 | 100.00% |
| | D | / | DDD | පැහැර හැරීම් |

මාස 12 (ආයෝජන ශ්‍රේණි)

ජීවිතකාලය 1 (ආයෝජන නොවන ශ්‍රේණි)

**IV** පාඩු ලබා දී ඇති පැහැර හැරීම (LGD)

(LGD) අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීම සඳහා, 2018 දෙසැම්බර් 31 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද SLFRS 09 සම්මත කර ගැනීම පිළිබඳ උපදේශන පත්‍රයට අනුකූලව පහත දැක්වෙන LGD/අලාභ අනුපාත සලකා බලයි.

a. දේශීය මුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ප්‍රතිවිකුණුම් 0%
b. අනෙකුත් සියලුම දේශීය මුදල් මූල්‍ය උපකරණ 45%

**V** අපේක්ෂිත ආර්ථික අලාභ නිර්ණය කිරීම සඳහා සේ.අ.අ. පෙර නිමි ලක්ෂය ලෙස වසර මැද යොදා ගන්නා අතර, එහිදී පෙරනිමි සිද්ධීන් වර්ෂයේ ප්‍රථම භාගයේ දී හෝ අවසාන භාගයේ දී උත්පාදනය වේ යැයි සලකා බලයි.

**VI** ආර්ථික සාධක ගැලපුම ගණනය කරනු ලැබුවේ අතීතයේ සිට පුරෝකථනය කරන ලද සහ 2010 සිට 2023 දක්වා පුරෝකථනය කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දළ දේශිය නිෂ්පාදිතයේ වර්ධන අනුපාත සංඛ්‍යා ලේඛන වලින් ලබා ගැනීමෙනි.

**VII** <u>මූල්‍ය ආයෝජන</u>

**a.** පහත දැක්වෙන නිකුත් කරන්නන්/ප්‍රතිපාර්ශව සඳහා ණය ශ්‍රේණිගත කිරීමේ දත්ත සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නොමැත. එබැවින් බාහිර ණය ශ්‍රේණිගත කිරීම් පහත ප්‍රභවයන්ගෙන් ලබා ගන්නා ලදී.

**b.** වක්‍රය සවිකිරීමේ ව්‍යායාමය සඳහා බහු ඒජන්සි සඳහා අපි ෆිච්, මෝඩිස්, අයිසීආර්ඒ විසින් සලකා බැලූ ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක පරාමිතින් ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සලකා බැලූ බව සඳහන් කළෙමු. වක්‍රය සවිකිරීමේ ව්‍යායාමය සිදු කරන විට ඉහළට/පහළට ක්‍රමාංකනය කිරීම අවශ්‍ය නොවේ.

**c.** ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ආයෝජන සඳහා ශ්‍රී ලංකා ස්වෛරී ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව එකම බලසීමාවක් තුළ සිදු නොකරයි. ණය අවදානමේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් නොකරන අතර, එම නිසා සේ.අ.අ. මාස 12 සඳහා අපේක්ෂිත ණය අලාභ සැලකීමේ දී AAA හි හොඳම අවස්ථාව ලබාගනී.

හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)

**34.6.1** ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇති වර්ෂය සඳහා මූල්‍ය උපකරණවල ECL ගාස්තු පහත වගුවලින් දැක්වේ.

**2018.12.31**

| | | පියවර 01 | | පියවර 02 | | පියවර 03 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| රු. 000 | සටහන් | ඒකීය | මුළු | ඒකීය | මුළු | | |
| බැංකු මුදල් | | 35 | - | - | - | - | 35 |
| | | | | | | | - |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම | **18** | 3,792 | - | - | - | - | 3,792 |
| මුළු හානිකරණ අලාභය | | **3,827** | **-** | **-** | **-** | **-** | **3,827** |

| 2018.12.31 | | මුළු අගය (තනි තනිව අනාවරණය කිරීම නොසලකා හැර ඇත) | මුළු අගය (දරන ලද නමුත් තවම හඳුනා නොගත්) | |
|---|---|---|---|---|
| රු. 000 | විශේෂ | | | එකතුව |
| බැංකු ශේෂය මත ණය අලාභ වියදම් | - | 35 | - | 35 |
| | - | 35 | | 35 |
| **ණය උපකරණ මත ණය අලාභ වියදම් ක්‍රමක්ෂය පිරිවැය** | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | - | 3,359 | - | 3,359 |
| භාරකාර සහතිකපත් | - | 36 | - | 36 |
| ස්ථාවර තැන්පතු | - | 183 | - | 183 |
| වරණීය කොටස් | - | 214 | | |
| | - | 3,792 | - | 3,578 |
| මූල්‍ය ප්‍රකාශන අයිතම මත එකතුව | - | 3,827 | - | 3,827 |
| අක්‍රීය මූල්‍ය ප්‍රකාශන අයිතම | - | - | - | - |
| එකතුව | **-** | **3,827** | **-** | **3,827** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)**

**ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම**

LKAS අනුව බාහිර ණය ශ්‍රේණිගත කිරීම් මත ණය ගුණාත්මකභාවය සහ ණය අවධානමට ඇති උපරිම නිරාවරණය පහත වගුවෙන් දැක්වේ. හානිකරණ දීමනාවල වටිනාකම් දළ වශයෙන් ඉදිරිපත් කර ඇත. අරමුදලේ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විස්තර සටහන 34.6 හි දක්වා ඇති අතර, LKAS අනුව ECL දීමනා තනිපුද්ගලයෙකු මත හෝ සාමූහික වශයෙන් ගණනය කරන්නේද යන්න සටහන 34.6 හි දක්වා ඇත.

**31.12.2018**

| | පියවර 01 සාමූහික | | පියවර 02 සාමූහික | | පියවර 03 | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ශේෂය | ECL | ශේෂය | ECL | ශේෂය | ECL | ශේෂය | ECL |
| Rs. '000 | | | | | | | | |
| බාහිර ශ්‍රේණිගත කිරීම් | | | | | | | | |
| AAA | 15,629,090 | 7 | - | - | - | - | 15,629,090 | 7 |
| AA+ | 29,624,312 | 253 | - | - | - | - | 29,624,312 | 253 |
| AA | 6,451,226 | 106 | - | - | - | - | 6,451,226 | 106 |
| AA- | 11,037,343 | 360 | - | - | - | - | 11,037,343 | 360 |
| A+ | 7,483,792 | 467 | - | - | - | - | 7,483,792 | 467 |
| A | 4,661,712 | 546 | - | - | - | - | 4,661,712 | 546 |
| A- | 6,358,735 | 1,373 | - | - | - | - | 6,358,735 | 1,373 |
| BBB+ | - | - | - | - | - | - | - | - |
| BBB | - | - | - | - | - | - | - | - |
| BBB- | 573,051 | 714 | - | - | - | - | 573,051 | 714 |
| Total | 81,819,261 | 3,827 | - | - | - | - | 81,819,261 | 3,827 |

**01.01.2018**

| | පියවර 01 සාමූහික | | පියවර 02 සාමූහික | | පියවර 03 | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ශේෂය | ECL | ශේෂය | ECL | ශේෂය | ECL | ශේෂය | ECL |
| Rs. '000 | | | | | | | | |
| බාහිර ශ්‍රේණිගත කිරීම් | | | | | | | | |
| AAA | 12,699,201 | 6 | - | - | - | - | 12,699,201 | 6 |
| AA+ | 47,753,314 | 419 | - | - | - | - | 47,753,314 | 419 |
| AA | 4,176,494 | 70 | - | - | - | - | 4,176,494 | 70 |
| AA- | 11,240,595 | 376 | - | - | - | - | 11,240,595 | 376 |
| A+ | 6,792,891 | 433 | - | - | - | - | 6,792,891 | 433 |
| A | 4,950,439 | 593 | - | - | - | - | 4,950,439 | 593 |
| A- | 6,680,011 | 1,463 | - | - | - | - | 6,680,011 | 1,463 |
| BBB+ | 229,000 | 91 | - | - | - | - | 229,000 | 91 |
| BBB | 485,369 | 345 | - | - | - | - | 485,369 | 345 |
| BBB- | 488,852 | 617 | - | - | - | - | 488,852 | 617 |
| Total | 95,496,167 | 4,412 | - | - | - | - | 95,496,167 | 4,412 |

# සේවක අර්ථසාධක අරමුදල
## මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)**

34.6.2 **ණය ගුණාත්මකභාවය විශ්ලේෂණය**

SLFRS **09** යටතේ 2018.12.31 දිනට දළ ශේෂයන් පහත වගුවෙන් දැක්වෙන අතර, බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය විශ්ලේෂණය කිරීම 34.6 සටහනෙහි දක්වා ඇත.

| **2018.12.31 දිනට** | අතීතයේ ගෙවිය යුතු හෝ හානිකරණය නොවූ | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රු. **000** | AAA | AA+ | AA | AA- | A+ | A | A- | BBB+ | BBB | BBB- | **එකතුව** |
| **ආයෝජන ශේෂයන්** | | | | | | | | | | | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | 2,526,568 | 6,283,739 | 5,869,264 | 9,904,749 | 7,480,074 | 4,661,712 | 5,353,462 | - | - | 573,254 | 42,652,822 |
| භාරකාර සහතිකපත් | - | - | - | 1,132,594 | - | - | - | - | - | - | 1,132,594 |
| ස්ථාවර තැන්පතු | 13,102,522 | 20,507,196 | - | - | - | - | - | - | - | - | 33,609,718 |
| වරණීය කොටස් | - | - | - | - | - | - | 1,005,273 | | | | 1,005,273 |
| බැංකු ශේෂය | - | 2,833,377 | 581,962 | - | 3,718 | - | - | - | - | - | 3,419,057 |
| | **15,629,090** | **29,624,312** | **6,451,226** | **11,037,343** | **7,483,792** | **4,661,712** | **6,358,735** | **-** | **-** | **573,254** | **81,819,464** |
| **ECL වෙන්කිරීම** | | | | | | | | | | | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | 1 | 51 | 96 | 324 | 467 | 546 | 1,159 | - | - | 714 | 3,359 |
| භාරකාර සහතිකපත් | - | - | - | 36 | - | - | - | - | - | - | 36 |
| ස්ථාවර තැන්පතු | 6 | 177 | - | - | - | - | - | - | - | - | 183 |
| වරණීය කොටස් | - | - | - | - | - | - | 214 | - | - | - | 214 |
| බැංකු ශේෂය | - | 25 | 10 | - | 0.24 | - | - | - | - | - | 35 |
| එකතුව | **7** | **253** | **106** | **360** | **467** | **546** | **1,373** | **-** | **-** | **714** | **3,827** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**හානිකරණ අලාභ (සම්බන්ධයි . . . .)**

34.6.2 **ණය ගුණාත්මකභාවය විශ්ලේෂණය**

SLFRS **09** යටතේ 2018.12.31 දිනට දළ ශේෂයන් පහත වගුවෙන් දැක්වෙන අතර, බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය විශ්ලේෂණය කිරීම 34.6 සටහනෙහි දක්වා ඇත.

| 2018.12.31 දිනට | අතීතයේ ගෙවිය යුතු හෝ හානිකරණය නොවූ | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රු.000 | AAA | AA+ | AA | AA- | A+ | A | A- | BBB+ | BBB | BBB- | **එකතුව** |
| **ආයෝජන ශේෂයන්** | | | | | | | | | | | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | 1,501,068 | 6,875,384 | 3,763,602 | 8,524,142 | 6,735,827 | 4,950,439 | 5,681,620 | 229,000 | 485,369 | 459,230 | 39,205,682 |
| භාරකාර සහතිකපත් | - | - | - | 2,716,453 | - | - | - | - | - | 29,622 | 2,746,076 |
| ස්ථාවර තැන්පතු | 11,198,133 | 38,073,962 | - | - | - | - | - | - | - | - | 49,272,095 |
| වරණීය කොටස් | - | - | - | - | - | - | 998,392 | | | | 998,392 |
| බැංකු ශේෂය | - | 2,803,968 | 412,892 | - | 57,064 | - | - | - | - | - | 3,273,924 |
| | **12,699,201** | **47,753,314** | **4,176,494** | **11,240,595** | **6,792,891** | **4,950,439** | **6,680,011** | **229,000** | **485,369** | **488,852** | **95,496,167** |
| | | | | | - | | | | | | |
| **ECL වෙන්කිරීම්** | | | | | | | | | | | |
| ණය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට අගය කිරීම | | | | | | | | | | | |
| සාංගමික ණය සුරැකුම්පත් | 1 | 57 | 63 | 285 | 430 | 593 | 1,246 | 91 | 345 | 581 | 3,690 |
| භාරකාර සහතිකපත් | - | - | - | 90 | - | - | - | - | - | 37 | 127 |
| ස්ථාවර තැන්පතු | 5 | 337 | - | - | - | - | - | - | - | - | 342 |
| වරණීය කොටස් | - | - | - | - | - | - | 217 | - | - | - | 217 |
| බැංකු ශේෂය | - | 25 | 7 | - | 4 | - | - | - | - | - | 36 |
| එකතුව | **6** | **419** | **70** | **376** | **433** | **593** | **1,463** | **91** | **345** | **617** | **4,412** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

35. ලැයිස්තුගත නොවූ හිමිකම් උපකරණ අගය කිරීම

ඇස්තමේන්තුගත සාධාරණ අගයට ලැයිස්තුගත නොවූ හිමිකම් ආයෝජන පහත පරිදි වේ.

| ආයෝජනය | පදනම | කොටස් සංඛ්‍යාව | ගැණුම් මිල | 2018 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|
| | | | රු. 000 | කොටසක සාධාරණ අගය රු. | සාධාරණ අගය රු. | කොටසක සාධාරණ අගය Rs. | සාධාරණ අගය රු. 000 |
| කැන්විල් හෝල්ඩින් පෞද්. සමාගම | දළ වත්කම් පදනම | 500,000,000 | 5,000,000 | 10.58 | 5,287,959 | 10.58 | 5,287,978 |
| කාගිල්ස් බැංකුව (සංස්ථාපිත) | දළ වත්කම් පදනම | 44,000,000 | 495,000 | 12.68 | 557,725 | 12.06 | 530,763 |
| වැලිගම හොටෙල් ඉඩම් පෞද්. සමාගම | දළ වත්කම් පදනම | 45,000,000 | 405,000 | 2.09 | 93,839 | 4.14 | 186,096 |
| වෙස්ට් කෝස්ට් පවර් පෞද්. සමාගම | දළ වත්කම් පදනම | 29,750,000 | 2,975,000 | 496.61 | 14,774,143 | 437.00 | 13,000,802 |
| ෆිච් රේටින් ලංකා සමාගම | ලාභාංශ අගය ආකෘතිය | 62,500.00 | 625.00 | 66.04 | 4,127.40 | 61.32 | 3,832.64 |
| ජෙට්වින් සිම්පනි සමාගම | වෙළෙඳපොළ අගය | 35,454,545 | 390,000 | | | 15.00 | 531,818 |
| මුළු එකතුව | | | **9,265,625** | | **20,717,793** | | **19,541,291** |

පවතින තොරතුරුවල සීමාකාරී බව අනුව, ෆිච් රේටින් ලංකා සමාගම (FR) හැර අනෙකුත් ලැයිස්තුගත නොවූ සමාගම් ශුද්ධ වත්කම් ක්‍රමය, සාධාරණ අගය අගය කිරීමට භාවිතා කරනු ලබයි.

ෆිච් රේටින් ලංකා (FR) අඛණ්ඩව ලාභාංශ ගෙවා ඇති අතර, එම නිසා FR හි සාධාරණ වටිනාකම තක්සේරු කිරීම සඳහා ලාභාංශ වර්ධන ආකෘතිය භාවිතා කරන ලදී. ඇස්තමේන්තු කිරීම සඳහා එක් එක් සමාගමේ නවතම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් තොරතුරු ලබා ගෙන ඇත.

ලැයිස්තුගත නොවූ ස්කන්ධ සාධන පත්‍ර ඉහත ඇස්තමේන්තුගත සාධාරණ අගයන්ට වාර්තාගත කර ඇත්නම්, අනෙකුත් සංක්ෂිප්ත ආදායම් හා ආයෝජන නැවත තක්සේරු සංචිතවල බලපෑම පහත පරිදි වේ.

**මූල්‍ය ප්‍රකාශන බලපෑම් - සමස්තය**

| | 2017 | 2,018 |
|---|---|---|
| පිරිවැය | 9,265,625 | 8,875,625 |
| සාධාරණ අගය තක්සේරුව | 19,541,291 | 20,717,793 |
| ශුද්ධ වත්කම්වලට බලපෑම | 10,275,666 | 11,842,168 |
| සාධාරණ වටිනාකම වෙනස් කිරීම කෙරෙහි FVOCI හි බලපෑම | | 1,176,502 |

ඉකෝ ශ්‍රී (සීමිත), ලාෆ් ගෑස් ලෙෂර්, ලාෆ් ගෑස් පවර් (සීමිත) ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියේ දී නොසලකා හැර ඇත.

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 36 ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය

2018 දෙසැම්බර් 31 දිනට

(රු.මිලියන)

| ආයෝජන කාණ්ඩය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | 2032 | 2033 | 2034 | 2035 | 2041 | 2043 | 2044 | 2045 | හඳුනාගෙන නොමැත | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ණය සුරැකුම්පත් ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. | | | | | | | | | | | | | | | | | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 88,493 | 107,114 | 74,313 | 100,126 | 167,293 | 74,804 | 199,804 | 196,572 | 52,483 | 248,390 | 135,241 | 55,025 | 68,572 | 213,670 | 93,585 | 58,235 | 29,328 | 22,770 | 93,181 | 5,498 | - | 2,084,498 |
| සාංගමික ණයකර | 5,314 | 7,451 | 10,645 | 350 | 9,543 | - | 6,603 | 1,721 | - | 1,026 | - | - | - | - | - | - | - | - | - | - | - | 42,653 |
| භාණ්ඩාගාර බිල්පත් | 34,733 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 34,733 |
| භාරකාර සහතිකපත් | 1,133 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,133 |
| ස්ථාවර තැන්පතු | 33,610 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 33,610 |
| ප්‍රති මිලදී ගැනුම් | 26,351 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 26,351 |
| වරණීය කොටස් | - | 1,005 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,005 |
| සාධාරණ අගය තුළින් ලාභ හා අලාභ මනිනු ලබන හිමිකම් උපකරණ | | | | | | | | | | | | | | | | | | | | | | |
| (ලැයිස්තුගත හිමිකම්) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 64,938 | 64,938 |
| සාධාරණ අගය තුළින් වෙනස් විස්තීර්ණ ආදායම් මනිනු ලබන හිමිකම් උපකරණ | | | | | | | | | | | | | | | | | | | | | | |
| (ලැයිස්තුගත නොවූ හිමිකම්) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 9,915 | 9,915 |
| මුළු එකතුව | 189,634 | 115,570 | 84,958 | 100,476 | 176,836 | 74,804 | 206,407 | 198,294 | 52,483 | 249,416 | 135,241 | 55,025 | 68,572 | 213,670 | 93,585 | 58,235 | 29,328 | 22,770 | 93,181 | 5,498 | 74,853 | 2,298,835 |
| ණය සුරැකුම්පත් මත හානිකරණ වෙන්කිරීම් ක්‍රමක්ෂය පිරිවැය | | | | | | | | | | | | | | | | | | | | | | (4) |
| ආයෝජන කළඹෙහි ශුද්ධ හානිකරණ වටිනාකම | | | | | | | | | | | | | | | | | | | | | | 2,298,831 |




‘ඈ’ කොටස

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එල්ඩ්ඩබ්/බී/ඊපීඑෆ්/එෆ්/2018 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

කම්කරු කොමසාරිස් ජනරාල්,

කම්කරු දෙපාර්තමේන්තුව

අධිපති,

ශ්‍රී ලංකා මහ බැංකුව

**සේවක අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සේවක අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අරමුදලේ සාමාජික අරමුදල තුල කම්කරු කොමසාරිස් නමින් ගිණුමක දීර්ඝ කාලයක සිට පවත්වාගෙන එන සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන තිබූ 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,355 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පත් ගිණුමක රඳවා තිබූ රු.මිලියන 301 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි. තවද 2018 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු. මිලියන 853 ක් සහ අඩුවැඩි දායක මුදල් වශයෙන් රු. මිලියන 1,796 ක් සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 07 කට අදාළව වසර 12 කට අධික කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි අගරු වූ නිකුත් කළ චෙක්පත්, අගරු වූ තැන්පත් කළ චෙක්පත්, තැන්පත් කළ චෙක්පත්, මුදල් පොතේ සටහන් නොවූ මුදල් තැන්පතු, සෘජු හර/බැර හා හඳුනානොගත් අනෙකුත් ශේෂ ලෙස එකතුව රු.1,034,984,578 ක් සහ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල්,මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස එකතුව රු.1,563,424,246 ක් දක්වා තිබූ නමුත් මෙම අයිතම හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේ අවසන් කාර්තු 3 හි බදු වියදම සහ බදු වගකීම ගණනය කිරීමේදී භාණ්ඩාගාර බැඳුම්කර මත ක්‍රමක්ෂය ලාභ රු.4,807,290,569 ක් වැඩියෙන් සලකා බලා තිබීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම හා බදු වගකීම රු.673,020,680 ක් වැඩියෙන් පෙන්වන බව නිරීක්ෂණය විය.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් බාණ්ඩ 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.900,608,654 ක් වුවද, ක්ෂය වෙන්කිරීම සඳහා වූ උපලේඛනයේ එම ශේෂයන්ගේ එකතුව රු.556,974,678 ක් වූයෙන් රු. 343,633,976 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ රු.76,656,104 ක් වටිනා ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද, ඒවායේ ඇස්තමේන්තු අගය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදලේ පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාෘකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය සහ 2016 අප්‍රේල් 29 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක.PE/COP/POLI/Circulars හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක : 03/2016 දරන ලිපිය | අරමුදලට අනුයුක්ත කර සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත වූ උපයන විට බදු ගෙවීම් අදාල නිලධාරීන්ගෙන් අය නොකර සමාලෝචිත වර්ෂයේ දී රු. 20,947,681 ක් අරමුදල විසින් ගෙවා තිබුණි. මේ පිළිබඳව 2016 පෙබරවාරි 26 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී උපයනවිට ගෙවීම් බදු අරමුදලින් ගෙවීම පිළිබඳව 2016 අයවැය ලේඛනයේ උපදෙස් හා රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට අනුකූල වන අන්දමින් ක්‍රමවේදයන් නිවැරදිව හා යාවත්කාලීන කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කොට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස දැන්වූවද එවැනි වැඩ පිළිවෙලක් 2018 වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2018 ජුනි 30 දිනැති මුදල් මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද අරමුදලේ ආයෝජන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල ආයෝජනයන්ගෙන් කිසියම් ප්‍රමාණයක් රැස්කිරීම හා විකිණීම (held to collect and sell) යන වර්ගීකරණය යටතේ පවත්වාගත යුතුය. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,119,231 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල ආයෝජනය, පොලී ආදායම් රැස්කිරීම (held to collect) වෙනුවෙන් පරිණතවන තෙක් තබාගන්නා ආයෝජන ලෙස වාර්තා කර තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) පළමු අදියර 2007/2008 වර්ෂයන්හිදී ද දෙවන අදියර 2010/2011 වර්ෂයන්හි දී ද තෙවන අදියර 2016/2017 වර්ෂයන්හිදී ද ක්‍රියාත්මක කර තිබුණු සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තුව මත මූලා ප්‍රතිපාදන සලසාගෙන රු.247,153,011 ක සමස්ථ වියදමක් දරා තිබුණි. එසේ වුවද, ඇඟිලි සලකුණු ලබාගත් සාමාජිකයන් ගණන ඇස්තමේන්තුගත සාමාජිකයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස පළමු, දෙවන හා තෙවන අදියරයන් යටතේ පිලිවෙලින් සියයට 38 ක්, සියයට 25 ක් හා සියයට 14 ක් වූ බැවින් ලබාගෙන තිබුණු ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි.

(ආ) උක්ත ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී රු.3,261,600 ක් වැයකර මිලදීගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 24 ක් 2019 මැයි 23 දින වනවිටත් අදාල කාර්යාලවලට බෙදා නොහැර ගබඩාවේ නිශ්ක්‍රියව තබා තිබුණි.

(ඇ) සාමාජිකයන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමේ හා ගිණුම් ශේෂ පරීක්ෂා කිරීම සඳහා යන්ත්‍ර (Kiosk) සවි කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2008 දෙසැම්බර් මස රු.12,609,750 ක් වැයකර කාඩ්පත් 15,000 ක් හා රු.2,750,570 ක් වැයකර Kiosk යන්ත්‍ර 05 ක් මිලදීගෙන තිබුණි. කාඩ්පත්වල සාමාජික නම, ජාතික හැඳුනුම්පත් අංකය ආදී තොරතුරු මුද්‍රණය කිරීමෙන්ද අනතුරුව සාමාජිකයන්ට බෙදාහැරීමෙන් තොරව 2018 දෙසැම්බර් 31 දින වන විට වසර 10 ක් පමණ තිස්සේ ගබඩා කර තිබුණි. තවද එලෙස මිලදීගත් Kiosk යන්ත්‍රද මිලදීගත් දින සිටම ක්‍රියාත්මක වූ බවට තොරතුරු අනාවරණය නොවූ බැවින් ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ දරන ලද මුළු වියදම අරමුදලට අලාභයක් බව නිරීක්ෂණය විය.

(ඈ) Kiosk යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ 2015 වර්ෂයේදී රු.14,917,500 ක් වැයකර මිලදීගෙන තිබූ යන්ත්‍ර 30 න් 2016 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර 9 ක් ද 2017 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර 19 ක් ද 2018 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර 10 ක් ද අක්‍රියව පැවතුණි. ඒ අනුව අධික වියදමක් දරා මිලදීගෙන තිබුණු යන්ත්‍ර වැඩි ප්‍රමාණයක් අක්‍රියව පැවතීමෙන් හා නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය අවම මට්ටමක පැවතීමෙන් මෙම ව්‍යාපෘතිය යටතේ සාමාජිකයන්ට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වන බව නිරීක්ෂණය විය.

අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) සියළුම රජයේ සුරැකුම්පත් පරිණත වන තෙක් තබා ගන්නා ආයෝජන ලෙස වර්ගකර පවත්වා ගැනීම හේතුවෙන් ඒවා ද්විතියික වෙළඳපොල තුළ විකිණීමෙන් ලබාගත හැකි මූල්‍ය වාසි උපයාගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. ඒ අනුව 2015 හා 2016 වර්ෂයන්හිදී භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ පිළිවෙලින් රු.මිලියන 1,171 ක් හා රු.මිලියන 612 ක් වුවද 2017 හා 2018 වර්ෂයන්හිදී භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ උපයාගෙන නොතිබුණි.

(ආ) අරමුදල විසින් 2013 වර්ෂයේදී කැන්විල් හෝල්ඩින්ග්ස් නැමැති හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 5,000 ක් ආයෝජනය කර තිබූ අතර 2013 ජුනි 04 දින අත්සන් කරන ලද කොටස් හිමියන්ගේ ගිවිසුම අනුව එම සමාගමේ කොටස් 2015 වර්ෂයේදී කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම සමාගමේ කොටස්, කොටස් වෙළඳපොලේ

ලැයිස්තුගත කර නොතිබූ අතර සමාගමේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා දැමීමට රජය තීරණය කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018 වර්ෂය තුලදී භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 46 ක් පවත්වා තිබූ අතර ඉන් අරමුදල සහභාගී වී තිබුණේ වෙන්දේසි 9 ක් සඳහා පමණි. ක්‍රියාකාරී ලෙස එම ගනුදෙනුවලට සහභාගී වීමට ප්‍රමාණවත් මුදල් අරමුදල සතුව තිබියදී අරමුදල විසින් 2018 වර්ෂය තුලදී භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය සම්බන්ධයෙන් අඩු ප්‍රවණතාවයක් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව 2018 වර්ෂය තුලදී අවස්ථා 25 කදී සියයට 8.80 සිට 11.24 අතර අනුපාතයකට දින 364 න් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමේ හැකියාව තිබියදී රු.මිලියන 192,117 ක් සියයට 7.25 ත් 9.00 ක් අතර අනුපාතයන් යටතේ දෛනිකව කල්පිරෙන ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකමේ ආයෝජනය කර තිබුණි.

(ඈ) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ සමාගම් 9 ක සිදුකර තිබූ රු.මිලියන 3,607 ක් වූ ආයෝජනයෙන් එම ආයෝජන සිදු කරන ලද දින සිටම අරමුදලට ප්‍රතිලාභ ලැබී නොතිබුණි. ඒ අතරින් ලැයිස්තුගත සමාගම් 3 ක හා ලැයිස්තුගත නොවූ එක් සමාගමක ආයෝජනයන් සිදුකරන විටත් ඒවා අලාභ ලබමින් පැවති බවද නිරීක්ෂණය විය.

(ඉ) ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සාමාජිකයන් විසින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල 18 කට 2016 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කර තිබූ ප්‍රතිලාභ අයදුම්පත් අතරින් රු.17,923,106 ක් වූ ප්‍රතිලාභ අයදුම්පත් 112 ක් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීමෙන් අනතුරුව විවිධ හේතු මත ප්‍රතික්ෂේප කර තිබුණි. එම අයදුම්පත් අතරින් අයදුම්පත් 90 ක් (සියයට 80 ක්) සම්බන්ධයෙන් ඒවා ඉදිරිපත් කරන ලද දින සිට 2019 මාර්තු 01 දක්වා ගත වී තිබූ කාලය මාස 06 සිට අවු.03 ට වැඩි වී තිබුණද නිරවුල්කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති